# වසර මැද

# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

# 2024

මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

ඔක්තෝබර් 31, 2024

# වසර මැද
# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024

**2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලදි.**

**අනුර කුමාර දිසානායක**
**මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය**

**ඔක්තෝබර් 31, 2024**

# වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024

## 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ
## 50 වැනි වගන්තිය යටතේ
## ගරු මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50 වැනි වගන්තියට අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් වන වාර්තාවක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් අදාල වසරේ ඔක්තෝබර් මස අවසාන දින හෝ අදාල වර්ෂයේ විසර්ජන පනත සම්මත කර මාස දහයක් ගතවීම හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ දී මහජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කිරීමටත්, ඉන් ඉක්බිතිව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය බව දැක්වේ.

ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වර්ෂය මැද මූල්‍ය කාර්යසාධනය ඇගයීමේ පදනමක් සැලසීම මෙම වාර්තාවේ අරමුණ වේ.

2024 වසරේ පළමු මාස හය තුළ රජයේ ආදායම, වියදම, මුදල් ප්‍රවාහ කටයුතු හා ණය ගැනීම් පිළිබඳ කාර්යසාධනය මෙම වාර්තාවේ ඇතුළත් වේ. 2024 පළමු මාස හය සඳහා වන අයවැය තත්ත්වය පිළිබඳ තාවකාලික දත්ත ද ලබාගත හැකි තොරතුරු අනුව සාර්ව ආර්ථික කටයුතු වල කාර්යසාධනය, මිල ගණන් වෙනස්වීම්, විදේශ මූල්‍යනය, රාජ්‍ය ණය, නිල සංචිත සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| **01 වන පරිච්ඡේදය** | **ආර්ථික සන්දර්භය** | |
| | 1.1 සමාලෝචනය | 1 |
| | 1.2 උද්ධමනය | 1 |
| | 1.3 මුදල් හා ණය | 3 |
| | 1.4 කොටස් වෙළෙඳපොළ | 3 |
| | 1.5 විදේශ අංශයේ ප්‍රවණතා | 4 |
| | 1.6 ගෝලීය ආර්ථික ප්‍රවණතා | 6 |
| **02 වන පරිච්ඡේදය** | **රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා** | |
| | 2.1 සමාලෝචනය | 10 |
| | 2.2 රාජ්‍ය ආදායම | 12 |
| | 2.3 රාජ්‍ය වියදම | 23 |
| | 2.4 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය | 30 |
| | 2.5 රාජ්‍ය ණය කළමනාකරණය | 30 |
| **3 වන පරිච්ඡේදය** | **රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය** | |
| | 3.1 සමාලෝචනය | 34 |
| | 3.2 රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය | 34 |
| **4 වන පරිච්ඡේදය** | **විදේශ මූල්‍යයනය** | |
| | 4.1 සමාලෝචනය | 42 |
| | 4.2 විදේශ මූල්‍යන එකඟතා | 42 |
| | 4.3 විදේශ මූල්‍යන ප්‍රතිලබ්ධි හා උපයෝජන | 42 |
| | 4.4 විදේශ ණය ප්‍රමාණය සහ විදේශ ණය සේවාකරණය | 44 |

# මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම | |
|---|---|---|---|---|
| | | | 2023 | 2024 (තාවකාලික) |
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු භාගය | % | -7.3 | 5.0 |
| කෘෂිකර්මාන්ත | පළමු භාගය | % | 2.9 | 1.4 |
| කර්මාන්ත | පළමු භාගය | % | -18.9 | 11.4 |
| සේවා | පළමු භාගය | % | -2.8 | 2.6 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) (කො.පා.මි.ද. 2021=100) | සැප්. අවසානයට | % | 1.3 | -0.5 |
| සේවා වියුක්ති අනුපාතය | වාර්ෂික | % | 4.7 | ලැ.නො. |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | වාර්ෂික | % | 48.6 | ලැ.නො. |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන.-ජුනි | රු.මිලි. | -1,242,566 | -598,698 |
| මුළු ආදායම | ජන.-ජුනි | රු.මිලි. | 1,314,886 | 1,860,632 |
| බදු ආදායම | ජන.-ජුනි | රු.මිලි. | 1,198,852 | 1,709,305 |
| බදු නොවන ආදායම | ජන.-ජුනි | රු.මිලි. | 116,034 | 151,327 |
| මුළු වියදම | ජන.-ජුනි | රු.මිලි. | 2,559,619 | 2,463,305 |
| වර්තන වියදම | ජන.-ජුනි | රු.මිලි. | 2,325,541 | 2,218,442 |
| රාජ්‍ය ආයෝජන | ජන.-ජුනි | රු.මිලි. | 258,812 | 258,306 |
| රාජ්‍ය ණය | ජුනි.අවසානයට | රු.බිලි. | 26,916 | 28,563 |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 8,010 | 8,499 |
| එයින් කෘෂි අපනයන | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 1,703 | 1,804 |
| කාර්මික අපනයන | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 6,274 | 6,659 |
| රෙදිපිළි හා ඇඟළුම් | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 3,326 | 3,365 |
| වෙනත් | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,948 | 3,294 |
| ආනයන | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 10,974 | 12,073 |
| පාරිභෝගික භාණ්ඩ | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,028 | 2,176 |
| අන්තර් භාණ්ඩ | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 7,186 | 7,750 |
| එයින් ඛනිජ නිෂ්පාදන | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 3,080 | 2,897 |
| ආයෝජන භාණ්ඩ | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 1,748 | 2,140 |
| වෙළඳ ශේෂය | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | -2,964 | -3,573 |
| සංචාරක පැමිණීම් | ජන.-අගෝ. | සංඛ්‍යාව | 904,318 | 1,362,668 |
| සංචාරක ඉපැයීම් | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 1,305 | 2,167 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 3,863 | 4,288 |
| සමස්ථ ගෙවුම් ශේෂය | ජන.-අගෝ. | ඇ.ඩො.මිලි. | 2,034 | 2,184 |
| දළ නිල සංචිත | අගෝ. අවසානය | ඇ.ඩො.මිලි. | 3,600 | 5,959 |
| විනිමය අනුපාතය (මාසය අග) | සැප්. අවසානය | ඇ.ඩොලරයට රුපියල් | 324.4 | 299.3 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍යය) | ජන.-සැප්. | ඇ.ඩොලරයට රුපියල් | 322.8 | 301.1 |
| **මූල්‍ය අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය | අගෝ. අවසානය | % | 11.00 | 8.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතය | අගෝ. අවසානය | % | 12.00 | 9.25 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය | අගෝ. අවසානය | % | 2.00 | 2.00 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය | ජුලි අවසානය | % | 19.30 | 11.52 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය | ජුලි අවසානය | % | 16.90 | 12.25 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 91) | අගෝ. අවසානය | % | 18.48 | 9.49 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 364) | අගෝ. අවසානය | % | 13.58 | 10.01 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_2b$) | අගෝ. 2024/ අගෝ. 2023 | % | 5.9 | 9.3 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | අගෝ. 2024/ අගෝ. 2023 | % | -6.9 | 8.7 |

## ශ්‍රී ලංකාව : තෝරාගත් දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම |
|---|---|---|---|
| **විදුලි බලය** | | | |
| විදුලි බලය සඳහා ඇති ප්‍රවේශය | 2016 | % | 99.3 |
| **ජලය** | | | |
| පිරිසිදු පානීය ජල සැපයුම් සඳහා ප්‍රවේශය | 2023 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 97.3 |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය | 2023 | ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 61.6 |
| **මාර්ග** | | | |
| මාර්ග ඝනත්වය | 2023 | වර්ග කි.මී. | 0.19 |
| මාර්ගවල මුළු දිග | 2023 | කි.මී | 1 44,967 |
| **සන්නිවේදනය** | | | |
| ජංගම දුරකථන ඇතුළුව දුරකථන ඝනත්වය | 2023 | පුද්ගලයින් 100 කට | 137.0 |
| අන්තර්ජාලය සඳහා ප්‍රවේශය | 2023 | පුද්ගලයින් 100 කට | 103.8 |
| **අධ්‍යාපනය** | | | |
| **පොදු අධ්‍යාපනය** | | | |
| ප්‍රාථමික පාසල් සඳහා ඇතුළත්වීමේ අනුපාතය | 2023 | % | 85.1 |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය (රජයේ පාසැල්) | 2023 | සංඛ්‍යාව | 16.8 |
| සාක්ෂරතා අනුපාතය (සාමාන්‍යය) | 2021 | % | 93.3 |
| පරිගනක සාක්ෂරතා අනුපාතය (පළමු මාස 6) | 2023 | % | 39.5 |
| **විශ්ව විද්‍යාල අධ්‍යාපනය** | | | |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය | 2023 | සංඛ්‍යාව | 22.5 |
| වයස් විශේෂිත ලියාපදිංචි අනුපාතය (වයස අවුරුදු 19-23) (අ) | 2023 | % | 9.9 |
| **සෞඛ්‍ය** | | | |
| රෝහල් (බටහිර වෛද්‍ය) | 2023 | සංඛ්‍යාව | 619 |
| ඇඳන් | 2023 | සංඛ්‍යාව | 89,786 |
| රෝහල් ඇඳන් | 2023 | පුද්ගලයින් 1,000 කට | 4.1 |
| වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින් | 2023 | සංඛ්‍යාව | 985 |
| **ජනගහනය** | | | |
| ජනගහන ඝනත්වය | 2023 | වර්ග කි.මීටරයට පුද්ගලයින් | 351 |
| ජනගහන වර්ධනය | 2023 | % | -0.6 |
| උපතේදී ආයු අපේක්ෂාව | 2017 | අවුරුදු | 75.5 |
| ළදරු මරණ අනුපාතිකය | 2019 | සජීවී උපත් 1,000 කට | 7.4 |
| මාතෘ මරණ අනුපාතිකය | 2022 | සජීවී උපත් 1,000 කට | 22.6 |
| දළ උපත් අනුපාතිකය | 2023 | පුද්ගලයින් 1,000 කට | 11.2 |
| දළ මරණ අනුපාතිකය | 2023 | පුද්ගලයින් 1,000 කට | 8.2 |
| යැපුම් අනුපාතිකය | 2023 | % | 49.4 |
| **දරිද්‍රතාව** | | | |
| දරිද්‍රතා දර්ශකය | 2019 | % | 14.3 |
| ගෘහ ඒකක ආදායමෙහි ගිනි සංගුණකය | 2019 | සංගුණකය | 0.46 |
| දරිද්‍රතා පරතර දර්ශකය | 2019 | % | 2.8 |
| දිනකට ලබා ගන්නා සාමාන්‍ය කැලරි ප්‍රමාණය | 2019 | කිලෝකැලරි | 2,120 |
| **ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්** | | | ස්ථානය |
| මානව සංවර්ධන දර්ශකය | 2022 | රටවල් 193 ක් අතරින් ස්ථානය | 78 |
| ව්‍යාපාර පවත්වාගෙන යාමේ දර්ශකය | 2020 | රටවල් 190 ක් අතරින් ස්ථානය | 99 |
| ගෝලීය තරඟකාරිත්ව දර්ශකය | 2019 | රටවල් 141 ක් අතරින් ස්ථානය | 84 |
| ආර්ථික නිදහස් දර්ශකය | 2023 | රටවල් 184 ක් අතරින් ස්ථානය | 149 |
| ගෝලීය සාම දර්ශකය | 2024 | රටවල් 163 ක් අතරින් ස්ථානය | 100 |
| ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය | 2022 | රටවල් 193 ක් අතරින් ස්ථානය | 95 |

*(අ) අභ්‍යන්තර ලියාපදිංචි වූ සිසුන් පමණක් ඇතුළත් වේ.*

# 1 වන පරිච්ඡේදය

# ආර්ථික සන්දර්භය

## 1.1 සමාලෝචනය

ප්‍රධාන වශයෙන් සැපයුම් තත්ත්වයන් වැඩි දියුණු වීම, විදේශ අංශයේ ඉල්ලුම වැඩිවීම හා සංචාරක අංශයේ පුනර්ජීවනය සමඟ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් 2023 වසරේ තුන්වන කාර්තුවේ සිට ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ධනාත්මක ලකුණු පිළිබිඹු වන්නට විය. ආර්ථිකය, 2023 වසරේ පළමු භාගයේ දී වාර්තා කරන ලද සියයට 7.3 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 5.0 ක් දක්වා වර්ධනය විය.

කෘෂිකාර්මික, කාර්මික හා සේවා ඇතුළු ආර්ථිකයේ සියළුම අංශ 2024 වසරේ පළමු භාගයේ දී වර්ධනය විය. ප්‍රධාන වශයෙන් ධාන්‍ය වගාව, මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීවී වගාව හා සත්ත්ව නිෂ්පාදන අංශයන්ගේ වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික අංශය 2024 වසරේ පළමු භාගයේ දී සියයට 1.4 කින් ආන්තික ලෙස වර්ධනය විය. ඉදිකිරීම්, පතල් හා කැණීම් කර්මාන්තය හා නිෂ්පාදන කර්මාන්තයන් ද ඇතුළුව සියළුම උප අංශයන්ගෙන් වාර්තා වූ වර්ධනය හේතුවෙන් 2024 වසරේ පළමු භාගයේ දී කර්මාන්ත අංශය සියයට 11.4 කින් වර්ධනය විය. නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් හා රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් යන ක්‍රියාකාරකම්වල වර්ධනය හේතුවෙන් 2024 වසරේ පළමු භාගයේ දී සේවා අංශය ද සියයට 2.6 කින් වර්ධනය විය.

ආහාර හා ආහාර නොවන යන කාණ්ඩයන් දෙවර්ගයේම අවධමනය හේතුවෙන් 2015 වසරේ සැප්තැම්බර් මාසයට පසු ප්‍රථම වතාවට 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී මතුපිට උද්ධමනය ඍණාත්මක කලාපයකට අවතීර්ණ විය. විදුලි ගාස්තු, ඉන්ධන හා එල් පී ගෑස් මිල ගණන් අඩු කිරීම සඳහා මෑත කාලීනව සිදුකරන ලද සංශෝධනයන් සහ සැපයුම් තත්ත්වයන් වැඩි දියුණු වීම හේතුවෙන් ආහාර මිල ගණන් පහත වැටීම ප්‍රධාන වශයෙන්ම මෙම අවධමනයට හේතු විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 0.5 ක අවධමනයක් වාර්තා කරන ලදී. මේ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 0.2 ක අවධමනයක් වාර්තා කරන ලදී.

2024 වසරේ සැප්තැම්බර් මාසය අවසාන වන විට නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙලින් සියයට 8.25 ක සහ සියයට 9.25 ක පවත්වා ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කර ඇති අතර, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00 ක පවත්වා ගෙන ඇත.

කොටස් වෙළෙඳපොළ වැඩි දියුණු වූ කාර්යසාධනයක් පිළිබිඹු කරමින් 2024 වසරේ සැප්තැම්බර් මාසය අවසාන වන විට සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) ඒකක 11,855 ක් දක්වා සියයට 4.6 කින් ද, ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය (2004=1,000) ඒකක 3,453 ක් දක්වා සියයට 8.0 කින් ද, වර්ධනය විය.

2024 වසරේ පළමු මාස අට තුළ දී විදේශ අංශය සැළකිය යුතු මට්ටමේ කාර්යසාධනයක් පිළිබිඹු කරන ලදී. 2023 වසරේ පළමු මාස අට තුළ දී අපනයන ආදායම ඇ.ඩො. මිලියන 8,010.1 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 8,499.1 ක් දක්වා සියයට 6.1 කින් වර්ධනය විය. 2023 වසරේ පළමු මාස අට තුළ දී ආනයන වියදම ඇ.ඩො. මිලියන 10,974.1 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 12,072.5 ක් දක්වා සියයට 10.0 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වසරේ පළමු මාස අට තුළ දී වෙළෙඳ හිඟය ඇ.ඩො. මිලියන 2,964.0 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 3,573.4 ක් දක්වා පුළුල් විය.

2023 වසරේ පළමු මාස අට තුළ දී ශ්‍රමික ප්‍රේෂණ ඇ.ඩො. මිලියන 3,862.7 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 4,288.2 ක් දක්වා සියයට 11.0 කින් වර්ධනය විය. 2023 වසරේ පළමු මාස අට තුළ දී සංචාරක ඉපයීම්, ඇ.ඩො. මිලියන 2,304.5 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,167.0 ක් දක්වා සියයට 66.1 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. සේවා අංශයේ ඉපයීම් ද 2024 වසරේ පළමු මාස අට තුළ දී වර්ධනය විය.

විදේශ විනිමය ඉපැයීම් වැඩි දියුණුවීම හේතුවෙන් 2024 වසරේ අගෝස්තු මාසය අවසාන වන විට චීනයේ මහජන බැංකුවේ විදේශ හුවමාරු පහසුකම ද ඇතුළුව දළ නිල සංචිත ඇ.ඩො. බිලියන 6.0 දක්වා වර්ධනය විය. විදේශ අංශයේ ධනාත්මක සංවර්ධනයන් සමඟ 2024 වසරේ අගෝස්තු මස අවසාන වන විට ශ්‍රී ලංකාවේ රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 7.9 කින් අතිප්‍රමාණය විය.

## 1.2 උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 70 ක් පමණ වූ එහි උපරිම අගයේ සිට 2023 සහ 2024 වසරවල දී ශීඝ්‍රයෙන් පහත වැටුණු අතර, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 0.5 ක අවධමනයක් වාර්තා කරන ලදී.

එලෙස උද්ධමනයේ සෘණාත්මක අගයක් වාර්තා වූයේ 2015 වසරේ සැප්තැම්බර් මාසයෙන් පසු ප්‍රථම වරටය. කෙසේ වුවද, 2023 වසරේ ඔක්තෝම්බර් මස සිට 2024 වසරේ ජනවාරි මස දක්වා කාලය තුළ උද්ධමනය සුළු වශයෙන් වැඩි වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලද අතර, 2024 වසරේ ජනවාරි මසට නියමිතව තිබූ එකතු කළ අගය මත බද්ද ඉහළයාම පිළිබඳව ඇති වූ මහජන අපේක්ෂාවන්, සහ අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ආහාර සැපයුමට බාධා පැමිණීම, මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, 2024 වසරේ පෙබරවාරි මාසයේ දී මතුපිට උද්ධමනය යළිත් පහත වැටීමට පටන් ගත් අතර, ප්‍රධාන වශයෙන් සියයට 22 කින් විදුලි ගාස්තු අඩු කිරීම හේතුකොටගෙන 2024 වසරේ මාර්තු මාසයේ දී මතුපිට උද්ධමනයේ ශීඝ්‍ර අඩුවීමක් වාර්තා විය.

කො.පා.මි.ද. (2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2024 වසරේ ජනවාරි මාසයේ දී පැවති සියයට 6.4 ක අගයක සිට 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 0.5 ක අවධමනයක් දක්වා පහත වැටුණි. 'ආහාර' කාණ්ඩය 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 0.3 ක අවධමනයක් වාර්තා කළ අතර 'ආහාර නොවන' කාණ්ඩය 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී 0.5 ක අවධමනයක් වාර්තා කරන ලදී. එලෙසම, ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2024 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 6.5 ක සිට 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට -0.2 ක් දක්වා අඩු විය. මෙම උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාවයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විදුලි ගාස්තු, ඉන්ධන සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් මිල පහත දැමීමය. මෙයට අමතරව, ආහාර ද්‍රව්‍යවල මිල මධ්‍යස්ථ මට්ටමකට පැමිණීම සඳහා දේශීය සැපයුම් දාමයන් වැඩිදියුණු කිරීම, ගෝලීය සැපයුම් දාමයන් යථා තත්ත්වයට පත්වීම සහ ඉල්ලුම අඩුවීම හේතු විය.

ආර්ථිකයේ නිතර මිල උච්චාවචණය වන අයිතම වන ආහාර, බලශක්තිය සහ ප්‍රවාහනය යන කාණ්ඩ බැහැර කිරීම මඟින් ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරනු ලබන, මූලික උද්ධමනය සැළකූ විට, කො.පා.මි.ද. (2021=100) යෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය, 2024 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා කරන ලද සියයට 2.2 ක සිට 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 3.3 ක් දක්වා වැඩි විය. එසේම, ජා.පා.මි.ද. (2021=100) යෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය ද 2024 වසරේ ජනවාරි මාසයේ දී පැවති සියයට 2.2 ක සිට 2024 වසරේ අගෝස්තු මාසයේ දී සියයට 2.3 ක් දක්වා වැඩි විය. ඉහත සඳහන් පරිදි මූලික උද්ධමනය ආන්තිකව ඉහළ ගියද, ආර්ථිකය තුළ ඉල්ලුමෙහි බලපෑම අවම වීම පිළිබිඹු කරමින්, එය අඩු මට්ටමක පැවතුනි. ආහාර මිල අඩුවීම සහ සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හේතුවෙන් ඉදිරි මාසවල දී උද්ධමනය එහි ඉලක්කගත අගය වන සියයට 5 ක අගය ආසන්නයෙහි ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**1.1 වගුව : උද්ධමනයේ විචලනය**

| වසර | මාසය | කොළඹ පාරිභෝගික මිල දර්ශකය | | | | ජාතික පාරිභෝගික මිල දර්ශකය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මතුපිට උද්ධමනය | | මූලික උද්ධමන | | මතුපිට උද්ධමනය | | මූලික උද්ධමන | |
| | | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍යය |
| 2023 | ජනවාරි | 54.2 | ලැ.නො. | 45.6 | 37.6 | 53.2 | ලැ.නො. | 52.0 | ලැ.නො. |
| | පෙබරවාරි | 50.6 | ලැ.නො. | 43.6 | ලැ.නො. | 53.6 | ලැ.නො. | 50.1 | ලැ.නො. |
| | මාර්තු | 50.3 | ලැ.නො. | 39.1 | ලැ.නො. | 49.2 | ලැ.නො. | 44.2 | ලැ.නො. |
| | අප්‍රේල් | 35.3 | ලැ.නො. | 27.8 | ලැ.නො. | 33.6 | ලැ.නො. | 31.8 | ලැ.නො. |
| | මැයි | 25.2 | ලැ.නො. | 20.3 | ලැ.නො. | 22.1 | ලැ.නො. | 21.6 | ලැ.නො. |
| | ජූනි | 12.0 | ලැ.නො. | 9.8 | ලැ.නො. | 10.8 | ලැ.නො. | 11.3 | ලැ.නො. |
| | ජූලි | 6.3 | ලැ.නො. | 5.9 | ලැ.නො. | 4.6 | ලැ.නො. | 6.3 | ලැ.නො. |
| | අගෝස්තු | 4.0 | ලැ.නො. | 4.6 | ලැ.නො. | 2.1 | ලැ.නො. | 4.1 | ලැ.නො. |
| | සැප්තැම්බර් | 1.3 | ලැ.නො. | 1.9 | ලැ.නො. | 0.8 | ලැ.නො. | 1.7 | ලැ.නො. |
| | ඔක්තෝබර් | 1.5 | ලැ.නො. | 1.2 | ලැ.නො. | 1.0 | ලැ.නො. | 0.6 | ලැ.නො. |
| | නොවැම්බර් | 3.4 | ලැ.නො. | 0.8 | ලැ.නො. | 2.8 | ලැ.නො. | 0.8 | ලැ.නො. |
| | දෙසැම්බර් | 4.0 | 17.4 | 0.6 | 14.5 | 4.2 | 16.5 | 0.9 | 15.8 |
| 2024 | ජනවාරි | 6.4 | 14.2 | 2.2 | 11.3 | 6.5 | 13.4 | 2.2 | 12.3 |
| | පෙබරවාරි | 5.9 | 11.3 | 2.8 | 8.5 | 5.1 | 10.2 | 2.7 | 9.2 |
| | මාර්තු | 0.9 | 8.0 | 3.1 | 6.1 | 2.5 | 7.2 | 3.4 | 6.5 |
| | අප්‍රේල් | 1.5 | 5.7 | 3.4 | 4.4 | 2.7 | 5.2 | 3.0 | 4.6 |
| | මැයි | 0.9 | 3.9 | 3.5 | 3.3 | 1.6 | 3.7 | 3.1 | 3.3 |
| | ජූනි | 1.7 | 3.1 | 4.4 | 2.8 | 2.4 | 3.0 | 3.9 | 2.7 |
| | ජූලි | 2.4 | 2.8 | 4.4 | 2.7 | 2.5 | 2.9 | 3.0 | 2.5 |
| | අගෝස්තු | 0.5 | 2.5 | 3.6 | 2.7 | 1.1 | 2.8 | 2.3 | 2.3 |
| | සැප්තැම්බර් | -0.5 | 2.4 | 3.3 | 2.8 | -0.2 | 2.7 | 1.9 | 2.3 |

*මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*
*කොළඹ පාරිභෝගික මිල දර්ශනය (ලක්ෂමය), ජාතික පාරිභෝගික මිල දර්ශනය (ලක්ෂමය) ආහාර බලශක්ති සහ ප්‍රවාහනය යන නිතර වෙනස් වන අයිතම හැර*

*2023 ජනවාරි පදනම් වර්ෂය 2013=100*
*2023 පෙබරවාරි සිට පදනම් වර්ෂය 2021=100*
*ලැ.නො. - ලැබී නොමැත.*

## 1.3 මුදල් සහ ණය

ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම 2023 වසරේ ජූනි මාසයේ සිට මේ දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. වසර ආරම්භයේ දී පිළිවෙළින් සියයට 9.00 සහ සියයට 10.00 ලෙස පැවති නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පදනම් අංක 75 බැගින් අඩු කර, 2024 වසරේ සැප්තැම්බර් මාසය වන විට ඒවා පිළිවෙළින් සියයට 8.25 ක් සහ 9.25 ක් දක්වා අඩු කරන ලදී. මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳපොළ පොලී අනුපාත, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී, ඓතිහාසික වශයෙන් වාර්තා වූ ඉහළම මට්ටමේ සිට මේ වන විට අඩු වී ඇත. අඩු කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතවලට අනුකූලව රජයේ සුරැකුම්පත්වල අනුපාත ද අඛණ්ඩව පහත වැටුණි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය 2024 වසර තුළ මේ දක්වා සියයට 2.00 ක් ලෙස නොවෙනස්ව පවත්වා ගෙන ඇත.

මුදල් ප්‍රතිපත්තිය සැළකිය යුතු මට්ටමින් ලිහිල් කිරීම සහ සමස්ත ද්‍රවශීලතා තත්ත්වයන් ඉහළ නංවා තිබිය දී වුවද, පෞද්ගලික අංශය වෙත ලැබුණු ණය ප්‍රවාහය, 2024 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ රු. බිලියන 7,314.2 ක සිට 2024 වසරේ අගෝස්තු මාසයේ දී රු. බිලියන 7,707.7 ක් දක්වා සුළු අගයකින් පමණක් වැඩිවිය. වෙළෙඳපොල ණය පොලී අනුපාත තවදුරටත් පහත හෙලීම පුද්ගලික අංශයේ ණය ඉහළ යාම උත්තේජනය කිරීමට උපකාරී වන අතර එමඟින් ආර්ථිකය අඛණ්ඩව යළි නගා සිටුවීමට පිටිවහලක් ලැබෙනු ඇත.

**1.2 වගුව: මුදල් හා වාණිජ බැංකු විසින් පුද්ගලික අංශයට ලබා දුන් ණය**

රු. බිලියන

| අයිතමය | 2023 | | | | | | | | 2024 | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | 2024 අගෝස්තු/ 2023 අගෝස්තු වර්ධනය (%) |
| සංචිත මුදල් | 1,589.7 | 1,504.7 | 1,424.2 | 1,417.1 | 1,559.1 | 1,435.8 | 1,373.8 | 1,407.3 | 1,488.6 | 1,413.7 | 1,405.6 | 1,426.5 | 1,396.2 | 1,417.7 | 1,455.1 | 1,485.7 | 5.6 |
| පුළුල් මුදල් | 12,322.5 | 12,345.8 | 12,293.4 | 12,386.7 | 12,306.5 | 12,516.6 | 12,726.3 | 12,697.9 | 13,114.9 | 13,201.1 | 13,324.6 | 13,420.0 | 13,616.4 | 13,747.9 | 13,824.6 | 13,876.8 | 9.3 |
| පුද්ගලික අංශයට ලබා දුන් ණය | 7,315.4 | 7,257.9 | 7,138.4 | 7,087.7 | 6,999.0 | 7,072.7 | 7,086.2 | 7,092.1 | 7,314.2 | 7,321.5 | 7,393.4 | 7,377.2 | 7,437.9 | 7,512.4 | 7,572.6 | 7,707.7 | 8.7 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## 1.4 කොටස් වෙළෙඳපොළ

2024 වසරේ මේ දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ ශීඝ්‍රයෙන් වර්ධනය විය. සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) 2023 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී පැවති ඒකක 11,336 ට සාපේක්ෂව 2024 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී ඒකක 11,855 ක් දක්වා සියයට 4.6 කින් වැඩි විය. වඩාත්ම ද්‍රවශීල කොටස් නියෝජනය කරනු ලබන ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 (2004 = 1,000) දර්ශකය ද 2023 වසරේ සැප්තැම්බර් මාසය අග දී වාර්තා වූ ඒකක 3,198 ක සිට 2024 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී ඒකක 3,453 ක් දක්වා සියයට 8.0 කින් වැඩි විය.

වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය සැලකීමේදී එය 2023 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී වාර්තා වූ රු. බිලියන 4,537 ට සාපේක්ෂව 2024 වසරේ සැප්තැම්බර් මස අවසානයේ දී රු. බිලියන 4,382 ක් දක්වා සියයට 3.4 කින් පහත වැටුණි. 2024 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට කොළඹ කොටස් වෙළෙඳපොළ සාමාන්‍ය දෛනික පිරිවැටුම, 2023 වසරේ එම කාලය තුළ වාර්තා වූ රු. මිලියන 1,394 ට සාපේක්ෂව රු. මිලියන 2,946 ක් දක්වා සියයට 111.3 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය.

**1.3 වගුව:** ප්‍රාග්ධන වෙළෙඳපොළ කාර්ය සාධනය

| දර්ශකය | 2020 | 2021 | 2022 | 2023 | සැප්තැම්බර් අවසන් දිනය වන විට 2023 | සැප්තැම්බර් අවසන් දිනය වන විට 2024 |
|---|---|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) | 6,774 | 12,226 | 8,490 | 10,594 | 11,336 | 11,855 |
| එස් ඇන්ඩ් පී. එස්. එල් 20 දර්ශකය | 2,638 | 4,233 | 2,636 | 3,010 | 3,198 | 3,453 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,961 | 5,489 | 3,847 | 4,261 | 4,537 | 4,382 |
| වෙළෙඳපොල කටයුතු සිදු කරනු ලබන ලැයිස්තු ගත සමාගම් ගණන | 283 | 296 | 290 | 290 | 291 | 284 |
| දෛනික පිරිවැටුම (රු. බිලියන) | 1,899 | 4,888 | 2,972 | 1,697 | 1,926 | 1,538 |
| විදේශ විකුණුම් (රු. මිලියන) | 104,165 | 86,689 | 36,863 | 34,810 | 28,354 | 43,811 |
| විදේශ මිලදී ගැණුම් (රු.මිලියන) | 52,889 | 39,410 | 67,488 | 39,826 | 32,008 | 37,364 |
| ශුද්ධ මිලදී ගැණුම් (රු.මිලියන) | -51,276 | -47,279 | 30,625 | 5,017 | 3,654 | -6,448 |

*මූලාශ්‍රය: කොළඹ කොටස් වෙළෙඳපොළ*

## 1.5 විදේශ අංශයේ ප්‍රවණතා

විදේශ අංශය 2024 වසරේ පළමු මාස අට තුළ සේවක ප්‍රේෂණ සහ සංචාරක අංශයේ ඉපැයීම් වලින් ලැබෙන ලැබීම් ඉහළ යාමත් සමඟ ධනාත්මක ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. විදේශ ශ්‍රමික ප්‍රේෂණ ඇ. ඩො. මිලියන 4,288.2 දක්වා සියයට 11.0 කින් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර සංචාරක ඉපැයීම් ඇ. ඩො. මිලියන 2,167.0 දක්වා සියයට 66.1 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. මුළු අපනයන ආදායම ඇ. ඩො. මිලියන 8,499.1 දක්වා සියයට 6.1 කින් වැඩි වීමේ සහ ආනයන වියදම ඇ. ඩො. මිලියන 12,072.5 දක්වා සියයට 10.0 කින් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිඟය ඇ. ඩො. මිලියන 3,573.4 දක්වා පුළුල් විය. දළ නිල සංචිතය, 2024 වසරේ අගෝස්තු මස අවසානය වන විට ඇ.ඩො. බිලියන 6.0 දක්වා වර්ධනය විය.

කොළඹ කොටස් වෙළෙඳපොළහි, 2023 වසරේ පළමු මාස අට තුළ වූ ඇ.ඩො. මිලියන 15.4 ක ශුද්ධ ලැබීම්වලට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 44.4 දක්වා ශුද්ධ ලැබීම්වල වැඩිවීමක් වාර්තා කළේය. රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි 2023 වසරේ පළමු මාස අට තුළ වූ ඇ.ඩො. මිලියන 351.6 ක ලැබීම්වලට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 251.4 ක ශුද්ධ පිටතට ගලායාමක් වාර්තා විය. සමස්ත ගෙවුම් ශේෂය (BoP) 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,034.1 ක අතිරික්තයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,184.4 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. 2024 වසරේ සැප්තැම්බර් මස අවසන් වන විට ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 8.2 කින් අතිප්‍රමාණය විය.

**1.4 වගුව:** විදේශ වෙළඳාම (2024 ජනවාරි - අගෝස්තු දක්වා)

ඇ. ඩො. මිලියන

| අයිතමය | 2023 | 2024 | වර්ධනය % |
|---|---|---|---|
| **අපනයන** | **8,010.1** | **8,499.1** | **6.1** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 1,702.9 | 1,804.0 | 5.9 |
| තේ | 870.4 | 942.3 | 8.3 |
| රබර් | 21.2 | 16.4 | -22.8 |
| පොල් | 224.0 | 272.2 | 21.5 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 587.3 | 573.1 | -2.4 |
| කාර්මික නිෂ්පාදන | 6,273.6 | 6,658.6 | 6.1 |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 354.4 | 427.7 | 20.7 |
| රෙදිපිළි හා ඇඟළුම් | 3,325.7 | 3,364.8 | 1.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 325.7 | 702.5 | 115.7 |
| රබර් නිෂ්පාදන | 588.1 | 663.1 | 12.8 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 418.7 | 336.1 | -19.7 |
| අනෙකුත් කාර්මික නිෂ්පාදන | 1,261.0 | 1,164.4 | -7.7 |

ඇ. ඩො. මිලියන

| අයිතමය | 2023 | 2024 | වර්ධනය % |
|---|---|---|---|
| ඛනිජ නිෂ්පාදන | 15.7 | 18.8 | 19.8 |
| අනෙකුත් | 17.9 | 17.7 | -1.0 |
| **ආනයන** | **10,974.1** | **12,072.5** | **10.0** |
| පාරිභෝගික භාණ්ඩ | 2,028.3 | 2,176.3 | 7.3 |
| ආහාර හා පාන වර්ග | 1,158.0 | 1,214.1 | 4.8 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 870.3 | 962.2 | 10.6 |
| අන්තර් භාණ්ඩ | 7,185.5 | 7,750.0 | 7.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 3,079.5 | 2,896.5 | -5.9 |
| පොහොර | 139.8 | 102.9 | -26.4 |
| රෙදිපිළි සහ රෙදිපිළි උපාංග | 1,584.0 | 1,839.3 | 16.1 |
| රසායනික නිෂ්පාදන | 527.6 | 657.1 | 24.5 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 296.4 | 385.8 | 30.2 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 114.0 | 132.0 | 15.8 |
| ආයෝජන භාණ්ඩ | 1,747.9 | 2,140.3 | 22.5 |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 1,219.0 | 1,438.6 | 18.0 |
| ප්‍රවාහන උපකරණ | 45.6 | 98.0 | 115.0 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 481.4 | 601.9 | 25.0 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 1.9 | 1.8 | -5.9 |
| වර්ග නොකළ ආනයන | 12.4 | 5.9 | -52.5 |
| **වෙළෙඳ ශේෂය** | **-2,964.0** | **-3,573.4** | |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## අපනයන

ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමත් සමග දේශීය අපනයන කර්මාන්තයේ පුනරුදය සහ විදේශ වෙළෙඳපොළේ ඉල්ලුම වැඩිවීම හේතුවෙන් කාර්මික, කෘෂිකාර්මික හා ඛනිජ අපනයන ඉපැයීම් ඉහළ යාමත් සමඟ අපනයන ඉපැයීම්, 2023 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 8,010.1 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 8,499.1 දක්වා සියයට 6.1 කින් ඉහළ ගියේ ය. කාර්මික අපනයන ඉපැයීම්, මුළු අපනයන ආදායමට සියයට 78.3 ක දායකත්වයක් ලබා දී ඇති අතර කෘෂිකාර්මික හා ඛනිජ අපනයන සමස්ත අපනයන ආදායමෙන් පිළිවෙළින් සියයට 21.2 ක් සහ සියයට 0.2 ක් විය.

රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදන, රබර් නිෂ්පාදන, ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන අපනයන ආදායම වැඩිවීම හේතුවෙන් කාර්මික අපනයන ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී ලද ඇ.ඩො. මිලියන 6,273.6 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 6,658.6 ක් දක්වා සියයට 6.1 කින් වැඩි විය. තේ, පොල්, කුළු බඩු සහ එළවළුවලින් ලද අපනයන ඉපැයීම් වැඩිවීමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 1,702.9 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,804.0 ක් දක්වා සියයට 5.9 කින් ඉහළ ගියේය. මේ අතර, ඛනිජ අපනයන ඉපැයීම් 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 15.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 18.8 ක් දක්වා සියයට 19.8 කින් වැඩි විය.

## ආනයන

ආර්ථික ක්‍රියාකාරකම්හි පුනර්ජීවනය සහ භාණ්ඩ ආනයනය කිරීමේ සීමාවන් ඉවත් කිරීමත් සමඟ විදේශ වෙළෙඳපොළ තුළ භාණ්ඩ මිල ඉහළ යාමේ බලපෑමත් හේතුවෙන් පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ සඳහා ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන්, ආනයන වියදම 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ. ඩො. මිලියන 10,974.1 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 12,072.5 දක්වා සියයට 10.0 කින් වැඩි විය. පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ මත ආනයන වියදම් මුළු ආනයන වියදමෙන් පිළිවෙලින් සියයට 18.0 ක්, සියයට 64.2 ක් සහ සියයට 17.7 ක් විය.

පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ. ඩො. මිලියන 2,028.3 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,176.3 දක්වා සියයට 7.3 කින් ඉහළ ගොස් ඇති අතර, ආහාර පාන සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩයන්හි ආනයන වියදම් වැඩි වීම මෙයට හේතු විය. රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, රසායනික නිෂ්පාදන, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මූල ලෝහ සහ කඩදාසි හා සන කඩදාසි සහ උපාංග ආනයන වියදම් ප්‍රධාන වශයෙන් වැඩි වීම හේතුවෙන් අතරමැදි භාණ්ඩ මත ආනයන වියදම 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ. ඩො. මිලියන 7,185.5 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 7,750.0 දක්වා සියයට 7.9 කින් වැඩි විය. පිරිපහදු කළ ඛනිජතෙල් සඳහා වන වියදම ඇ.ඩො. මිලියන 2,156.0 දක්වා සියයට

11.1 කින් ඉහළ ගොස් තිබියදීත්, ගල් අඟුරු ආනයන වියදම ඇ.ඩො. මිලියන 170.5 දක්වා සියයට 50.0 කින් සැලකිය යුතු ලෙස අඩු වීමත් සහ බොරතෙල් ආනයන වියදම ඇ.ඩො. මිලියන 570.1 ක් දක්වා සියයට 28.5 කින් අඩු වීමත් සමඟ ඉන්ධන ආනයන වියදම 2024 වසරේ පළමු මාස අට තුළ දී ඇ. ඩො. මිලියන 2,896.5 දක්වා සියයට 5.9 කින් අඩු වී ඇත.

ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ.ඩො. මිලියන 1,747.9 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,140.3 දක්වා සියයට 22.5 කින් වැඩි විය. විදේශ වෙළෙඳපොළ තුළ මිල ගණන් ඉහළ යාම සහ ආර්ථිකයේ පුනර්ජීවනයත් සමඟ ආයෝජන කටයුතු වර්ධනයවීම හේතුවෙන් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා වන ආනයන වියදම ඇ.ඩො. මිලියන 1,438.6 දක්වා සියයට 18.0 කින් ද, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඇ.ඩො. මිලියන 601.9 දක්වා සියයට 25.0 කින් ද, ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඇ.ඩො. මිලියන 98.0 දක්වා සියයට 115.0 කින් ද ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

### සේවක ප්‍රේෂණ සහ සංචාරක අංශයේ ඉපැයීම්

විදේශ රැකියා සඳහා පිටත්වීම් ඉහළ යාම සහ විධිමත් මාර්ග හරහා මුදල් ප්‍රේෂණය දිරිමත් කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සමඟ විධිමත් මාර්ග හරහා සේවක ප්‍රේෂණ ලැබීම හේතුවෙන් සේවක ප්‍රේෂණ 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ ඇ. ඩො. මිලියන 3,862.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 4,288.2 දක්වා සියයට 11.0 කින් වර්ධනය විය. විදේශ රැකියා සඳහා පිටත්ව යන පුද්ගලයන් සංඛ්‍යාව 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ පුද්ගලයින් 198,287 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 205,929 ක් ලෙස වාර්තා විය. මේ අතර, සංචාරක ක්ෂේත්‍රයේ පුනරුදයත් සමඟ ඉන්දියාව, එක්සත් රාජධානිය, රුසියාව, ජර්මනිය, චීනය සහ ප්‍රංශය යන රටවලින් සංචාරක පැමිණීම් වැඩිවීමත් සමඟ සංචාරක ඉපැයීම්, 2023 වසරේ පළමු මාස අට තුළ දී ලද ඇ.ඩො. මිලියන 1,304.5 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,167.0 දක්වා සියයට 66.1 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. ඒ අනුව, සංචාරක පැමිණීම් 2023 වසරේ පළමු මාස අට තුළ දී වූ පුද්ගලයින් 904,318 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 1,362,668 දක්වා සියයට 50.7 කින් වර්ධනය විය.

## 1.6 ගෝලීය ආර්ථික ප්‍රවණතා[1]

2022-2023 වසර කාලය තුළ දී අඛණ්ඩව ඇති වූ ආර්ථික අභියෝගයන් හමුවේ ගෝලීය ආර්ථිකය ශක්තිමත්ව පැවතුණි. 2022 වසරේ මැද භාගයේ දී පෙන්නුම් කරන ලද වාර්තාගත ලෙස ඉහළ උද්ධමන අගයේ සිට නිර්-උද්ධමනය වෙමින් පැවති ගෝලීය උද්ධමනය සහ ඉහළ පොලී අනුපාත මධ්‍යයේ වුවද, ගෝලීය ආර්ථිකය 2022 වසරේ දී සහ 2023 වසරේ දී පිළිවෙලින් සියයට 3.5 ක සහ 3.2 ක අගයකින් වර්ධනය විය.

2024 වසරේ දී සියයට 3.2 කින් සහ 2025 වසරේ දී සියයට 3.3 කින් ගෝලීය ආර්ථිකය වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර කෝවිඩ් -19 වසංගතයේ පසු බලපෑම්, භූ-දේශපාලනික අර්බුද, නිෂ්පාදන අංශයෙහි දුර්වල වර්ධනය සහ උග්‍ර වෙමින් පවතින භූ-ආර්ථික බෙදීයාම හේතුවෙන් එම අගය විශේෂයෙන්ම 2000-2019 වසර කාලය තුළ ඓතිහාසික වශයෙන් පැවති සියයට 3.8 ක සාමාන්‍ය අගයට වඩා අඩු මට්ටමක පවතී. සංසන්දනාත්මක ලෙස අඩු වර්ධනයක් පෙන්නුම් කරන මෙම ඉදිරි දැක්ම තුළින් සීමාකාරී මුදල් ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය සහය ඉවත් කිරීම සහ අඩු ඵලදායිතා වර්ධනය ආදියෙහි බලපෑම් පිළිබිඹු කරයි.

දියුණු ආර්ථිකයන් සහ නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි 2024-26 වසර සඳහා වර්ධනය වසංගතයට පෙර දශකයට සමගාමීව මන්දගාමී වනු ඇත. එක්සත් ජනපදයේ සියයට 2.6 ක්, යුරෝ කලාපයේ සියයට 0.9 ක්, ජපානයේ සියයට 0.7 ක් සහ අනෙකුත් දියුණු ආර්ථිකයන්හි සියයට 1.6 ක් ලෙස පුරෝකථනය කර ඇති වර්ධනය හේතුවෙන් 2024 වසරේ දී දියුණු ආර්ථිකයන්හි වර්ධනය සියයට 1.7 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. යුක්‍රේන-රුසියා අර්බුදයේ බලපෑම් හේතුවෙන් 2023 වසරේ දී සියයට 0.4 ක අඩු වර්ධනයක් පෙන්නුම් කළ යුරෝ ප්‍රදේශය යථා තත්ත්වයට පත්වීම දියුණු ආර්ථිකයන්හි මධ්‍යස්ථ වර්ධනයට හේතු විය. 2024 වසරේ පළමු කාර්තුවේ දී ඇතිවූ තාවකාලික සැපයුම් අඩාල වීම් සහ පෞද්ගලික අංශයේ දුර්වල ආයෝජනයන් හේතුවෙන් ජපානයේ වර්ධනය මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි වර්ධනය 2024-26 කාලය තුළ දී වසරකට සියයට 4 කට වඩා වැඩි වනු ඇතැයි පුරෝකථනය කර ඇත. වසංගතයෙන් පසු පරිභෝජනය ඉහළ යෑම සහ රාජ්‍ය මූල්‍ය උත්තේජකයන් ඇතුළු එක්වරක් පමණක් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ගයන්හි හිතකර බලපෑම පහව යෑම සහ දේපල අංශය අඛණ්ඩව දුර්වල වීම හේතුවෙන් චීනයේ වර්ධනය 2023 වසරේ දී වාර්තා කරන ලද සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී පහත වැටී, 2025 වසර සහ 2026 වසරේ දී තවදුරටත් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. චීනය හැර, අනෙකුත් නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි වර්ධනය මෙම වසරේ දී සියයට 3.5 ක් දක්වා ඉහළ ගොස්, පසුව 2025-26 කාලයේ දී සියයට 3.9 ක සාමාන්‍ය අගයක් දක්වා වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. දේශීය ඉල්ලුම වැඩි වීම සහ වැඩකරන වයසේ ජනගහනය වැඩිවීමේ බලපෑම් හේතුවෙන් ඉන්දියාවේ වර්ධනය 2024 වසරේ දී සියයට 7.0 ක් සහ 2025 වසරේ දී සියයට 6.5 ක් ලෙස ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1. World Economic Outlook (2024 අප්‍රේල්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල), World Economic Outlook Update (2024 ජූලි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල) , Fiscal Monitor (2024 අප්‍රේල්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල), Commodity Markets Outlook (2024 අප්‍රේල්, ලෝක බැංකුව), Asian Development Outlook (2024 අප්‍රේල්, ආසියානු සංවර්ධන බැංකුව) සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින්, ලෝක බැංකුවෙන් සහ අන්තර්ජාලයෙන් ලබා ගන්නා ලද වෙනත් දත්ත හා තොරතුරු මත පදනම්ව ඇත.

අඩු ආදායම්ලාභී සංවර්ධනය වෙමින් පවතින රටවල වර්ධනය 2023 වසරේ දී සියයට 4.2 ක අගයක සිට 2024 වසරේ දී සියයට 4.4 ක් දක්වා සහ 2025 වසරේ දී සියයට 5.3 ක් දක්වා තවදුරටත් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. වඩා හොඳ ආයෝජනයන්, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල පෞද්ගලික අංශයේ පරිභෝජනය යථා තත්ත්වයට පත් වීම සහ ඉලෙක්ට්‍රොනික හා සේවා අපනයන්හි වර්ධනය හේතුවෙන්, ඉන්දියාව, ආසියාව තුළ ප්‍රධාන වර්ධන ආර්ථිකයක් ලෙස සිය ස්ථාවරත්වය තහවුරු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. පකිස්ථානයේ සහ ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථායීකරණය 2024 වසරේ දී ධනාත්මක වර්ධනයකට සහ 2025 වසරේ දී වඩාත් වේගවත් වර්ධනයකට  හේතු වනු ඇත.

**1.5:** වගුව **ලෝක තත්ත්වය - 2023**

| රට | 2023 | | | | |
|---|---|---|---|---|---|
| | ද.දේ.නි.වර්ධනය (වාර්ෂික ප්‍රතිශතක වෙනස) | උද්ධමනය (ප්‍රතිශතය) | සේවා වියුක්තිය (ප්‍රතිශතය) | රාජ්‍ය මූල්‍ය ශේෂය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) | දළ ණය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) |
| ආර්ජන්ටිනාව | -1.6 | 133.5 | 6.6 | -4.2 | 154.5 |
| ඕස්ට්‍රේලියාව | 2.1 | 5.6 | 3.7 | -0.9 | 49.4 |
| බ්‍රසීලය | 2.9 | 4.6 | 8.0 | -7.9 | 84.7 |
| කැනඩාව | 1.1 | 3.9 | 5.4 | -0.6 | 107.1 |
| චිලී | 0.2 | 7.6 | 8.8 | -2.2 | 39.4 |
| චීනය | 5.2 | 0.2 | 5.2 | -7.1 | 83.6 |
| ප්‍රංශය | 0.9 | 5.7 | 7.4 | -5.5 | 110.6 |
| ජර්මනිය | -0.3 | 6.0 | 3.0 | -2.1 | 64.3 |
| ග්‍රීසිය | 2.0 | 4.2 | 10.9 | -1.6 | 168.8 |
| ඉන්දියාව | 7.8 | 5.4 | ... | -8.6 | 82.7 |
| ඉන්දුනීසියාව | 5.0 | 3.7 | 5.3 | -1.6 | 39.9 |
| ඉතාලිය | 0.9 | 5.9 | 7.7 | -7.2 | 137.3 |
| ජපානය | 1.9 | 3.3 | 2.6 | -5.8 | 252.4 |
| කොරියාව | 1.4 | 3.6 | 2.7 | -1.0 | 55.2 |
| මැලේසියාව | 3.7 | 2.5 | 3.6 | -4.4 | 67.3 |
| මෙක්සිකෝව | 3.2 | 5.5 | 2.8 | -4.3 | 53.1 |
| රුසියාව | 3.6 | 5.9 | 3.2 | -2.3 | 19.7 |
| සිංගප්පූරුව | 1.1 | 4.8 | 1.9 | 3.6 | 162.1 |
| දකුණු අප්‍රිකාව | 0.6 | 5.9 | 32.8 | -6.0 | 73.9 |
| ස්පාඤ්ඤය | 2.5 | 3.4 | 12.1 | -3.6 | 107.5 |
| ශ්‍රී ලංකාව | -2.3 | 17.4 | 4.7 | -8.3 | 103.9 |
| තායිලන්තය | 1.9 | 1.2 | 1.2 | -3.2 | 62.4 |
| එක්සත් රාජධානිය | 0.1 | 7.3 | 4.0 | -6.0 | 101.1 |
| එක්සත් ජනපදය | 2.5 | 4.1 | 3.6 | -8.8 | 122.1 |
| වියට්නාමය | 5.0 | 3.3 | 2.0 | -1.6 | 34.0 |
| වෙනිසියුලාව | 4.0 | 337.5 | ... | -3.4 | 148.2 |

*මූලාශ්‍ර: World Economic Outlook, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අප්‍රේල් 2024, Fiscal Monitor, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අප්‍රේල් 2024*

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*... ලැ.නො*

ගෝලීය වශයෙන් වන මතුපිට උද්ධමනය 2023 වසරේ දී පැවති සියයට 6.8 ක අගයක සිට 2024 වසරේ දී සියයට 5.9 ක් දක්වා පහත වැටී ඉන් අනතුරුව, 2025 වසරේ දී සියයට 4.5 ක් දක්වා තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළෙඳ භාණ්ඩ මිලෙහි සුළු අඩු වීමකට අමතරව සේවා ඉල්ලුම මධ්‍යස්ථ වීම සහ වැටුප් වර්ධනය මන්දගාමී වීමත් සමග මූලික උද්ධමනය ලිහිල් වීම මෙම පහත වැටීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෙසේ වෙතත්, සේවා මිල ගණන්වල අඛණ්ඩ වැඩිවීම සහ ඉහළ භාණ්ඩ මිල ගණන් හේතුවෙන් දියුණු ආර්ථිකයන්හි නිර්-උද්ධමන වේගය 2024 සහ 2025 වර්ෂයන්හී දී මන්දගාමී වනු ඇත. නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි උද්ධමනය 2023 වසරේ දී මෙන් 2024 වසරේ දී ද සියයට 8.3 ක අගයක අඛණ්ඩව පැවතීමත් සමඟ නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි නිර්-උද්ධමන වේගය සාපේක්ෂව අඩු විය. 2026 වසර පමණ වන විට නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට ඔවුන්ගේ පූර්ව වසංගත උද්ධමන සාමාන්‍යය වන සියයට 5.0 ක අගයකට ළඟා වීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**1.6 වගුව: ජාත්‍යන්තර භාණ්ඩ මිළ ගණන්**

| අයිතමය | ඒකකය | තත්‍ය | | ඇස්තමේන්තු | |
|---|---|---|---|---|---|
| | | 2022 | 2023 | 2024 | 2025 |
| **බලශක්ති** | | | | | |
| ගල් අඟුරු ඕස්ට්‍රේලියාව | මෙ.ටො./ ඩොලර් | 344.9 | 172.8 | 125.0 | 110.0 |
| බොරතෙල් සාමාන්‍යය | බැරලයට ඩොලර් | 99.8 | 82.6 | 84.0 | 79.0 |
| ස්වාභාවික වායු එක්සත් ජනපද | මෙට්‍රික් බ්‍රිතාන්‍ය තාප ඒකක මිලියනයට/ ඩොලර් | 6.4 | 2.5 | 2.4 | 3.5 |
| **බලශක්ති නොවන** | | | | | |
| **කෘෂිකාර්මික** | | | | | |
| **පාන වර්ග** | | | | | |
| කොකෝවා | කිලෝග්‍රෑමයට ඩොලර් | 2.39 | 3.28 | 5.00 | 4.00 |
| කෝපි, රොබොස්ටා | කිලෝග්‍රෑමයට ඩොලර් | 2.29 | 2.63 | 3.50 | 2.80 |
| තේ | කිලෝග්‍රෑමයට ඩොලර් | 3.05 | 2.74 | 2.75 | 2.77 |
| **ආහාර** | | | | | |
| **මේද සහ තෙල්** | | | | | |
| පාම් තෙල් | මෙ.ටො./ ඩොලර් | 1,276 | 886 | 905 | 825 |
| සෝයා පිටි | මෙ.ටො./ ඩොලර් | 548 | 541 | 480 | 460 |
| සෝයා බෝංචි | මෙ.ටො./ ඩොලර් | 675 | 598 | 500 | 475 |
| **ධාන්‍ය** | | | | | |
| බඩඉරිඟු | මෙ.ටො./ ඩොලර් | 319 | 253 | 200 | 195 |
| සහල් | මෙ.ටො./ ඩොලර් | 437 | 554 | 595 | 550 |
| තිරිඟු | මෙ.ටො./ ඩොලර් | 430 | 340 | 290 | 295 |
| **අනෙකුත් ආහාර** | | | | | |
| සීනි | කිලෝග්‍රෑමයට ඩොලර් | .40 | .52 | 0.50 | 0.46 |
| **අමුද්‍රව්‍ය** | | | | | |
| කපු | කිලෝග්‍රෑමයට ඩොලර් | 2.86 | .09 | 2.15 | 2.20 |
| රබර් | කිලෝග්‍රෑමයට ඩොලර් | 1.54 | .38 | 1.55 | 1.60 |
| ඉරූ දැව, අරටු සහිත ලී | ඝනමීටරයට ඩොලර් | 675 | 78 | 680 | 690 |
| **ලෝහ සහ ඛනිජ වර්ග** | | | | | |
| ඇලුමිනියම් | මෙ.ටො./ ඩොලර් | 2,705 | 2,256 | 2,300 | 2,400 |
| තඹ | මෙ.ටො./ ඩොලර් | 8,822 | 8,490 | 8,900 | 8,800 |
| නිකල් | මෙ.ටො./ ඩොලර් | 25,834 | 21,521 | 1,700 | 18,000 |

*මූලාශ්‍රය: Commodity Markets Outlook, ලෝක බැංකුව, අප්‍රේල් 2024*

ගෝලීය කාර්මික නිෂ්පාදනය මන්දගාමී වීම හේතුවෙන්, 2023 වසරේ දී භාණ්ඩ වෙළෙඳාමේ පරිමාව සියයට 1.9 කින් සංකෝචනය විය. කෙසේ වෙතත්, 2024 වසරේ දී ගෝලීය වෙළෙඳාම දියුණු වීමේ සළකුණු භාණ්ඩ වෙළෙඳාමේ වැඩිදියුණු වීම් සහ ගෘහස්ථ පරිභෝජනය ඉහළ යාම තුළින් පෙන්නුම් කරයි. විශේෂයෙන්ම, ආසියානු කලාපය තුල තාක්ෂණ අංශයේ අපනයන හේතුවෙන්, 2024-25 කාලය තුළ දී ගෝලීය වෙළෙඳාම වාර්ෂිකව සියයට 3.25 ක අගයක් දක්වා ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.. එසේ වුවද, කලාපීය අර්බුද සහ භූ-දේශපාලන අස්ථාවරත්වයන් මෙම වර්ධනයට අහිතකර ලෙස බලපෑ හැකිය.

උද්ධමනය මැඩලීම සඳහා බොහෝ මහ බැංකු විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතිකයන් ඉහළ නැංවීම, උකස් වෙළෙඳපොළ පිරිවැය වැඩිවීම, ණය ප්‍රතිමූල්‍යකරණය අසීරු වීම, සහ ව්‍යාපාර බංකොලොත්භාවය මෙම අඩු උද්ධමනයට හේතු විය.. කෙසේ වෙතත්, 2024 වසර දෙවන භාගය වන විට, ක්‍රමයෙන් අඩුවනු ඇතැයි පුරෝකථනය කර ඇති උද්ධමනයට සමගාමීව, දියුණු ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති අනුපාතිකයන් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බොහෝ මහ බැංකුවල ප්‍රතිපත්ති අනුපාතිකයන් ඉහළ නැංවීමේ චක්‍ර සම්පූර්ණ වී ඇති අතර සමහරක් මහ බැංකු විසින් ප්‍රතිපත්ති අනුපාතිකයන් ලිහිල් කිරීමට පටන් ගෙන තිබුණද, තවමත් ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ මට්ටමක පවතී. උද්ධමන පුරෝකථනයන් ආශ්‍රිතව පවතින අඛණ්ඩ අවිනිශ්චිතතාවය, ප්‍රධාන දියුණු ආර්ථිකයන්හි ප්‍රතිපත්ති අනුපාතිකයන් ලිහිල් කිරීමේ වේගයට බලපා ඇත. මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීමේ පසු බලපෑම් සහ ඉහළ කෘෂිකාර්මික නිෂ්පාදනය දකුණු ආසියාවේ, අග්නිදිග ආසියාවේ සහ මධ්‍යම ආසියාවේ උද්ධමනය අඩු වීමට ඉවහල් වනු ඇත. නිර්-උද්ධමන ක්‍රියාවලිය සඳහා සහය වීමට රාජ්‍ය මූල්‍ය සංයමයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වනු ඇත.

සමස්තයක් වශයෙන්, 2025 වසරේ දී, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි වීමට පටන් ගැනීම සහ ශ්‍රම වෙළෙඳපොල ලිහිල් වී පරිභෝජනය මධ්‍යස්ථ වීමත් සමඟ ගෝලීය වර්ධනය මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළෙඳ අර්බුද උත්සන්න වීම හේතුවෙන් ආනයනික භාණ්ඩයන්ගේ සැපයුම් දාම පිරිවැය ඉහළයාම මඟින් උද්ධමනය කෙරෙහි බලපාන නුදුරු කාලීන අවදානම් තවදුරටත් ඉහළ යා හැකිය. යුරෝපයේ සහ මැදපෙරදිග ගැටුම් වැනි භූ-දේශපාලනික ගැටළු තීව්‍ර වීමේ අවදානම, මූල්‍ය ස්ථාවරත්වයට තර්ජන එල්ල කරන අතර තවදුරටත් ගෝලීය ආර්ථික දැක්ම කෙරෙහි අවිනිශ්චිතතාවයක් ඇති කළ හැකිය.

# 2 වන පරිච්ඡේදය

# රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා

## 2.1. සමාලෝචනය

රාජ්‍ය ආදායමේ කැපී පෙනෙන වර්ධනය සහ පොලී ගෙවීම් අඩුවීම හේතුවෙන් රජයේ වියදම් අඩුවීමත් සමඟ 2024 වසරේ පළමු භාගයේ දී රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය සැලකිය යුතු ලෙස වර්ධනය විය. ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්නවල ධනාත්මක බලපෑම් පිළිබිඹු කරමින්, 2023 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 30.7 ක් වූ ප්‍රාථමික අතිරික්තයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 543.4 ක ප්‍රාථමික අතිරික්තයක් වාර්තා විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්යාකයක් ලෙස සඳහන් වන රු. බිලියන 140 ක ප්‍රාථමික අතිරික්ත ඉලක්කය, 2024 වසරේ පළමු භාගයේ දී ඉක්මවා යන ලදී. 2023 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 1,242.6 ක් වූ අයවැය හිඟය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 598.7 දක්වා රු. බිලියන 643.9 කින් අඩු විය.

බදු සහ බදු නොවන ආදායම සහ ප්‍රදාන ඇතුළු රජයේ සමස්ත ආදායම එහි වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 4,127.0 න් සියයට 45.2 ක් ලඟා කර ගනිමින් 2023 වසරේ පළමු භාගයේ දී වූ රු. බිලියන 1,317.1 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 41.6 කින් එනම් රු. බිලියන 547.6 කින් රු. බිලියන 1,864.6 දක්වා වර්ධනය විය. බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 3,820 න් සියයට 44.7 ක් ලඟා කර ගනිමින් 2023 වසරේ පළමු භාගයේ දී වූ රු. බිලියන 1,198.9 සිට රු. බිලියන 1,709.3 දක්වා සියයට 42.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2022 සහ 2023 වසරවල දී හඳුන්වා දුන් බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, දේශීය ආදායම් ඉහළ නැංවීමේ පියවරයන් වැඩිදියුණු කිරීම සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු වීම ආදිය ආදායමේ මෙම වර්ධනයට බොහෝ දුරට හේතු විය.

ආදායම් බද්දෙන් ලද ආදායම එහි වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 1,080.0 න් සියයට 41.4 ක් ලඟා කර ගනිමින් 2024 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 447.3 දක්වා සියයට 16.3 කින් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2023 වසරේ පළමු මාස හය තුළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද සහ රඳවා ගැනීමේ බද්ද මඟින් ලද ආදායමට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද ආදායම වැඩි වීමය.

2024 වසරේ පළමු භාගයේ දී භාණ්ඩ හා සේවා මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 1,043.9 ට ලඟා වෙමින් සියයට 60.2 කින් වර්ධනය විය. එකතු කල අගය මත බදු අනුපාත ඉහළ නැංවීම, එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙළීම සහ එකතු කල අගය මත බදු සඳහා බලපැවැත් වූ නිදහස් කිරීම්වලින් බොහොමයක් ඉවත් කිරීම ආදිය හේතුවෙන් එකතු කළ අගය මත බද්ද මඟින් ලද ආදායම ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් ඉවහල් විය. ඛනිජ තෙල් නිෂ්පාදන මත නිෂ්පාදන බද්ද, මත්පැන් මත සුරා බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මඟින් ලද ආදායම ඉහළ යාම මෙම වර්ධනයට හේතු විය.

ආනයන සීමා ක්‍රමිකව ලිහිල් කිරීම හේතුවෙන් ආනයනවල සිදු වූ ඉහළ යාම පිළිබිඹු කරමින් 2023 වසරේ පළමු භාගයේ දී විදේශ වෙළෙඳාම මත බදුවලින් ලද ආදායමට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද ආදායම රු.බිලියන 218.2 දක්වා සියයට 34.2 කින් වර්ධනය විය. සීනි සහ අර්තාපල් වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත ඉහළ නැංවීම හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මඟින් ලද ආදායම රු. බිලියන 45.5 ක් දක්වා සියයට 77 කින් වර්ධනය විය. රේගු ආනයන බද්ද සහ සෙස් බද්ද මඟින් ලද ආදායම පිළිවෙළින් සියයට 54.1 කින් සහ සියයට 48.8 කින් වර්ධනය විය. තෝරාගත් අයිතම මත වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද ඉවත් කිරීම හේතුවෙන් වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද මඟින් ලද ආදායම ඉතා සුළු වශයෙන් සියයට 6.7 කින් පමණක් වර්ධනය විය.

2023 වසරේ පළමු භාගයේ රු. බිලියන 116.0 ක් වූ බදු නොවන ආදායමට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලද බදු ආදායම රු. බිලියන 151.3 දක්වා සියයට 30.4 කින් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම දඩ, ගාස්තු හා අයකිරීම් සහ පොලී ආදායමෙන් ලද ආදායම වර්ධනය වීම හේතු විය.

2024 වසරේ පළමු භාගයේ දී සමස්ත රාජ්‍ය වියදමෙන් සියයට 90 ක් පමණ වූ පුනරාවර්තන වියදම් 2023 වසරේ පළමු භාගයේ දී වූ රු. බිලියන 2,325.5 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,218.4 දක්වා සියයට 4.6 කින් අඩු විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම පොලී වියදම් 2023 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 1,273.3 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු.බිලියන 1,142.1 දක්වා සියයට 10.3 කින් අඩු වීම හේතු විය. මෙම පුනරාවර්තන වියදම් අඩු වීම සඳහා දේශීය ණය ප්‍රශස්තකරණයේ බලපෑම සහ දේශීය පොලී අනුපාත අඩු වීම හේතුවෙන් දේශීය පොලී ගෙවීම් රු. 1,073.7 බිලියන දක්වා සියයට 11.9 කින් අඩු වීම හේතු විය.

වගුව **2.1 :** අයවැය සාරාංශය 2024 ජනවාරි සිට ජූනි දක්වා

රු. මිලියන

| අයිතමය | 2023 | 2024 (තාවකාලික) |
|---|---|---|
| **ආදායම් හා ප්‍රදාන** | **1,317,053** | **1,864,607** |
| **ආදායම** | **1,314,886** | **1,860,632** |
| බදු ආදායම | 1,198,852 | 1,709,305 |
| බදු නොවන ආදායම | 116,034 | 151,327 |
| ප්‍රදාන | 2,167 | 3,975 |
| **වියදම** | **2,559,619** | **2,463,305** |
| **පුනරාවර්තන** | **2,325,541** | **2,218,442** |
| පොලී ගෙවීම් | 1,273,291 | 1,142,105 |
| අනෙකුත් | 1,052,250 | 1,076,337 |
| රාජ්‍ය ආයෝජන | 258,812 | 258,306 |
| අනෙකුත් | -24,734 | -13,443 |
| **ආදායම් අතිරික්තය (+)/ හිඟය (-)** | **-1,010,655** | **-357,810** |
| **සමස්ත අයවැය අතිරික්තය(+)/හිඟය (-)** | **-1,242,566** | **-598,698** |
| **මූල්‍යනය** | **1,242,566** | **598,698** |
| **විදේශීය මූල්‍යනය** | **23,950** | **82,885** |
| ණය ගැනීම් | 192,500 | 167,131 |
| ණය ආපසු ගෙවීම් | -168,550 | -84,246 |
| දේශීය මූල්‍යනය | 1,218,616 | 515,814 |
| ණය ගැනීම් | 9,763,117 | 5,202,159 |
| ණය ආපසු ගෙවීම් | -8,544,501 | -4,686,346 |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

කෙසේ වුවද, 2024 වසරේ ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ජීවන වියදම් දීමනාව ඉහළ නැංවීම හේතුවෙන් වැටුප් හා වේතන මත වියදම් රු. බිලියන 480.3 දක්වා සියයට 4.4 කින් වැඩි වීම සහ භාණ්ඩ හා සේවා මත වියදම් රු.බිලියන 146.7 දක්වා සියයට 7.5 කින් ඉහළ යාම හේතුවෙන් 2024 වසරේ පළමු භාගයේ දී පොලී නොවන පුනරාවර්තන වියදම් සියයට 2.3 කින් වර්ධනය විය.

2023 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 455.8 ක් වූ සහනාධාර සහ පැවරුම් 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 449.3 දක්වා සියයට 1.4 කින් සුළු වශයෙන් අඩු විය.

ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් 2023 වසරේ පළමු භාගයේ දී රු.බිලියන 234.1 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 244.9 දක්වා සියයට 4.6 කින් වර්ධනය විය. මෙය ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා වූ ප්‍රාග්ධන වියදම් ඉහළ යාම මඟින් පිළිඹිබු වේ. කෙසේ වුවද, රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන සහ රජයේ සංස්ථාපිත ආයතන සඳහා වන පැවරුම් අඩු විය.

වගුව **2.2 :** ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම 2024 ජනවාරි සිට ජූනි දක්වා

රු. බිලියන

| අයිතමය | ඇස්තමේන්තුගත (වාර්ෂික) | තත්‍ය (ජන.-ජූනි) (තාවකාලික) | සාධනය (%) |
|---|---|---|---|
| මුළු ආදායම | **4,107** | **1,861** | **45.3** |
| බදු ආදායම | 3,820 | 1,709 | 44.7 |
| බදු නොවන ආදායම | 287 | 151 | 52.7 |
| මුළු වියදම | **6,978** | **2,463** | **35.3** |
| වර්තන වියදම | 5,277 | 2,218 | 42.0 |
| ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම් | 1,701 | 245 | 14.4 |

*මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

## 2.2 රාජ්‍ය ආදායම

බදු ආදායම 2023 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ රු. බිලියන 1,198.9 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 1,709.3 දක්වා සියයට 42.6 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන්ම හේතු කොට ගෙන, ප්‍රදාන රහිතව සමස්ත රාජ්‍ය ආදායම 2023 වසරේ පළමු භාගයේ දී වූ රු. බිලියන 1,314.9 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,860.6 දක්වා සියයට 41.5 කින් වැඩි විය.

බදු අදායම ඉහළ යාමට:

1. 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම, 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු බදු ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60 ක් දක්වා අඩු කිරීම, 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්වලින් වැඩි ප්‍රමාණයක් ඉවත් කිරීම සහ 2023 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ආනයන සියයට 6.4 කින් වැඩි වීම හේතුවෙන් එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම සියයට 85.4 කින්, එනම් රු. බිලියන 284.3 කින් වැඩි වීම;
2. 2023 වසරේ පළමු මාස හතරට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඛනිජ තෙල් ආනයනය සියයට 115.7 කින් ඉහළ යාම සහ 2023 වසරේ ජූනි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙට්‍රල් සහ ඩීසල් මත බදු අනුපාත ලීටරයක් සඳහා රුපියල් 25 කින් වැඩි කිරීම හා 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඩීසල් සඳහා ලීටරයකට රු. 6 කින් සහ පෙට්‍රල් සඳහා ලීටරයකට රු. 5 කින් අඩු කිරීම සමඟ නිෂ්පාදන බදු අනුපාතවල ශුද්ධ වැඩි වීම හේතුවෙන් ඛනිජ තෙල් මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම සියයට 200.8 කින් එනම් රු. බිලියන 64.7 කින් වැඩි වීම;
3. 2023 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලද, එහෙත් ආදායමෙහි වැඩි වීම 2023 වසරේ පෙබරවාරි මාසයේ දී සිට පිළිබිඹු වූ බදු ප්‍රතිපත්ති සංශෝධනවල සම්පූර්ණ බලපෑම, රාජ්‍ය අංශයේ සහ අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීම (2024 ජූනි මාසයේ දී රාජ්‍ය අංශයේ සහ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් අනුපාත දර්ශකවල වාර්ෂික ලක්ෂ්‍යමය වැඩිවීම පිළිවෙළින් සියයට 21.2 සහ සියයට 5.9 ක් විය), සංස්ථාපිත සහ පුද්ගලික ආදායම බදු මත ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනය වීමේ හා ආර්ථික වර්ධනයට නැවත එළඹීමේ බලපෑම හේතුවෙන් ආදායම් බද්දෙන් ලද ආදායම සියයට 16.3 කින්, එනම් රු. බිලියන 62.8 කින් වැඩිවීම;
4. සීනි සහ අර්තාපල් සඳහා කිලෝග්‍රෑමයකට රු. 50 ක් දක්වා බදු අනුපාත ඉහළ නැංවීම සහ ප්‍රධාන වෙළෙඳ භාණ්ඩවල ආනයන පරිමාව වැඩිවීම හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම සියයට 77.0 කින්, එනම් රු. බිලියන 19.8 කින් වැඩි වීම;
5. 2023 වසරේ ජූලි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බදු අනුපාත සංශෝධනවල සම්පූර්ණ බලපෑම, 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බද්ද උද්ධමනයට අනුකූලව දර්ශක ගත කිරීම සහ නිෂ්පාදන බදු අනුපාත සියයට 14 කින් වැඩි කිරීම හේතුවෙන් සුරා බද්දෙන් ලද ආදායම සියයට 22.3 කින්, එනම් රු. බිලියන 18.1 කින් වැඩි වීම;
6. 2023 වසරේ මාර්තු මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රේගු ආනයන බදු අනුපාත සියයට 0:10:15 සිට සියයට 0:15:20

දක්වා ඉහළ නැංවීම සහ ආනයන වැඩිවීම හේතුවෙන් රේගු ආනයන බද්දෙන් ලද ආදායම සියයට 54.1 කින් එනම් රු. බිලියන 17.1 කින් වැඩි වීම;

7. 2024 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ලියාපදිංචි වීමේ සීමාව වසරකට රු. මිලියන 120 සිට වසරකට රු. මිලියන 60 ක් දක්වා අඩු කිරීම හේතුවෙන් බදු ගෙවන්නන් සංඛ්‍යාව වැඩි වීම සහ ආනයන වැඩිවීමේ බලපෑම හේතුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම සියයට 15.3 කින්, එනම් රු. බිලියන 15.9 කින් වැඩි වීම; සහ

8. ආනයනය වැඩිවීම හේතුවෙන් සෙස් බද්දෙන් ලද ආදායම සෙස් බද්ද සියයට 53.7 කින්, එනම් රු. බිලියන 13.2 කින් වැඩි වීම හේතු විය.

2024 වසරේ පළමු මාස හය තුළ දී බදු නොවන ආදායම ආදායම සියයට 30.4 කින් එනම් රු. බිලියන 35.3 කින් ඉහළ යාම ද, ආදායම වැඩි වීම සඳහා දායක විය. දඩ, අයකිරීම් හා ගාස්තු මඟින් ලද ආදායම රු. බිලියන 20.0 කින් ද, පොළී ආදායම රු. බිලියන 17.2 කින් ද, ඉහළ යාම මේ සඳහා හේතු විය.

### බදු ආදායම

රු. බිලියන 1,709.3 ක් වූ බදු ආදායම, ප්‍රදාන රහිත රාජ්‍ය ආදායමෙන් සියයට 91.9 ක් විය. එකතු කළ අගය මත බද්දෙහි හා විදේශ වෙළඳාම මත බදුවල ආදායමේ වර්ධනයත් සමඟ, බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස සෘජු බදු ආදායම 2023 වසරේ පළමු මාස හය තුළ වාර්තා වූ සියයට 32.1 ට සාපේක්ෂව, 2024 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී සියයට 26.1 ක් දක්වා අඩු විය. රු. බිලියන 3,820.0 ක් වූ ඇස්තමේන්තුවෙන් සියයට 44.7 බදු ආදායමක් 2024 වසරේ පළමු මාස හය තුළ දී ළඟා කර ගන්නා ලදී.

**වගුව 2.3 : ඇස්තමේන්තුගත සහ තත්‍ය බදු ආදායම 2024 ජනවාරි සිට ජූනි දක්වා**

රු. බිලියන

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුව | තත්‍ය (ජන.-ජූනි) (තාවකාලික) |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | | |
| ආදායම් සහ ලාභ මත බදු | 1,080 | 447 |
| එකතු කළ අගය මත බදු - දේශීය | 740 | 353 |
| ජාතිය ගොඩනැගීමේ බදු | – | 0.1 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 195 | 91 |
| **උප එකතුව** | **2,015** | **892** |
| රේගු දෙපාර්තමේන්තුව | | |
| ආනයන බදු | 175 | 49 |
| එකතු කළ අගය මත බදු - ආනයන | 660 | 264 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 55 | 28 |
| ජාතිය ගොඩනැගීමේ බදු | - | 0.0 |
| වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 175 | 86 |
| සෙස් ආනයන / අපනයන | 60 | 38 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 95 | 46 |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු | 313 | 183 |
| දුම්වැටි | 143 | 53 |
| ඛනිජ තෙල් | 135 | 97 |
| මෝටර් වාහන සහ අනෙකුත | 35 | 33 |
| **උප එකතුව** | **1,533** | **693** |
| සුරා බදු දෙපාර්තමේන්තුව | | |
| මත්පැන්/දුම්කොළ | 232 | 100 |
| **උප එකතුව** | **232** | **100** |
| අනෙකුත් | | |
| විදුලි සංදේශ බද්ද | 19 | 9 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 22 | 16 |
| **උප එකතුව** | **40** | **25** |
| මුළු බදු ආදායම | **3,820** | **1,709** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*


**වගුව 2.4 :** රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය 2024 ජනවාරි සිට ජූනි දක්වා

රු. මිලියන

| අයිතමය | 2023 | 2024 | වර්ධනය % |
|---|---|---|---|
| **බදු ආදායම** | **1,198,852** | **1,709,305** | **42.6** |
| ආදායම් බදු | 384,463 | 447,252 | 16.3 |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | 461,570 | 600,369 | 30.1 |
| එකතු කළ අගය මත බදු | 235,887 | 353,392 | 49.8 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 79,980 | 91,187 | 14.0 |
| නිෂ්පාදන බදු | 145,674 | 155,696 | 6.9 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 30 | 95 | 216.7 |
| ආනයන මත පදනම් වූ බදු | 335,370 | 636,470 | 89.8 |
| රේගු බදු | 31,631 | 48,758 | 54.1 |
| එකතු කළ අගය මත බදු | 96,806 | 263,552 | 172.2 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 155 | 3 | -98.1 |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 80,612 | 85,992 | 6.7 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 25,709 | 45,500 | 77.0 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 23,449 | 28,115 | 19.9 |
| නිෂ්පාදන බදු | 52,338 | 126,636 | 142.0 |
| සෙස් | 24,670 | 37,914 | 53.7 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 17,449 | 25,214 | 44.5 |
| **බදු නොවන ආදායම** | **116,034** | **151,327** | **30.4** |
| **මුළු ආදායම** | **1,314,886** | **1,860,632** | **41.5** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**රූප සටහන 2.1:** රජයේ ආදායම් සංයුතිය 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා




*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### ආදායම් බදු

ආදායම් බදු මඟින් ලද ආදායම 2023 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ රු. බිලියන 384.5 ට සාපේක්ෂව, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 447.3 ක් දක්වා සියයට 16.3 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. පසුගිය වසරේ ජනවාරි මස 01 වැනි දින සිට පුද්ගල ආදායම් බදු සහ සංස්ථාපිත ආදායම් බදු, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ රඳවාගැනීමේ බදු සම්බන්ධයෙන් ද බදු පරිපාලනය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ද ගනු ලැබූ ප්‍රතිපත්තිමය වෙනස්කම්වල පූර්ණ බලපෑම මෙම වසර තුළ දී තහවුරු වීම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය.

පුද්ගල ආදායම් බද්ද මඟින් ලද ආදායම 2023 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ රු. බිලියන 15.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 22.4 දක්වා සියයට 43.2 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, සංස්ථාපිත බදු ආදායම ද රු. බිලියන 230.9 සිට රු. බිලියන 237.4 දක්වා සියයට 2.8 කින් වර්ධනය විය. එසේම, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද මඟින් ලද ආදායම ද රු. බිලියන 69.7 සිට රු. බිලියන 100.2 දක්වා සියයට 43.7 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. පොළිය මත රඳවා ගැනීමේ බද්දෙන් ලැබුණු ආදායම ද රු. බිලියන 68.1 සිට රු. බිලියන 87.1 දක්වා සියයට 27.8 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

**වගුව 2.5 : ආදායම් බදු කාර්යසාධනය 2024 ජනවාරි සිට ජූනි දක්වා**

රු. මිලියන

| බදු පදනම | 2023 | 2024 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 246,520 | 259,742 | 5.4 |
| උපයන විට ගෙවීම් | 69,735 | 100,177 | 43.7 |
| ආර්ථික සේවා ගාස්තු | 75 | 237 | 214.9 |
| රඳවා ගැනීමේ බද්ද | 68,132 | 87,096 | 27.8 |
| **එකතුව** | **384,463** | **447,252** | **16.3** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

තනි පුද්ගල බදු ගෙවන්නන්ගේ ගණුදෙනු පිළිබඳ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා මූල්‍ය ආයතනවල බැඳීමක් ඇති කිරීම, පුද්ගල ආදායම් බදු ගෙවන්නන් සඳහා ඉලෙක්ට්‍රොනික බදු ගොනු විවෘත කිරීම අනිවාර්යය කිරීම, මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ වැඩිපුර ගෙවූ මුදල් ආපසු ගෙවීම කඩිනම් කිරීම, මුදලින් කෙරෙන ගණුදෙනු අධෛර්යමත් කිරීමේ අරමුණින් එක් දිනක් තුල දී හෝ තනි ගණුදෙනුවක දී හෝ එක් අවස්ථාවක දී හෝ රු. 500,000 හෝ ඊට වැඩි එකතුවක් ලෙස වන ගණුදෙනු බදු අරමුණු සඳහා වියදම් ලෙස අඩු කිරීමට ඉඩ නොදීම සහ රාජ්‍ය ආයතන ඇතුළු පුද්ගලයන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත නිතිපතා තොරතුරු හුවමාරු කරගැනීම සඳහා රෙගුලාසියක් නිකුත් කිරීම ආදී බදු පරිපාලනය ශක්තිමත් කිරීම උදෙසා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ එලෙස බදු ආදායම එකතු කිරීමේ කැපී පෙනෙන වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

### එකතු කළ අගය මත බද්ද

එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම නාමික වශයෙන්, 2023 වසරේ පළමු භාගයේ දී වූ රු. බිලියන 332.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 616.9 ක් දක්වා සියයට 85.4 කින් සැළකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර, එය 2024 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 44.1 ක ලඟාකර ගැනීමකි. 2024 වසරේ පළමු භාගයේ දී දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 353.4 ක් දක්වා සියයට 49.8 කින් වර්ධනය වූ අතර, ආනයන මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 263.6 දක්වා සියයට 172.2 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය.

**වගුව 2.6 : එකතු කළ අගය මත බදු කාර්යසාධනය 2024 ජනවාරි සිට ජූනි දක්වා**

රු. මිලියන

| බදු පදනම | 2023 | 2024 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| දේශීය | 235,887 | 353,392 | 49.8 |
| ආනයන | 96,806 | 263,552 | 172.2 |
| **ශුද්ධ ආදායම** | **332,692** | **616,944** | **85.4** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### නිෂ්පාදන බදු

ප්‍රධාන වශයෙන්ම ඛණිජ තෙල්, මත්පැන්, මෝටර් වාහන සහ අනෙකුත් නිෂ්පාදන බදු අයකළ හැකි අයිතමයන්ගෙන් ලද ආදායම ඉහළ යාම හේතුවෙන් දුම්වැටිවලින් ලද ආදායමේ අඩුවීමක් තිබුණ ද නිෂ්පාදන බදු මඟින් ලද ආදායම 2023 වසරේ අදාළ කාල සීමාවේ දී උපයන ලද රු. බිලියන 198 ට සාපේක්ෂව 2024 වසරේ පළමු මාස 6 තුළ දී රු. බිලියන 282.3 ක් දක්වා සියයට 42.5 කින් ඉහළ ගියේය. නිෂ්පාදන බදු ආදායම, වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 51.8 ක තත්‍ය අගයක් ලඟාකර ගනිමින් බදු ආදායමෙන් සියයට 16.5 කට සහ සමස්ත ආදායමෙන් සියයට 15.1 කට දායක විය.

2023 වසරේ ජූනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉන්ධන ලීටරයක් මත රු. 25 ක නිෂ්පාදන බද්දක් පැනවීම සහ 2024 වසරේ ජනවාරි මස 01 වැනි දින සිට ඩීසල් ලීටරයක් මත පනවා තිබූ නිෂ්පාදන බද්ද රු. 6 කින් සහ පෙට්‍රල් ලීටරයක් මත පනවා තිබූ නිෂ්පාදන බද්ද රු. 5 කින් අඩු කිරීම හේතුවෙන් ඉන්ධන සඳහා වූ නිෂ්පාදන බද්දේ ශුද්ධ වැඩිවීම මත හා ඉන්ධන කෝටා ක්‍රමය ඉවත් වීමත් සමඟ ආනයන වැඩිවීම හා 2024

වසරේ පළමු කාර්තුවේ වාර්තාකළ ආර්ථික වර්ධනයත් සමඟ ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන මඟින් ලද ආදායම 2023 වසරේ පළමු මාස 6 තුළ වාර්තා කළ රු. බිලියන 32.2 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 96.9 ක් දක්වා සියයට 200.8 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය.

මත්පැන් මත සුරාබද්ද මඟින් ලද ආදායම 2023 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ රු. බිලියන 81.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 99.1 දක්වා සියයට 22.3 කින් වර්ධනය වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බදු අනුපාත සියයට 14 කින් වැඩි කිරීමය. කෙසේ වෙතත්, සමස්ත මත්පැන් නිෂ්පාදනය 2023 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ නිරපේක්ෂ ලීටර් මිලියන 17.5 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී නිරපේක්ෂ ලීටර් මිලියන 15.9 ක් දක්වා සියයට 9 කින් අඩු විය. දේශීයව නිෂ්පාදනය කරන ලද සැර මත්පැන් මත නිෂ්පාදන බද්ද මඟින් ලද ආදායම 2023 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ රු. බිලියන 54.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 61.9 ක් දක්වා සියයට 13 කින් වර්ධනය විය. කෙසේ වුවද, සකේ සහ බිර මත නිෂ්පාදන බද්දෙන් එකතු කරන ලද ආදායම පිළිවෙළින් සියයට 40 සහ සියයට 84 දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය විය. 2024 වසරේ පළමු භාගය තුළ මත්පැන් මත සුරාබද්ද මඟින් ලද ආදායම ඇස්තමේන්තුගත මුළු ආදායමෙන් සියයට 43.1 කි.

**වගුව 2.7 : නිෂ්පාදන බදු/සුරාබදු ආදායම් කාර්යසාධනය 2024 ජනවාරි සිට ජූනි දක්වා**

රු. මිලියන

| බදු පදනම | 2023 | 2024 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|
| මත්පැන් | 81,020 | 99,116 | 22.3 |
| දුම්වැටි හා දුම්කොළ | 62,778 | 53,624 | -14.6 |
| මෝටර් වාහන | 20,098 | 29,649 | 47.5 |
| ඛනිජ තෙල් | 32,240 | 96,987 | 200.8 |
| අනෙකුත් | 1,876 | 2,956 | 57.6 |
| **එකතුව** | **198,012** | **282,331** | **42.6** |


*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

විදෙස්ගත ශ්‍රමිකයින්ට විද්‍යුත් මෝටර් රථ ආනයනය කිරීම සඳහා ඉඩ සැලැස්වීම පිණිස ක්‍රමවේදයක් සැකසීම වැනි වාහන ආනයනය සඳහා පනවා තිබූ සීමා යම් තරමකට ලිහිල් කිරීම හේතුවෙන් මෝටර් වාහනවලින් ලද නිෂ්පාදන බදු 2023 වසරේ පළමු මාස 6 තුළ වාර්තා කළ රු. බිලියන 20.1 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 29.6 ක් දක්වා සියයට 47.5 කින් වර්ධනය විය.

තවද, ආනයන සීමාවන් ලිහිල් කිරීමේ බලපෑම පිළිඹිබු කරමින් මේද අම්ල සහිත නිෂ්පාදන, සීනි සහ සීනි ආශ්‍රිත රසකැවිලි නිෂ්පාදන, සිමෙන්ති, යාන්ත්‍රික උපකරණ සහ බදු අයකළ හැකි අනෙකුත් අයිතමයන්ගෙන් උපයාගත් නිෂ්පාදන බදු ආදායම 2023 වසරේ පළමු මාස 6 තුළ වාර්තා කළ රු. බිලියන 1.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2.9 දක්වා සියයට 57.6 කින් වැඩි විය.

කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය අනුව දුම්වැටිවල මිල ගැලපීම සඳහා සියළුම දුම්වැටි වර්ගවලට අදාළ නිෂ්පාදන බද්ද 2024 වසරේ ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 14 කින් ඉහළ දැමුව ද දුම්වැටිවලින් ලද ආදායම 2023 වසරේ පළමු මාස 6 තුළ වාර්තා කළ රු. බිලියන 62.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 53.6 දක්වා සියයට 14.6 කින් පහළ ගියේය. 2024 වසරේ පළමු මාස 6 තුළ දුම්වැටිවලින් ලද නිෂ්පාදන බදු ආදායම අඩුවීම සඳහා බදු වැඩි වීමත් සමඟ දුම්වැටි මිල ඉහළ දැමීමේ ප්‍රතිඵලයක් ලෙස විකුණුම් පහත වැටීම (දිග මි.මි. 60 සිට මි.මි. 67 දක්වා කාණ්ඩයේ හැර) බලපාන ලදී.

**රූපසටහන 2.2: නිෂ්පාදන බදු කාර්යසාධනය 2023 සහ 2024 ජනවාරි සිට ජූනි දක්වා**




*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

## වෙනත් බදු

අනෙකුත් බදුවලින් උපයාගත් ආදායම, 2023 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා කරන ලද රු. බිලියන 283.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 362.8 ක් දක්වා සියයට 27.9 කින් වර්ධනය විය.

රේගු ආනයන බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා වූ රු. බිලියන 31.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 48.8 ක් දක්වා වර්ධනය වූ අතර, 2023 වසරේ තුන්වන කාර්තුව වන විට ආනයන සීමා ලිහිල් කිරීම සහ රේගු ආනයන බදු අනුපාත ඉහළ නැංවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය.

සෙස් බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා වූ රු. බිලියන 24.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 37.9 ක් දක්වා සියයට 53.7 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, 2023 වසරේ තුන්වන කාර්තුව වන විට ආනයන සීමා ලිහිල් කිරීම මෙයට හේතුවිය. ඒ අනුව, ආනයන මත පනවන ලද සෙස් බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා වූ

රු. බිලියන 23.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 36.9 ක් දක්වා සියයට 56.2 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. මේ අතර, විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීමේ බලපෑම හේතුවෙන්, අපනයන මත පනවන ලද සෙස් බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා වූ රු. බිලියන 1.1 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1.0 ක් දක්වා සියයට 2.0 කින් සුළු වශයෙන් අඩු විය. 2024 වසරේ පළමු මාස හය තුළ දී උපයන ලද සෙස් බදු ආදායම, 2024 වසර සඳහා වන වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 60.0 න් සියයට 63.2 ක් නියෝජනය කරයි.

2023 වසරේ අප්‍රේල් මාසයේ දී අයිතම 1,631 ක් සහ 2024 වසරේ ජනවාරි මාසයේ දී අයිතම 26 ක් ක්‍රමානුකූලව ඉවත් කළ නමුදු, 2023 වසරේ තුන්වන කාර්තුව වන විට ආනයන සීමා ලිහිල් කිරීම හේතුවෙන්, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා වූ රු. බිලියන 80.6 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 86.0 දක්වා සියයට 6.7 කින් වර්ධනය විය. 2024 වසරේ පළමු මාස හය තුළ දී උපයන ලද වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු ආදායම, 2024 වසර සඳහා වන වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 175 න් සියයට 49.1 ක් නියෝජනය කරයි.

විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් උපයන ලද ආදායම රු. බිලියන 45.5 ක් දක්වා සියයට 77.0 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, 2023 වසරේ තුන්වන කාර්තුව වන විට ආනයන සීමා ලිහිල් කිරීම, සහ සීනි සහ අර්තාපල් සඳහා බද්ද ඉහළ නැංවීම මෙයට හේතුවිය.

සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා වූ රු. බිලියන 103.4 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 119.3 ක් දක්වා සියයට 15.3 කින් වර්ධනය වූ අතර, ආනයන සහ දේශීය ක්‍රියාකාරකම් යන දෙඅංශයෙන්ම ආදායම ඉහළ යාම මේ සඳහා හේතුවිය. එසේම, විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම, 2023 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා වූ රු. බිලියන 8.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 8.8 ක් දක්වා සියයට 7.3 කින් වර්ධනය විය.

### බදු නොවන ආදායම

බදු නොවන ආදායම, ප්‍රධාන වශයෙන් දඩ, ගාස්තු සහ අය කිරීම්වලින් සහ පොලී ආදායමෙන් ලැබෙන ආදායම වැඩිවීම හේතුවෙන් 2023 වසරේ පළමු භාගය තුළ වූ රු. බිලියන 116.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 151.3 දක්වා සියයට 30.4 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. දඩ, ගාස්තු සහ අය කිරීම්වලින් ලද ආදායම 2023 වසරේ පළමු භාගය තුළ වූ රු. බිලියන 59.3 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 79.3 දක්වා සියයට 33.6 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. ඒ අනුව, සමස්ත බදු නොවන ආදායමෙන් සියයට 52.4 කට දායකත්වයක් ලබාදෙමින් දඩ, ගාස්තු සහ අයකිරීම්වලින් එකතු කරන ලද ආදායම බදු නොවන ආදායමේ ප්‍රධාන මූලාශ්‍රය බවට පත් විය. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් පරිපාලනය කරන ලද ගාස්තු සහ අය කිරීම් වැඩි කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. එමෙන්ම, පොලී ආදායම 2023 වසරේ පළමු භාගය තුළ වූ රු. බිලියන 6.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 23.4 දක්වා සියයට 276.8 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. රජය සතු ව්‍යවසායයන්ගෙන් ලද ලාභ සහ ලාභාංශ ලැබීම් ද 2023 වසරේ පළමු භාගය තුළ වූ රු. බිලියන 13.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 14.9 දක්වා සියයට 8.6 කින් වැඩි වූ අතර, සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලැබෙන ආදායම 2023 වසරේ පළමු භාගය තුළ ලද රු. බිලියන 17.4 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 19.8 දක්වා සියයට 13.9 කින් වැඩි විය. කුලී ආදායමෙන් ලද ආදායම 2023 වසරේ පළමු භාගය තුළ වූ රු. බිලියන 2.8 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3.2 දක්වා සියයට 13.0 කින් වැඩි විය. 2024 වසරේ පළමු භාගය තුළ ලද බදු නොවන ආදායම ඇස්තමේන්තුගත වාර්ෂික බදු නොවන ආදායම වූ රු. බිලියන 287.0 න් සියයට 52.7 ක ළඟා කර ගන්නා ලදී.

වගුව 2.8 රාජ්‍ය ආදායමේ විචලතා විශ්ලේෂණය

රු. බිලි

| අයිතමය | 2023 ජනවාරි-ජුනි | 2024 ඇස්තමේන්තුව | 2024(අ) ජනවාරි-ජුනි | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| ආදායම් බදු | 384.5 | 1,080.0 | 447.3 | ආදායම් බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 41.4 ක් ලඟා කරගෙන ඇති අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත.<br><br>- 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති සංශෝධනයන්හී සම්පූර්ණ බලපෑම 2024 වර්ෂයේ මුල් මාස හය තුළ දී ලබා ගැනීම<br>- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ඉහළ යාම<br>- ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම |
| එකතු කල අගය මත බද්ද | 332.7 | 1,400.0 | 616.9 | එකතු කළ අගය මත බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 44.1 ක් ලගා කරගෙන ඇත. මෙම ලගාකරගැනීම සඳහා පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.<br><br>- එකතු කළ අගය මත බදු අනුපාතය ඉහළ දැමීම<br>- එකතුකළ අගය මත වූ බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත දැමීම<br>- වැට් බදු නිදහස් කිරීම්වලින් වැඩි ප්‍රමාණයක් ඉවත් කිරීම සහ<br>- ආනයන සියයට 6.4 කින් ඉහළයාම |
| නිෂ්පාදන/ සුරා බදු | 198.0 | 545.0 | 282.3 | නිෂ්පාදන බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 51.8 ක් ලඟාකරගෙන ඇති අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපාන ලදී.<br><br>- සියලු වර්ගවල පෙට්‍රල් සහ ඩීසල් ආනයනය කිරීමේ දී අදාළ වන නිෂ්පාදන බදු අනුපාත ශුද්ධ වශයෙන් වැඩි වීම සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය සියයට 5.3 කින් වැඩි වීම හේතුවෙන් ඛනිජ තෙල් මත වූ නිෂ්පාදන බදු ආදායම වැඩිවීම; නිශ්චිත යෝජනා ක්‍රමයන් යටතේ මෝටර් වාහන ආනයනය වැඩිවීමත් සමඟ මෝටර් රථ වාහන සඳහා වන නිෂ්පාදන බදු ආදායම ඉහළයාම; සහ 2023 වසරේ ජූලි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද සුරාබදු අනුපාත සංශෝධනයන්හී සම්පූර්ණ බලපෑම සහ උද්ධමනයට ගැලපෙන පරිදි සුරාබදු අනුපාත ගැලපීම හේතුවෙන් මත්පැන් සඳහා වන සුරාබදු ආදායම ඉහළයාම. |
| ආනයන බදු | 31.6 | 175.0 | 48.8 | ආනයන බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 27.9 ක් ලඟාකරගෙන ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් ;<br><br>- ආනයන බදු ඉහළ දැමීමේ සමස්ත බලපෑම මුල් මාස හය තුල ලඟාකරගැනීම හා<br><br>- 2024 වර්ෂයේ මුල් මාස හය තුළ සමස්ත ආනයන සියයට 6.4 කින් වැඩි වීම බලපාන ලදී. |
| වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්ද | 80.6 | 175.0 | 86.0 | වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බදු ආදායම වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 49.1 ක් ලඟා කර ගැනීමට සමත් වී ඇති අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපාන ලදී.<br><br>- වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බදු ක්‍රමිකව ඉවත් කිරීමේ එක් අදියරක් ලෙස 2023 වර්ෂයේ අප්‍රේල් හතර වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්දට යටත් වන අයිතමවලින් සියයට 20 ක් නිදහස් කිරීම සහ<br><br>- 2024 වසරේ මාර්තු මස 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව සිංගප්පූරුවෙන් භාණ්ඩ ආනයනය කරනු ලබන අවස්ථාවේ දී භාණ්ඩ වර්ග 595 ක් වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්දෙන් ඉවත් කිරීම හා තවත් භාණ්ඩ වර්ග 3,117 ක් සඳහා සහනදායී අනුපාත හඳුන්වා දීම. |

රු. බිලි

| අයිතමය | 2023 ජනවාරි-ජුනි | 2024 ඇස්තමේන්තුව | 2024(අ) ජනවාරි-ජුනි | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 25.7 | 95.0 | 45.5 | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 47.9 ක් ලඟා කර ගැනීමට සමත් වී ඇති අතර, මේ සඳහා<br><br>- අර්තාපල් හා සීනි සඳහා වූ බදු අනුපාත ඉහළ දැමීම හා<br>- ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ ආනයන ඉහළ යාම බලපාන ලදී. |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 103.4 | 250.0 | 119.3 | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින් ලද ආදායම වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 47.7 ක් ලඟා කර ගැනීමට සමත් වී ඇති අතර, මේ සඳහා<br><br>- 2024 වසරේ ජනවාරි මස පළමුවන දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වර්ෂයකට රුපියල් මිලියන 120 සිට වර්ෂයකට රුපියල් මිලියන 60 දක්වා පහත දැමීම හේතුවෙන් බදු ගෙවන්නන් ප්‍රමාණය වැඩිවීම සහ<br><br>- 2024 වසරේ මුල් මාස හය තුළ ආනයන ඉහළ යාමේ බලපෑම හේතු විය. |
| වෙනත් බදු | 42.3 | 100.0 | 63.2 | අනෙකුත් බදු මගින් ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 63.7 ක් ලඟා කර ගැනීමට සමත් වී ඇති අතර මේ සඳහා;<br><br>- ආනයන ඉහළයාම හේතුවෙන් සෙස් බදු මගින් ලද ආදායම සියයට 63.2 කින් වැඩිවීම;<br>- විදුලි සංදේශ බද්ද මගින් ලද ආදායම සියයට 47.6 කින් වැඩිවීම; සහ<br>- අනෙකුත් බදු මගින් ලද ආදායම සියයට 76.3 කින් වැඩිවීම හේතු විය. |
| බදු නොවන ආදායම | 116.0 | 287.0 | 151.3 | පොලී ආදායම, කුලී, දඩ, අයකිරීම් හා ගාස්තු, රාජ්‍ය ව්‍යාපාර මඟින් ලැබෙන ලාශ හා ලාභාංශ ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන බදු නොවන ආදායම් මඟින් ලද ආදායම සියයට 30.4 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.<br><br>ඒ අනුව 2024 වසරේ පළමු මාස හය තුළ බදු නොවන ආදායම මඟින් ලද ආදායම 2024 වසරේ ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 52.7 ක් ලඟාකරගෙන ඇත. |
| එකතුව | **1,314.9** | **4,107.0** | **1,860.6** | |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

**විශේෂ සටහන 2.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2024 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා**

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| 2024.04.01 | 2024.03.21 දිනැති අංක 2376/25 දරන ගැසට් නිවේදනය<br><br>- රාජ්‍ය ආයතන ඇතුළු පුද්ගලයන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (CGIR) වෙත නිතිපතා ලබාදිය යුතු තොරතුරු නියම කිරීම. |
| **2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත** | |
| 2024.01.12 | 2024.01.12 දිනැති අංක 2366/33 දරන ගැසට් නිවේදනය<br><br>- 2022 අංක 1 දරන කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර රෙගුලාසියේ 5 වැනි වගන්තියට ආදේශ කිරීම සහ එහි දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු ව්‍යුහයන් සංශෝධනය කරමින් II වන උපලේඛනයක් ඇතුළත් කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2024.02.02 | 2024.02.02 දිනැති අංක 2369/42 දරන ගැසට් නිවේදනය<br><br>- රෙගුලාසියෙහි II උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු හා සම්බන්ධ ආයෝජන තිර්ණායක සංශෝධනය කිරීම. |
| 2024.04.22 | 2024.04.22 දිනැති අංක 2381/16 දරන ගැසට් නිවේදනය<br><br>- 2024 ජනවාරි 12 දිනැති අංක 2366/33 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සහ 2024 පෙබරවාරි 02 දිනැති අංක 2369/42 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සිංහල පරිවර්තන දෝෂ සංශෝධනය කිරීම. |
| 2024.05.29 | 2024.05.29 දිනැති අංක 2386/09 දරන ගැසට් නිවේදනය<br><br>- රෙගුලාසියෙහි II උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු හා සම්බන්ධ ආයෝජන තිර්ණායක සංශෝධනය කිරීම. |
| **සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත** | |
| 2024.01.01 | 2024 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව (සංශෝධන) බදු පනත<br><br>- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීම. |
| **එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** | |
| 2024.01.01 | 2023.12.19 දිනැති අංක 2363/22 දරන ගැසට් නිවේදනය<br><br>- එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18ක් දක්වා වැඩි කිරීම. |
| 2024.01.01 | 2023 අංක 32 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත<br><br>- ප්‍රධාන අයිතම සඳහා අදාළ වන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් බොහොමයක් ඉවත් කිරීම. |
| 2024.01.01 | 2024 අංක 16 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත<br><br>- එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60ක් දක්වා අඩු කිරීම. |
| **නිෂ්පාදන බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත** | |
| 2024.01.01 | 2023.12.31 දිනැති අංක 2364/36 දරන ගැසට් නිවේදනය<br><br>- සුචිගත කිරීමක් මත ඒකක අනුපාත සහිත බදු අයකළ හැකි සියලුම භාණ්ඩ වල නිෂ්පාදන බද්ද 14%කින් සංශෝධනය කිරීම සහ පෙට්‍රල් ලීටරයක නිෂ්පාදන බද්ද රුපියල් 5කින් සහ ඩීසල් ලීටරයක නිෂ්පාදන බද්ද රුපියල් 6කින් අඩු කිරීම. |
| **සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)** | |
| 2024.01.01 | සුරාබදු නිවේදන අංක 04/2023 (2023.12.31 දිනැති අංක 2364/35 දරන ගැසට් නිවේදනය)<br><br>- සුරාබදු සඳහා වාර්ෂික උද්ධමන ගැලපීමක් හඳුන්වාදීමේ අරමුණ ඇතිව සියලු වර්ගවල මත්පැන් සඳහා සුරා බද්ද සියයට 14 කින් වැඩි කිරීම. |
| 2024.01.12 | සුරාබදු නිවේදන අංක 01/2024 (2024.01.12 දිනැති අංක 2366/38 දරන ගැසට් නිවේදනය)<br><br>- වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම. |
| 2024.01.12 | සුරාබදු නිවේදන අංක 02/2024 (2024.01.12 දිනැති අංක 2366/39 දරන ගැසට් නිවේදනය)<br><br>- සුරාබදු නිවේදන අංක 902 හි විධිවිධාන සංශෝධනය කිරීම. |
| 2024.02.01 | සුරාබදු නිවේදන අංක 03/2024 (2024.02.01 දිනැති අංක 2369/32 දරන ගැසට් නිවේදනය)<br><br>- වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම සහ කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් පමණක් ගෙවිය යුතු ගාස්තු හඳුන්වා දීම. |
| 2024.08.13 | සුරාබදු නිවේදන අංක 05/2024 (2024.08.13 දිනැති අංක 2397/22 දරන ගැසට් නිවේදනය)<br><br>- සුරාබදු නිවේදන අංක 666 හි විධිවිධාන සංශෝධනය කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද - 2011 අංක 18 දරන වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු පනත** | |
| 2024.01.01 | 2023.12.31 දිනැති අංක 2364/37 දරන ගැසට් නිවේදනය<br><br>- 2023 වසරේ අයවැය යෝජනා අංක 34.6 අනුව වසර පහක් ඇතුලත වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු බැවින් පෙට්‍රල්, ඩීසල් සහ පොහොර ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය 26ක වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද ඉවත් කිරීම. (තීරු බදු නොවන ආනයන බදු පියවරෙන් පියවර ඉවත් කිරීම) |
| 2024.03.29 | 2024.03.28 දිනැති අංක 2377/39 දරන ගැසට් නිවේදනය<br><br>- ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ (SLSFTA) විධිවිධාන අනුව, අයිතම 3,117ක් සඳහා සහනදායී මිල ගණන් යෙදීමට සහ සිංගප්පූරුවෙන් එම භාණ්ඩ ආනයනය කිරීමේදී භාණ්ඩ 595ක් නිදහස් කිරීමට. |
| **සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත** | |
| 2024.01.06 | 2024.01.04 දිනැති අංක 2365/50 දරන ගැසට් නිවේදනය<br><br>- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA) යටතේ සෙස් බද්දට අදාළ තීරුබදු ලිහිල්කරණ වැඩසටහන (TLP) ප්‍රකාශයට පත් කිරීම. |
| 2024.09.06 | 2024.09.05 දිනැති අංක 2400/25 දරන ගැසට් නිවේදනය<br><br>- 2024.08.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 24/1709/631/026-I සහ 2024.08.12 දිනැති අංක 24/1541/622/002-II දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සෙස් බද්ද සංශෝධනය කිරීම පිළිබඳ ගැසට් නිවේදනය නිකුත් කිරීම. |
| **බදු නොවන (ගාස්තු සහ අය කිරීම්)- 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත** | |
| 2024.02.01 | 2024.01.12 දිනැති අංක 2366/34 දරන ගැසට් නිවේදනය<br><br>- වෙළඳපල අතරමැදියන් සහ වෙළඳපල ආයතන සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අය කරනු ලබන ගාස්තු සහ අය කිරීම් සංශෝධනය කිරීම. |
| **රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත** | |
| 2024.01.06 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 06/2023 (2024.01.04 දිනැති අංක 2365/51 දරන ගැසට් නිවේදනය)<br><br>- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු 1,222 ක රේගු ආනයන තීරුබදු ලිහිල් කිරීමේ වැඩසටහනේ (TLP) "6" කාණ්ඩය යටතේ වාර්ෂික වාරික හයෙන් දෙවන වාරිකය ඉවත් කිරීම. |
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත** | |
| 2024.01.02 | 2024.01.02 දිනැති අංක 2365/04 දරන ගැසට් නිවේදනය<br><br>- 2024 ජනවාරි මස 02 වැනි දින සිට 21 වැනි දින දක්වා බලපැවැත්වෙන පරිදි සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/-ක බදු සහනයක් සැලසීම. |
| 2024.01.08 | 2024.01.07 දිනැති අංක 2365/84 දරන ගැසට් නිවේදනය<br><br>- 2024 දෙසැම්බර් මස 31 දින දක්වා අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2024.02.20 | 2024.02.19 දිනැති අංක 2372/06 දරන ගැසට් නිවේදනය<br><br>- බඩඉරිඟු, උඳු සහ මුං ඇට ආනයනය මත පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීමටත්, එහිදී කව්පි සහ කුරක්කන් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු.70/- සිට රු. 300/- දක්වා වැඩි කිරීම. |
| 2024.03.02 | 2024.03.01 දිනැති අංක 2373/42 දරන ගැසට් නිවේදනය<br><br>- 2024 අප්‍රේල් මස 11 දින දක්වා රාමසාන් උත්සව සමය පිළිබඳ සලකා රට ඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/-ක බදු සහනයක් සැලසීම. |
| 2024.03.27 | 2024.03.26 දිනැති අංක 2377/17 දරන ගැසට් නිවේදනය<br><br>- උත්සව සමය පිළිබඳ සලකා අනෙකුත් එළුණු ආනයනය සඳහා කිලෝ ග්‍රෑමයකට රු. 10/ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ සහනදායී බදු අනුපාතයක් අය කිරීම සහ 2024.01.02 සිට 2024.01.21 දක්වා සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/-ක බදු සහනයක් සැලසීම. |
| 2024.05.18 | 2024.05.17 දිනැති අංක 2384/31 දරන ගැසට් නිවේදනය<br><br>- 2024 දෙසැම්බර් 31 දක්වා තවත් වසරක කාලයක් සඳහා අයිතම 34ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
| --- | --- |
| 2024.07.31 | 2024.07.31 දිනැති අංක 2395/32 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් 31 දක්වා ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලුණු ආනයනය මත තීරුබදු නිදහස් කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම සහ භාණ්ඩ 6ක් සඳහා වලංගු කාලය දීර්ඝ කිරීම. |
| 2024.10.03 | 2024.10.02 දිනැති අංක 2404/19 දරන ගැසට් නිවේදනය<br>- දේශීය අස්වනු නෙලීමේ කාලය සැලකිල්ලට ගනිමින් අර්තාපල් සහ බොම්බයි ළූණු ආනයනය කිරීම මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පිළවෙලින් කිලෝ ග්‍රෑමයකට රු.60/-ක් හා රු.30/- ක් මාස හයක කාලයක් සඳහා වැඩි කිරීම. |
| **ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත** | |
| 2024.01.11 | 2024 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.01.11 දිනැති අංක 2366/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා තාවකාලිකව අත්හිටුවා ඇති, තෝරාගත් මෝටර් රථ වර්ග ආනයනය කිරීම සඳහා අවසර ලබාදීම. |
| 2024.02.07 | 2024 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.07 දිනැති අංක 2370/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/78 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) අංක 12 (අ) රෙගුලාසිය සංශෝධනය කිරීම මගින් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විදුලි වාහන ආනයනය කිරීමට අවසර දී ඇති කාලය 2024.08.31 දක්වා දීර්ඝ කිරීම. * |
| 2024.02.19 | 2024 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.19 දිනැති අංක 2372/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා, සහ වසාවාසි, ආදිය) ආනයනය කිරීමට අවසර දීම. ** |
| 2024.02.29 | 2024 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.28 දිනැති අංක 2373/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- පිළිගැනීම් මත ලේඛන (DA) සහ ගෙවීම් මත ලේඛන (DP) ගෙවීම් ක්‍රමවල පූර්ව අනුමත කිරීමේ අවශ්‍යතාවයට අදාළ 2022 අංක 07 දරන ආනයන පාලන රෙගුලාසිවල (2024.05.06 දින අංක 2278/21 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) අංක 6 දරන රෙගුලාසිය ඉවත් කිරීම. |
| 2024.03.19 | 2024 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.03.19 දිනැති අංක 2376/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා, තාවකාලිකව අත්හිටුවන ලද තෝරාගත් මෝටර් රථ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.04.08 | 2024 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.04.08 දිනැති අංක 2379/03 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC), ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය සඳහා 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති උඳු මෙට්‍රික් ටොන් 2,000ක් ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.05.17 | 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.05.17 දිනැති අංක 2384/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- සංචාරක අංශය සඳහා, තාවකාලිකව අත්හිටුවන ලද තෝරාගත් මෝටර් රථ ආනයනය කිරීමට අවසර දීම |
| 2024.05.17 | 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසි (2024.05.17 දිනැති අංක 2384/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- තෝරාගත් ආනයනයනික භාණ්ඩ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති නියම කිරීම |
| 2024.06.06 | 2024 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.06.06 දිනැති අංක 2387/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දින අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති පුවක් ආනයනය කිරීමට අවසර දීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2024.06.28 | 2024 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.06.28 දිනැති අංක 2390/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br><br>- ආහාරයට ගත හැකි තෝරාගත් ධාන්‍ය සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය ඉවත් කිරීම සහ මිනිසුන් රහිත ගුවන් යාත්‍රා සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය පැනවීම |
| 2024.07.18 | 2024 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.07.18 දිනැති අංක 2393/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br><br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා, සහ වසාවාසි, ආදිය) ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.08.21 | 2024 අංක 11 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි (2024.08.21 දිනැති අංක 2398/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br><br>- 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධානවල අර්ථය තුළ බලයලත් පුද්ගලයන්ට විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.09.11 | 2024 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.09.11 දිනැති අංක 2401/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br><br>- අමාත්‍ය මණ්ඩලය විසින් නිසි පරිදි අනුමත කරන ලද ගිවිසුම් සහිතව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ එකලස් කිරීමේ ව්‍යාපෘති සඳහා නවතම අර්ධ වශයෙන් ඒකලස් කළ (SKD) කට්ටල ආනයනය කිරීමට අවසර දීම. |
| **අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත** | |
| 2024.02.01 | 2024.02.01 දිනැති අංක 2369/27 දරන ගැසට් නිවේදනය<br><br>- කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොලින් ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කර, ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා, අදාළ වන අපගමන බද්ද වන ඇ.එ.ජ. ඩොලර් 60න් ඇ.එ.ජ. ඩොලර් 30ක සහනදායී අනුපාතයක් ලබාදීම වසරක කාලයක් දක්වා දීර්ඝ කිරීම. |
| 2024.03.07 | 2024.03.06 දිනැති අංක 2374/19 දරන ගැසට් නිවේදනය<br><br>- 2024 මාර්තු මස 07 දින සිට 2026 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි වසර තුනක පමණ කාලයක් සඳහා ඇ.එ.ජ. ඩොලර් 60/-ක බද්ද වෙනුවට, මගී යාත්‍රා ප්‍රවාහනය මඟින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.එ.ජ. ඩොලර් 5/-ක් ලෙස සහනදායී අනුපාතයක් සහ මගී නෞකාවක් මඟින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.එ.ජ. ඩොලර් 20/-ක් ලෙස සහනදායී අනුපාතයක් ප්‍රදානය කිරීම. |
| **මෝටර්රථ සඳහා සුඛෝපභෝගී බද්ද - 2018 අංක 35 දරන මුදල් පනත** | |
| 2024.01.24 | 2024.01.24 දිනැති අංක 2368/24 දරන ගැසට් නිවේදනය<br><br>- 2023.02.10 දිනැති අංක 2318/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රේෂණය කිරීම, ණයවර ලිපි පිහිටුවීම සහ මෝටර් වාහන ලියාපදිංචි කිරීම සලකා බැලීමේ කාලය තව දුරටත් දීර්ඝ කිරීම. (සංක්‍රමණික සේවකයින් සඳහා පූර්ණ විදුලි මෝටර් රථ වල බදු රහිත සීමාව රු. මිලියන 6 සිට රු. මිලියන 12 දක්වා වැඩි කිරීම.) |

* *දැනට බලනොපැවැත්වේ.*
** *දැනට වලංගු නොවේ.*

## 2.3 රාජ්‍ය වියදම

### රජයේ වියදම

රාජ්‍ය වියදම 2023 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 2,559.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,463.3 දක්වා සියයට 3.8 කින් අඩුවිය. ප්‍රධාන වශයෙන් පොළී ගෙවීම් සඳහා වන වියදම අඩුවීම හේතුවෙන් පුනරාවර්තන වියදම් 2023 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 2,325.5 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,218.4 ක් දක්වා සියයට 4.6 කින් අඩු විය. ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් 2023 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 234.1 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 244.9 දක්වා සියයට 4.6 කින් වැඩි විය.

### පොලී ගෙවීම්

දේශීය හා විදේශීය ණය සඳහා පොලී ගෙවීම් ඇතුළු සමස්ත පොලී ගෙවීම් සඳහා වියදම 2023 වසරේ පළමු මාස හයෙහි වූ රු. බිලියන 1,273.3 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,142.1 ක් දක්වා සියයට 10.3 කින් අඩු විය. දේශීය ණය පොලී ගෙවීම් සඳහා වූ වියදම 2023 වසරේ පළමු මාස හයෙහි වූ රු. බිලියන 1,219.2 සිට 2024 වසරේ සමාන

කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,073.7 ක් දක්වා සියයට 11.9 කින් අඩු වීම මෙයට හේතු විය. කෙසේ වුව ද, 2023 වසරේ පළමු මාස හයේදී රු. බිලියන 54.0 ක් වූ විදේශීය ණය පොලී ගෙවීම් වියදම, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 68.4 .ක් දක්වා සියයට 26.4 කින් වැඩි විය.

**2.9 වගුව : 2024 වසරේ ජනවාරි සිට ජුනි දක්වා රජයේ වියදම් හා කාර්යසාධනය**

රු. මිලියන

| අයිතමය | 2023 | 2024 |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **2,325,541** | **2,218,442** |
| වැටුප් | 459,991 | 480,326 |
| විශ්‍රාම වැටුප් | 169,822 | 188,086 |
| පොලී ගෙවීම් | 1,273,291 | 1,142,105 |
| වෙනත් | 422,437 | 407,925 |
| **ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම්** | **234,078** | **244,863** |
| **එකතුව** | **2,559,619** | **2,463,305** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### වැටුප් හා විශ්‍රාම වැටුප්

පළාත් සභා ඇතුළු රාජ්‍ය සේවකයින්ගේ වැටුප් හා වේතන සඳහා දරන ලද වියදම 2023 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 460.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 480.3 දක්වා සියයට 4.4 කින් වැඩිවිය. රාජ්‍ය සේවකයින් සඳහා වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව 2024 වසරේ ජනවාරි මස සිට ගෙවීම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු විය.

හිඟ මුදල් පියවා නියමිත වේලාවට පාරිතෝෂික ගෙවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් සඳහා වන වියදම 2023 වසරේ පළමු මාස හය තුළ දී රු. බිලියන 169.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 188.1 දක්වා සියයට 10.8 කින් වැඩිවිය.

### සුබසාධන වියදම්

2024 වසරේ පළමු මාස හය තුළ අස්වැසුම මුදල් ප්‍රදාන, වැඩිහිටි දීමනා, වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර, ආබාධිත පුද්ගල දීමනා, ආබාධිත රණවිරුවන්ට ආධාර, ගැබිණි මව්වරුන්ට පෝෂ්‍යදායි ආහාර පැකේජය (පෝෂණ මල්ල), පාසල් පෙළ පොත්, නිල ඇඳුම් ඇතුළු සමාජ සුබසාධන, සමාජ ආරක්ෂණය, පොහොර සහනාධාරය සහ සංවර්ධන සහායන් ඇතුළු සුභසාධන වියදම් ලෙස රජය විසින් රුපියල් බිලියන 401.4 ක් වැය දරා ඇත.

අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබා දෙන අස්වැසුම මුදල් සහනාධාරය සඳහා වන සමාජ ආරක්ෂණ වියදම් වෙනුවෙන් 2024 වසරේ මුල් මාස හය තුළ දී රු. බිලියන 73.3 ක් වියදම් දරා ඇත. 2024 වර්ෂය සඳහා අස්වැසුම සහ අනෙකුත් වර්ගීකරණ කුටුම්භ මුදල් සහනාධාර සඳහා රු. බිලියන 205 ක අයවැය ප්‍රතිපාදන වෙන් කර ඇත. රජයේ රෝහල්වලට වෛද්‍ය සැපයුම් ඇතුළු සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන සඳහා 2024 වසරේ පළමු මාස හය තුළ දරන ලද වියදම රු. බිලියන 29.0 කි. නොමිලේ පෙළපොත්, නිල ඇඳුම්, දුෂ්කර පාසල්වල සිසුන් සඳහා පාවහන් වැනි අධ්‍යාපන සුබසාධන වැඩසටහන් සඳහා 2024 වසර පළමු මාස හය තුළ වියදම රු. බිලියන 4.6 කි. එමෙන්ම රසායනික පොහොර සඳහා වූ රජයේ සහනාධාරය සඳහා 2024 වසරේ පළමු මාස හය තුළ දී දරන ලද වියදම වෙනුවෙන් රු. බිලියන 20.4 කි.

**2.10 වගුව : 2024 වර්ෂයේ ජනවාරි සිට ජුනි දක්වා ප්‍රධාන සුභසාධන වැඩසටහන් සඳහා වියදම්**

රු. මිලියන

| වැඩසටහනේ නම | 2023 | 2024 |
|---|---|---|
| | තාවකාලික | තාවකාලික |
| **සමාජ සුභසාධනය** | | |
| අඩු ආදායම්ලාභී පවුල් සඳහා මූල්‍ය ආධාර | 69,383 | 64,079 |
| අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර | 2,293 | 2,514 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා මූල්‍ය ආධාර | 9,929 | 5,527 |
| වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර | 1,239 | 1,183 |
| රණවිරු මාපිය රැකවරණ දීමනාව | 1,131 | 1,084 |
| පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා | 129 | 111 |
| රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | 997 | 855 |
| 1990 "සුව සැරිය" නොමිලේ ගිලන්රථ සේවාව | 1,167 | 591 |
| වෙනත් | 1,874 | 1,002 |
| **සමාජ ආරක්ෂණය** | | |
| විශ්‍රාම වැටුප් | 169,822 | 188,085 |
| මියගිය හා තුවාල ලැබූ රණවිරුවන් සඳහා සේවා වන්දී | 20,804 | 23,338 |
| විශ්‍රාමිකයන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය | 450 | 460 |
| පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය රක්ෂණය (සුරක්ෂා) | 697 | – |

රු. මිලියන

| වැඩසටහනේ නම | 2023 | 2024 |
|---|---|---|
| | තාවකාලික | තාවකාලික |
| ගොවි විශ්‍රාම වැටුප | 2,173 | 2,434 |
| වෙනත් | 117 | 107 |
| **සෞඛ්‍ය හා පෝෂණ** | | |
| රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයුම් (ආයුර්වේද රෝහල් ඇතුළුව) | 58,731 | 28,961 |
| ත්‍රිපෝෂ වැඩසටහන | 252 | 978 |
| ගැබිණි මව්වරුන් සඳහා පෝෂණීය ආහාර පැකේජය (පෝෂණ මල්ල) | 931 | 2,790 |
| පාසල් පෝෂ්‍යදායි ආහාර වැඩසටහන | 2,547 | 6349 |
| පෙර පාසල් ළමුන් සඳහා උදැසන ආහාරය | 17 | 344 |
| **අධ්‍යාපනය** | | |
| පාසල් පෙළ පොත් | 11,757 | 3,364 |
| පාසල් නිල ඇඳුම් | 1,612 | 1,034 |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් වල ළමුන් සඳහා පාවහන් | – | 200 |
| ශිෂ්‍යත්ව- 5 ශ්‍රේණියේ සිසුන් | 328 | 418 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර | 888 | 1,250 |
| රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ ශිෂ්‍යයින් සඳහා වූ ණය යෝජනා ක්‍රමය | 383 | 812 |
| වෙනත් | 279 | 134 |
| **සංවර්ධන සහායයන්** | | |
| පොහොර සහ බෝග සහනාධාර | 32,208 | 21,061 |
| ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා පොළී වෙනස ගෙවීම | – | 20,000 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය මාලා ක්‍රම | 4,973 | 12,653 |
| නාගරික පුනර්ජීවන නිවාස ආධාර වැඩසටහන | 8,852 | 3,551 |
| වෙනත් | 156 | 337 |
| **වෙනත් සහනාධාර** | | |
| ආර්ථික වශයෙන් ලාභදායී නොවන මාර්ගවල බස් රථ ධාවනය සඳහා ශ්‍රී ලංගමට ලබාදෙන සහනාධාර, පාසල් වාර ප්‍රවේශපත්‍ර හා සන්නද්ධ හමුදා නිදහස් ගමන් වාර ප්‍රවේශපත්‍ර | 12,156 | 5,829 |
| **එකතුව** | **418,275** | **401,435** |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## පාසල් අධ්‍යාපනය

2024 වසරේ පළමු මාස හය තුළ පාසල් අධ්‍යාපනය සඳහා රු. බිලියන 160.5 ක මුදලක් වැය කර ඇති අතර, එයින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පිළිවෙළින් රු. බිලියන 157.5 ක් සහ රු. බිලියන 3 ක් විය.

රජය විසින් රු. බිලියන 11.4 ක වියදමක් දරමින් 2024 වසරේ පාසල් පෝෂණ ආහාර වැඩසටහන, පාසල් පෙළ පොත් මුද්‍රණය සහ දුෂ්කර පාසල්වල සිසුන් සඳහා පාසල් නිල ඇඳුම්, පාවහන් ලබා දීම වැනි සුබසාධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත් මෙම සුබසාධන වැඩසටහන් සඳහා දරන ලද වියදම පසුගිය වසරේ අදාළ කාලයට සාපේක්ෂව සියයට 30 කින් පමණ පහළ ගොස් ඇත.

2024 වසරේ පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා රජය විසින් එක් සිසුවෙකුගේ පෝෂණීය ආහාර වේලක දිනක මිල රු. 85 සිට රු. 110 දක්වා වැඩි කරන ලද අතර ඒ සඳහා වසරේ පළමු මාස හය තුළ දී රු.බිලියන 6.3 ක් වැය කරන ලදී.

පළාත් අධ්‍යාපන අංශයද ඇතුළත් වන පරිදි පාසල්වල පුනරුත්ථාපන/යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. බිලියන 3 ක් වැය කෙරිණි.

**2.11 වගුව : 2024 වර්ෂයේ ජනවාරි සිට ජූනි දක්වා පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්**

රු. මිලියන

| විස්තරය | 2023 ජනවාරි-ජූනි | 2024 ජනවාරි-ජූනි (තාවකාලික) |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| පාසල් ගුරුවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල පුද්ගල පඩිනඩි | 132,348 | 135,839 |
| ජාතික | 26,377 | 29,372 |
| පළාත් | 105,971 | 106,467 |
| සුභසාධන වැඩසටහන් | 16,244 | 11,414 |
| විභාග ඇගයීම් කටයුතු | 1,466 | 2,361 |
| **ප්‍රාග්ධන වියදම්** | | |
| පාසල් පුනරුත්ථාපන හා යටිතල පහසුකම් සංවර්ධනය | 42 | 319 |
| ගුරු සංවර්ධනය | 19 | 29 |
| අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධන ප්‍රතිසංස්කරණ | 2,394 | - |
| පළාත් අධ්‍යාපනය | 1,402 | 820 |

*මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## උසස් අධ්‍යාපනය

2023 වසරේ පළමු මාස හයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වන වියදම රු. බිලියන 37.9 ක් දක්වා සියයට 0.4 කින් වැඩි විය. පුනරාවර්තන වියදම 2023 වසරේ පළමු මාස හයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 29.3 දක්වා සියයට 0.6 කින් වැඩි විය. ප්‍රාග්ධන වියදම 2023 පළමු මාස හයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 8.6 දක්වා සියයට 0.4 කින් අඩු විය.

මාස දෙකකට අධික කාලයක් පැවති විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩ වර්ජනය හේතුවෙන් පුනරාවර්තන වියදමේ වර්ධනය 2023 වසරේ පළමු මාස හයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී අඩු වීමක් වාර්තා වූ අතර ජූලි මාසයේ දී වැඩ වර්ජනය අවසන් වූ පසු හිඟ වැටුප් ගෙවන ලදී.

**2.12 වගුව : 2024 වසරේ ජනවාරි සිට ජූනි දක්වා උසස් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්**

රු. මිලියන

| විස්තරය | 2023 ජනවාරි - ජූනි | 2024 ජනවාරි - ජූනි |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පුද්ගල පඩිනඩි ගෙවීම | 25,117 | 24,050 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම | 888 | 1,250 |
| **මූලධන වියදම්** | | |
| උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව) | 1,822 | 758 |
| විද්‍යා සහ තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ආසියානු සංවර්ධන බැංකුව) | 2,282 | 3,158 |
| වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - සවුදි රජය) | 355 | 163 |

*මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපන

2024 වසරේ පළමු මාස හය තුළ දී නිපුණතා සංවර්ධනය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රු. බිලියන 3,9 ක් ද මූලධන වියදම් සඳහා රුපියල් මිලියන 293 ක් ද ලෙස රු. බිලියන 4.2 ක වියදමක් දරන ලදී.

**වගුව 2.13 : 2024 ජනවාරි - ජූනි දක්වා නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වෙනුවෙන් කරන ලද වියදම්**

රු. මිලියන

| විස්තරය | 2023 ජනවාරි - ජූනි | 2024 ජනවාරි - ජූනි |
|---|---|---|
| "නිපුණතා සිසු දිරිය" ශිෂ්‍යාධාර වැඩසටහන | 232 | 45 |
| නිපුණතා සංවර්ධන වැඩසටහන (ආසියානු සංවර්ධන බැංකුව/ලෝක බැංකුව) | 235 | - |
| තාක්ෂණ විද්‍යාල/ කාර්මික විද්‍යාල 7 ක් නවීකරණය කිරීම | 21 | 83 |
| ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා සඳහා ධාරිතා වර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/කොයිකා) | 81 | 4 |
| යූ ලීඩ් (ශ්‍රී ලංකා රජය/ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමරිකා එක්සත් ජනපද නියෝජිතායතනය) | - | 3 |
| ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව ලබා දීම (ශ්‍රී ලංකා රජය/ශ්‍රී ලංකා රජය ජර්මානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය) | - | 7 |

*මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### පර්යේෂණ හා නව නිපැයුම්

2024 වසරේ පළමු මාස හය තුළ දී පර්යේෂණ හා නව නිපැයුම් සංවර්ධනය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 529 ක් ද මූලධන වියදම් සඳහා රු. මිලියන 125 ක් ද ලෙස රු. මිලියන 654 ක වියදමක් දරන ලදී.

**වගුව 2.14 : 2024 ජනවාරි - ජූනි දක්වා පර්යේෂණ හා නව නිපැයුම් ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වෙනුවෙන් කරන ලද වියදම්**

රු. මිලියන

| විස්තරය | 2023 ජනවාරි - ජූනි | 2024 ජනවාරි - ජූනි |
|---|---|---|
| නිසරු පස වැඩි දියුණු කිරීම | - | 2 |
| විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන | 3 | - |
| ද්වීපාර්ශවීය හා බහුපාර්ශවීය ගිවිසුම් සහ අනෙකුත් රටවල් සමගින් විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය | - | 2 |
| පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන සැලැස්ම ක්‍රියාත්මක කිරීම | - | 1 |

*මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### සෞඛ්‍ය

2024 වසරේ පළමු මාස හය තුළ පළාත් සභා සහ මධ්‍යම රජයේ සෞඛ්‍ය වියදම් සලකා බැලීමේ දී 2023 වසරේ එම කාලසීමාවට සාපේක්ෂව බටහිර හා දේශීය වෛද්‍ය යන ක්ෂේත්‍ර දෙකෙහි සෞඛ්‍ය සේවාවන් සඳහා වන රජයේ මුළු වියදම සියයට 9 කින්, එනම් රු. බිලියන 168.7 දක්වා අඩුවී ඇත. සමස්ත සෞඛ්‍ය වියදම්වලින් පුනරාවර්තන වියදම රු. බිලියන 158.1 ක් වන අතර මූලධන වියදම රු. බිලියන 10.6 කි. පුනරාවර්තන වියදම් සැලකීමේ දී එහි ප්‍රධාන කාණ්ඩයක් වන වෛද්‍ය සැපයුම් සංරචකය යටතේ ඖෂධ, ශල්‍ය උපකරණ සහ රසායනාගාර උපකරණ සඳහා රු. බිලියන 29.0 ක් වියදම් කර ඇත.

**වගුව 2.15 : 2024 වර්ෂයේ ජනවාරි සිට ජූනි දක්වා සෞඛ්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් සඳහා වන වියදම**

| විස්තරය | 2023 ජනවාරි - ජූනි | 2024 (තාවකාලික) |
|---|---|---|
| **මුළු පුනරාවර්තන වියදම්** | **173,681** | **158,091** |
| සේවා සැපයීමේ වියදම් | 71,867 | 85,705 |
| එයින්; වෛද්‍ය නිලධාරීන් සහ කාර්යය මණ්ඩල වැටුප් සඳහා වන වියදම | 57,911 | 67,711 |
| වෛද්‍ය සැපයීම් | 58,730 | 28,961 |
| පළාත් සෞඛ්‍ය | 43,084 | 43,425 |
| **රාජ්‍ය ආයෝජන වියදම්** | **10,967** | **10,569** |
| වෛද්‍ය උපකරණ | 763 | 577 |
| සෞඛ්‍ය පද්ධතීන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකුව. | 401 | 1254 |
| කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය - (ශ්‍රී ලංකා රජය - ලෝක බැංකුව) | 214 | 844 |
| රේඛීය අමාත්‍යාංශය යටතේ ගැනෙන රෝහල්වල හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම | 137 | 0 |
| ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධි ශක්ති විකිරණ ප්‍රතිකාර ලබාදීම | 53 | 0 |
| හෙද පීඨය/ නේවාසිකාගාරය ඉදිකිරීම | 93 | 83 |
| රාජ්‍ය ආයෝජන වියදම | 5,345 | 2,591 |
| පළාත් සෞඛ්‍ය ආයෝජන | 3,235 | 2,795 |

*මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### කෘෂිකර්මය

වැව්ලි, පශු සම්පත්, ධීවර හා ඉඩම් සංවර්ධනය යන උප අංශයන්ද ඇතුළත්ව කෘෂිකර්ම අංශය සඳහා 2023 වසරේ පළමු මාස හය තුළ දරා ඇති වියදම වන රු. බිලියන 60.3 ට සාපේක්ෂව එම අංශ සඳහා 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී දරා ඇති වියදම රු. බිලියන 53.3 දක්වා සියයට 11 කින් අඩු වී ඇත. 2024 වසරේ පොහොර සහනාධාරය හෙක්ටයාරයකට රු. 20,000 සිට රු. 15,000 දක්වා අඩු කිරීම සහ ප්‍රදාන, ණය යෝජනා ක්‍රම ඔස්සේ ලද පොහොර සඳහා වූ බදු සහ ඒ ආශ්‍රිත වියදම් 2023 වසරේ ගිණුම්ගත කිරීමට සිදු වීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2024 වසරේ පළමු මාස හය තුළ දරන ලද මුළු වියදමෙන්, රු. බිලියන 20.4 ක් පොහොර සහනාධාර වැඩසටහන සඳහා ද, රු. මිලියන 355 ක් කෘෂි භෝග සඳහා ද, රු. මිලියන 1,021 ක් වැව්ලි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ද, රු. මිලියන 1,898 ක් ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ද, රු. මිලියන 760 ක් ඉඩම් සංවර්ධනය සඳහා ද, ඉතිරිය පශු සම්පත් සංවර්ධනයට සහ කෘෂිකර්ම අංශයට අවශ්‍ය පහසුකම් සැලසීම උදෙසා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ද වැය කර ඇත.

### ජල සම්පාදන හා සනීපාරක්ෂාව

සුරක්ෂිත පානීය ජලය සහ ගුණාත්මක සනීපාරක්ෂක සේවා ලබා ගැනීම සඳහා දේශීය සහ විදේශීය බැංකුවලින් ලබා ගත් ණය සේවාකරණය ඇතුළුව රු. බිලියන 9.8 ක වියදමක් 2024 වසරේ පළමු මාස හයක කාලය තුළ රජය විසින් දරා ඇත. එයින් රු. මිලියන 652 ක් හා රු. බිලියන 9.1 ක් පිළිවෙලින් පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කර ඇත. සමස්ත ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබා දීම සහතික

කිරීම සඳහා නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම, නව ජල සම්පාදන යෝජනා ක්‍රම ඇති කිරීම සහ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති කඩිනම් කිරීම අරමුණු කරගත් ධාරිතා වැඩි දියුණු කිරීමේ හා බෙදාහැරීම් පුළුල් කිරීම් ජාතික වැඩසටහන 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක වේ.

### මාර්ග සහ පාලම්

2024 පළමු මාස හය තුළ මාර්ග සහ පාලම් සඳහා දරන ලද වියදම රු. බිලියන 95.1 ක් වන අතර එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 5 කින් පමණ අඩු විය. පවතින මාර්ග පද්ධතිය නඩත්තු කිරීම, දැනටමත් ආරම්භ කර ඇති මාර්ග ව්‍යාපෘතිවල තීරණාත්මක ක්‍රියාකාරකම් අවසන් කර ඒවා මෝටර් රථ ධාවනය කළ හැකි තත්ත්වයට සංවර්ධනය කිරීම සහ මධ්‍යම අධිවේගී මාර්ගය ඉදි කිරීම සඳහා මේ වසරේ මුල් මාස හය තුළ රජය ප්‍රමුඛත්වය ලබා දුණි. මුළු මුදලින් රු. බිලියන 25.7 ක් ජාතික හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා වැය කර ඇත. මේ යටතේ ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු. බිලියන 3.2 ක් වැය කර ඇති අතර, ප්‍රධාන මාර්ගවලට ප්‍රවේශ වීම සඳහා විකල්ප මාර්ග කිලෝමීටර 100,000 ක් සංවර්ධනය කිරීම සඳහා රු. බිලියන 9.1 ක් වැය කර ඇත. මාර්ග නඩත්තු කටයුතු සඳහා රු. බිලියන 7.2 ක් ද වැය කර ඇත.

අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා රු. බිලියන 20.6 ක් වැය කළ අතර මධ්‍යම අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ පොතුහැර සිට රඹුක්කන දක්වා වන කොටසේ සංවර්ධන කටයුතු සඳහා වැඩිම වියදමක් දරා ඇත. මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ වියදම රු. මිලියන 344 ක් වන අතර පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම සඳහා වැය කර ඇති මුදල රු. බිලියන 1.3 කි.

තවද, මාර්ග ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දේශීය බැංකුවලින් ලබාගත් ණය සඳහා පොලී සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම වෙනුවෙන් මුළු වියදමෙන් වැඩිම ප්‍රමාණයක් වන රු. බිලියන 43.1 ක වියදමක් දරා ඇත.

**2.16 : වගුව 2024 ජනවාරි සිට අප්‍රේල් දක්වා මාර්ග සහ පාලම් සඳහා වියදම්**

රු. මිලියන

| | ව්‍යාපෘතිය /වැඩසටහන | 2023 ජනවාරි - ජුනි | 2024 ජනවාරි - ජුනි (තාවකාලික) |
|---|---|---|---|
| **1** | **අධිවේගී මාර්ග සංවර්ධනය** | **20,293** | **20,608** |
| | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | 14,582 | 14,427 |
| | කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ගය | 16 | 1,787 |
| | කණු මත දිවෙන නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වන අධිවේගී මාර්ගය | 13 | – |
| | කණු මත දිවෙන වරාය නගර අධිවේගී මාර්ගය | 3,785 | 3,894 |
| | දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය | 1,897 | 500 |
| **2** | **මාර්ග සංවර්ධනය** | **26,410** | **25,727** |
| | මාර්ග නඩත්තුව හා වැඩිදියුණු කිරීම් | 2,280 | 7,192 |
| | කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 592 | 792 |
| | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 316 | – |
| | ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන | 4,760 | 3,220 |
| | මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම | 21 | – |
| | අන්තර්ගතිකව සහසම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය | 3,043 | 2,652 |
| | මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීම | 43 | 176 |
| | ප්‍රධාන මාර්ග හා අධිවේගී මාර්ග වෙත ප්‍රවේශය සඳහා සහ මාර්ග තදබදය අවම කිරීම සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීම | 12,644 | 9,095 |
| | අනෙකුත් මාර්ග සංවර්ධනය | 2,711 | 2,600 |
| **3** | **මාර්ග පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම** | **765** | **344** |
| **4** | **පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම** | **1,182** | **1,257** |
| | ජාතික මාර්ග ජාලයේ හානි වූ සහ දුර්වල පාලම් පුනරුත්ථාපනය | 157 | 106 |
| | පරණ පාලම් කොටස් යොදා ගනිමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම | 151 | 125 |
| | දෙවන නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 6 | – |
| | කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් දෙකක් සැලසුම්කොට ඉදිකිරීම | 124 | 97 |
| | කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානය අසල සහ උත්තරානන්ද මාවතෙහි දුම්රිය මාර්ග යට ඉහළින් ගුවන් පාලම් ඉදිකිරීම | 733 | 829 |
| | ජාතික මහාමාර්ගයන්හි පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීම | 11 | 100 |

රු. මිලියන

| | ව්‍යාපෘතිය /වැඩසටහන | 2023<br>ජනවාරි - ජූනි | 2024<br>ජනවාරි - ජූනි<br>(තාවකාලික) |
|---|---|---|---|
| 5 | "මග නැගුම " ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | 2,358 | 915 |
| 6 | මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මාරු කිරීම් | 4,500 | - |
| 7 | ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම (ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති හැර අනෙකුත් ව්‍යාපෘති ) | 1,999 | 3,128 |
| 8 | මාර්ග සංවර්ධය අධිකාරියේ මූල්‍ය හිඟය පියවීම සඳහා ලබාදුන් මූල්‍ය දායකත්වය | 42,429 | 43,145 |
| 9 | අනෙකුත් | - | - |
| | එකතුව | 99,936 | 95,124 |

*මූලාශ්‍රය - ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### ප්‍රවාහන

2024 වර්ෂයේ පළමු මාස හයක කාල සීමාව සඳහා ප්‍රවාහන අංශය වෙනුවෙන් රජය කරන ලද මුළු වියදම රු. බිලියන 27.5 ක් වන අතර එය 2023 වර්ෂයේ අදාල කාලයට සාපේක්ෂව සියයට 2.9 ක අඩුවීමකි. එයින් රු. බිලියන 20.5 ක් හා රු. බිලියන 7.0 ක් පිළිවලින් පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කර ඇත. කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය, මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පුනරුත්තාපනය කිරීම, පවතින දුම්රිය මාර්ග නඩත්තු කටයුතු කිරීම සහ දුම්රිය ඇණිය සුළු හා මහා පරිමාණ අළුත්වැඩියාව යන ව්‍යාපෘති වෙනුවෙන් රු. බිලියන 3.8 ක වියදමක් දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් දරන ලදී

2024 පළමු මාස හයෙහි මෙම අංශයට රජය විසින් දරන ලද වියදමින් රු. බිලියන 5.8 ක් ආර්ථිකමය වශයෙන් ලාභ නොලබන මාර්ගයන්හි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ ධාවනය කරවීම, පාසල් හා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර සහ සන්නද්ධ සේවාවන්ට බස් ගමන් අවසර පත් ලබාදීම යන සුබසාධක සේවාවන් සඳහා වියදම් දරා ඇත. මෙම කාලය තුළ මෝටර් රථ පනත ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රු. බිලියන 1.5 ක වියදමක් දරන ලදී.

### නිවාස සංවර්ධනය

ගැටුම්වලින් පීඩාවට පත් වූ පවුල් නැවත පදිංචිකිරීම/ස්ථිර නිවාස ලබාදීම හා වීන සංවර්ධනය වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා නිවාස ඒකක 2,000 ක් ඉදිකිරීම ද ඇතුළත්ව 2024 වර්ෂයේ පළමු මාස හය තුළ නිවාස ඉදිකිරීම හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් වෙනුවෙන් රජය විසින් රු. මිලියන 959 ක් වැය කර ඇත.

### නාගරික සංවර්ධනය

2024 පළමු මාස හය සඳහා නාගරික සංවර්ධනය වෙනුවෙන් රජය විසින් රු. මිලියන 6.2 ක් වැය කර ඇත. එයින් රු. මිලියන 900 ක් පුනරාවර්තන වියදම් ලෙසත් රු. බිලියන 5.3 ක් ප්‍රාග්ධන වියදම් ලෙසත් වැය කර ඇත. නාගරික අංශයේ මුළු වියදමින් රු. බිලියන 3.9 ක් මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය, නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය, උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (යාපනය) සහ සියක් නගර වැඩසටහන යන ව්‍යාපෘති වෙනුවෙන් වැය කර ඇත. රු. මිලියන 631 ක් වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ මහ කොළඹ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති වෙනුවෙන් වැය කර ඇත.

### පරිසරය

2024 වසරේ පළමු මාස හය තුළ පාරිසරික අංශය සඳහා රජය විසින් දරන ලද සමස්ත වියදම රු. බිලියන 4.0 ක් වන අතර, එයින් පිළිවෙළින් රු. බිලියන 3.7 ක් පුනරාවර්තන වියදම් සහ රු. මිලියන 296 ක් ප්‍රාග්ධන වියදම් වේ. මුළු වියදමෙන් රු. මිලියන 52 ක් පරිසර සංරක්ෂණයටත්, රු. මිලියන 156 ක් වන ආවරණය පුළුල් කිරීම සහ වන ආරක්ෂණය සඳහාත්, රු.මි. 183 ක් විදුලි වැට ඉදි කිරීම ඇතුළු අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහාත්, රු. මිලියන 5 ක් ජාතික වනෝද්‍යානයන්හි මාර්ග ජාලය වැඩිදියුණු කිරීමට සහ රු. මිලියන 18 ක් සත්වෝද්‍යාන සංවර්ධනයටත් ලබා දී ඇති අතර, ඉතිරි මුදල පරිසරය සුරැකීම, වනජීවී සහ වන සංරක්ෂණය සම්බන්ධ වෙනත් වැඩසටහන් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන වෙත වෙන් කරන ලදී.

### වාරිමාර්ග හා ජල කළමනාකරණය

2024 වසරේ පළමු මාස හය තුළ වාරිමාර්ග හා ජල කළමනාකරණය සඳහා වන මුළු ආයෝජනය රු. බිලියන 12.6 ක් වූ අතර මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන සඳහා රු. බිලියන 3.9 ක් වැය කර ඇත. ඉතිරි රු. බිලියන 8.7 ක් වාරිමාර්ග පද්ධති සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වෙන් කරන ලදී.

**වගුව 2:17 රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ මෙහෙයුම් (ජනවාරි - ජූනි 2024)**

රු. බිලියන

| අයිතමය | ජනවාරි - ජූනි | | |
|---|---|---|---|
| | 2023 | 2024 | |
| | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය |
| ආරම්භක මුදල් ශේෂය | -84.2 | 599.5 | 599.5 |
| ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම | 1,250.1 | 1,802.0 | 1,812.3 |

රු. බිලියන

| අයිතමය | ජනවාරි - ජූනි | | |
|---|---|---|---|
| | **2023** | **2024** | |
| | **තත්‍ය** | **ඇස්තමේන්තුව** | **තත්‍ය** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල සමස්ථ මුදල් ගලා යෑම් | -2,166.9 | -2,501.9 | -2,265.5 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම් * | -265.1 | -446.1 | -379.3 |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | -1,181.9 | -1,146.0 | -832.5 |
| දල ණය ගැනීම් භාවිතය * | 1,922.1 | 1,712.6 | 1,665.3 |
| ණය ආපසු ගෙවීම් | -617.8 | -591.2 | -749.0 |
| ශුද්ධ ණය ගැනීම් | 1,304.3 | 1,121.4 | 916.4 |
| පෙර වසරේ වාණිජ ණය ගැණීම් ශේෂය | 0.0 | - | - |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB, ශුද්ධ තැන්පතු යනාදිය) | 5.9 | - | -36.6 |
| **අවසාන මුදල් ශේෂය** | **44.1** | **574.9** | **646.7** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

***භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2024 ජූනි 30 දිනට ගිණුම්ගත කරන ලද ව්‍යාපෘති / වැඩසටහන් ණය ඇතුලත් වේ.***

## 2.4 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කළමනාකරණය

රජය විසින් ක්‍රියාවට නංවන ලද ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ගවල ප්‍රතිලාභ හේතුවෙන් 2024 වසරේ පළමු මාස හය තුළ භාණ්ඩාගාර මෙහෙයුම් පහසු කරමින් මුදල් ලැබීමේ වැඩි වීමක් දක්නට ලැබුණි. වෙළෙඳපොළෙන් සම්පූර්ණ අවශ්‍යතාවය සපුරා ගැනීම වෙනුවට ණය සේවා ගෙවීම් වෙනුවෙන් මූල්‍යකරණය සඳහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහය මඟින් දායකත්වය ලබා ගැනීමට ඉහළ ගිය රාජ්‍ය ආදායම අවස්ථාව සැලසීය. තවද, බැංකු අංශයේ වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්වයත් සමඟ මුදල් සහ ප්‍රාග්ධන වෙළෙඳපොළේ ද්‍රවශීලතා අතිරික්තය වෙළෙඳපොළ පොලී අනුපාත පවත්වා ගැනීමට සහාය වී ඇත. IMF-EFF දර්ශක ඉලක්කවලට අනුකූලව ඕනෑම අවස්ථාවක මාස තුනකට වඩා නොගෙවූ ගෙවීම් පවත්වා නොගැනීම, රජයේ භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන්ට ගෙවිය යුතු බිල්පත් කඩිනමින් පියවීම කාර්මික කාර්ය සාධනය පහසු කර ඇත.

ඒ අනුව 2024 වසරේ පළමු මාස හය තුළ මහා භාණ්ඩාගාරයට ආදායම් සහ අනෙකුත් ලැබීම් වශයෙන් මුදල් ලැබීම් රු. බිලියන 1,802.0 ක ඇස්තමේන්තුවට සාපේක්ෂව රු. බිලියන 1,812.3 ක් වන අතර එය ඇස්තමේන්තුවෙන් සියයට 100.6 ක ප්‍රගතියකි. මේ අතර, 2024 වසරේ පළමු මාස හය තුළ පුනරාවර්තන වියදම් සහ රාජ්‍ය ආයෝජන සඳහා මුදල් පිටතට ගලා යාම් රු. බිලියන 2,644.8 ක් වන අතර එය රු. බිලියන 2,948.0 ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 89.7 කි. ඒ අනුව, පුනරාවර්තන වියදම් සහ රාජ්‍ය ආයෝජන යන දෙඅංශයෙන්ම මුළු මුදල් පිටතට ගලායාම 2023 වසරේ එම කාල සීමාව තුළ දී වූ රු. බිලියන 2,432.0 ට සාපේක්ෂව සියයට 8.8 ක වැඩිවීමකි.

ප්‍රධාන වශයෙන් 2024 වසරේ පළමු භාගය තුළ ආදායම සහ අනෙකුත් ලැබීම් සියයට 44.9 කින් ඉහළ යාම හේතුවෙන්, 2023 වසරේ ජූනි මස අවසන් වන විට වාර්තා වී තිබූ රු. බිලියන 1,181.9 ක හිඟයට සාපේක්ෂව සියයට 30.0 ක අඩුවීමක් පිළිබිඹු කරමින් 2024 වසරේ ජූනි මස 30 වන විට මුළු මුදල් හිඟය රු. බිලියන 832.5 ක් විය. පුනරාවර්තන වියදම් සහ රාජ්‍ය ආයෝජන යන දෙඅංශයේම මුළු මුදල් ගලායාම පෙර වසරේ එම කාලසීමාවට වඩා සැලකිය යුතු ලෙස වෙනස් නොවුන ද, සමස්ත ණය ගැනීම් සියයට 13.3 කින් අඩු වී ඇති අතර ණය ආපසු ගෙවීම පෙර වසරට වඩා සියයට 21.2 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මීට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වෙළෙඳපොළ ණය ගැනීම් හරහා මූල්‍යකරණය කිරීමට තිබූ ණය සේවා ගෙවීම් සඳහා වැඩි වූ ආදායමෙන් කොටසක් යෙදවීම හේතුවෙනි. ඒ අනුව, 2024 වසරේ පළමු මාස හය අවසන් වන විට ධන මුදල් ශේෂය රු. බිලියන 646.7 ක් ලෙස පැවතීය.

## 2.5 රාජ්‍ය ණය කළමණාකරනය

වසර තුළ බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ බැංකු ප්‍රාග්ධනීකරණය ක්‍රියාත්මක කිරීම සඳහා කරන ලද ප්‍රතිපාදන ද ඇතුළත්ව 2024 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු දළ ණය ගැනීමේ සීමාව රු. බිලියන 7,350 ක් වේ. 2024 වසරේ ජනවාරි මස 01 සිට ජූනි මස 30 දක්වා කාලය සඳහා රජයේ ණය ගැනීම් හි භාවිතය රු. බිලියන 1,513.4 කි. මෙම කාල සීමාව තුළ දේශීය හා විදේශීය ව්‍යාපෘති/වැඩසටහන් ණය ගැනීම් පිළිවෙළින් රු. බිලියන 1,344.2 ක් සහ රු. බිලියන 169.2 ක් වූ අතර එය එම කාල සීමාව තුළ වූ ණය සේවා ගෙවීම් සහ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යනයට යෙදවුනි.


2024 වසරේ පළමු මාස හය තුළ ලබාගත් මුළු ණය ගැනීම්වලින් දළ වශයෙන් සියයට 89.0 ක් දේශීය ණය ගැනීම්වලින් සමන්විත විය. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර රජයේ දේශීය ණය ගැනීම්වල ප්‍රධාන මූලාශ්‍ර විය. ඒ අනුව, 2024 වසරේ පළමු මාස හය තුළ සමස්ත දේශීය ණය ගැනීම්වලින් සියයට 91.0 ක් පමණ රැස්කරගෙන ඇත්තේ භාණ්ඩාගාර බැඳුම්කර මගින් වන අතර, එය වසර තුළදී ගත් ණය ගැනීම්වල වටිනාකම අනුව සටහන් ව ඇති අතර, දේශීය ණය ගැනීම්වලින් සියයට 9.0 ක් භාණ්ඩාගාර බිල්පත් මඟින් නියෝජනය වන අතර, කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් මත මුදල් පිටතට ගලායාම සැකසීමෙන් පසු භාණ්ඩාගාර බිල්පත් හරහා ණය ගැනීම ශුද්ධ වටිනාකමින් සටහන්ව ඇත.

වගුව 2:18 දේශීය දළ ණය ගැනීම් (2024 ජනවාරි - ජූනි)

| ණය මෙවලම් | රු. බිලියන |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,198.5 |
| භාණ්ඩාගාර බිල්පත් | 58.2 |
| එකතුව | **1,256.7** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

**රූපසටහන 2.3 : දේශීය දළ ණය ගැනීම් (2024 ජනවාරි - ජුනි)**




*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**භාණ්ඩාගාර ඇපකර මත වගකීම් හෙළිදරව් කිරීම**

2024 වසරේ ජුනි මස 30 වන දිනට නිකුත් කර වලංගුව පැවති භාණ්ඩාගාර ඇපකරවල වටිනාකම රු. බිලියන 2,364.4 ක් වන අතර එවැනි ඇපකර මත ඇති හිඟ වගකීම රු. බිලියන 1,743.7 කි. 2024 වසරේ ජුනි මස 30 වන දිනට මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර ඇපකර ලැයිස්තුව 2.19 වගුවේ දක්වා ඇත.

**වගුව 2.19: 2024.06.30 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැංකු ඇපකර හා සහන ලිපි ලැයිස්තුව**

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | නිකුතු වටිනාකම රු. මිලියන 2024.06.30 දිනට | | හිඟ වටිනාකම රු. මිලියන 2024.06.30 දිනට | |
|---|---|---|---|---|---|---|
| 1 | ආසියානු සංවර්ධන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 124,141.32 | 139,658.99 | 96,069.86 | 111,587.53 |
| | | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 15,517.67 | | 15,517.67 | |
| 2 | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | ලංකා බැංකුව හා මහජන බැංකුව | 55,863.59 | 55,863.59 | 43,449.46 | 43,449.46 |
| 3 | ලංකා බැංකුව | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 500.00 | 430,761.19 | 500.00 | 282,258.22 |
| | | ලංකා විදුලිබල මණ්ඩලය | 4,540.00 | | 4,415.00 | |
| | | ලංකා ධීවර සංස්ථාව | 250.00 | | 158.62 | |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 100,000.00 | | 56,356.74 | |
| | | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 835.00 | | 103.90 | |
| | | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 200.00 | | 125.06 | |
| | | සීමාසහිත ලංකා කෝල් කම්පැනි පුද්ගලික සමාගම | 49,500.00 | | 2,764.00 | |
| | | සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනය | 8,600.00 | | 6,155.00 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 66,512.05 | | 40,284.30 | |
| | | සීමාසහිත නෝර්ත් සී ආයතනය | 38.63 | | 37.41 | |
| | | වී අලෙවි මණ්ඩලය | 374.50 | | 363.23 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 147,102.33 | | 118,836.92 | |
| | | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 93.00 | | 78.66 | |

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | නිකුතු වටිනාකම රු. මිලියන 2024.06.30 දිනට | | හිඟ වටිනාකම රු. මිලියන 2024.06.30 දිනට | |
|---|---|---|---|---|---|---|
| | | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 45,487.10 | | 45,487.10 | |
| | | රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව | 1,126.81 | | 990.52 | |
| | | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 2,400.00 | | 2,399.99 | |
| | | මිහින් ලංකා ලිමිටඩ් | 3,201.77 | | 3,201.77 | |
| 4 | චීන සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 51,211.58 | 51,211.58 | 70,180.19 | 70,180.19 |
| 5 | චයිනා නැෂනල් කෙමිකල් ඉංජිනියරින් නො. 14 කන්ස්ට්‍රක්ෂන් කම්පැනි ලිමිටඩ් | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 13,585.72 | 13,585.72 | 7,969.87 | 7,969.87 |
| 6 | කොමර්ෂල් බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 968.36 | 5,724.29 | 621.33 | 5,377.26 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 4,755.93 | | 4,755.93 | |
| 7 | ඩී. බී. ට්‍රස්ටීස් හොංකොං ලිමිටඩ් | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 54,311.83 | 54,311.83 | 54,311.83 | 54,311.83 |
| 8 | ඩී.එෆ්.සී.සී. බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 6,026.24 | 11,922.75 | 3,978.18 | 9,222.52 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 5,896.51 | | 5,244.34 | |
| 9 | චීන එක්සිම් බැංකුව | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 27,514.37 | 27,514.37 | 4,366.67 | 4,366.67 |
| 10 | ඉන්දියා එක්සිම් බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 79,667.69 | 79,667.69 | 47,291.64 | 47,291.64 |
| 11 | හැටන් නැෂනල් බැංකුව | සී /ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 4,000.00 | 43,279.73 | 4,000.00 | 33,278.08 |
| | | ලංකා විදුලිබල මණ්ඩලය | 3,818.64 | | 450.01 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 15,327.94 | | 8,694.92 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 20,133.15 | | 20,133.15 | |
| 12 | හොංකොන් ඇන්ඩ් ෂැංග්හයි බැංකුව | සී /ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 13,698.36 | 13,698.36 | 9,155.42 | 9,155.42 |
| 13 | චීනයේ කර්මාන්තත්ත හා වාණිජ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 13,026.27 | 13,026.27 | 8,233.67 | 8,233.67 |
| 14 | අයි. එන්. ජී. බැන්ක්, එන්. වී. ඔෆ් නෙදර්ලන්ඩ්ස් | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 27,667.49 | 27,667.49 | 23,787.83 | 23,787.83 |
| 15 | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) | සී /ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 144,203.71 | 144,203.71 | 31,053.31 | 31,053.31 |
| 16 | ජාතික සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 21,380.43 | 27,679.63 | 16,109.02 | 22,408.86 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 6,299.21 | | 6,299.84 | |
| 17 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 5,000.00 | 199,709.66 | 5,000.00 | 183,796.15 |
| | | ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 40,563.39 | | 33,377.22 | |

| අනු අංකය | බැංකුව හෝ ආයතනයේ නම | ආයතනයේ නම | නිකුතු වටිනාකම රු. මිලියන 2024.06.30 දිනට | | හිඟ වටිනාකම රු. මිලියන 2024.06.30 දිනට | |
|---|---|---|---|---|---|---|
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 32,710.61 | | 29,813.74 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 114,415.66 | | 113,582.32 | |
| | | ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව | 3,500.00 | | 1,200.87 | |
| | | ටෙක්නො පාර්ක් ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 750.00 | | 750.00 | |
| | | නාගරික සංවර්ධන අධිකාරිය | 2,770.00 | | 72.00 | |
| 18 | මහජන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 15,333.33 | 177,816.02 | 14,195.65 | 141,799.47 |
| | | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 2,397.48 | | 1,800.05 | |
| | | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 22,317.65 | | 15,384.21 | |
| | | සීමාසහිත ලංකා සතොස | 8,241.00 | | 4,226.53 | |
| | | ජාතික කඩදාසි සංස්ථාව | 140.00 | | 62.77 | |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 7,107.12 | | 3,468.83 | |
| | | වී අලෙවි මණ්ඩලය | 760.75 | | 759.08 | |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 57,255.95 | | 46,074.29 | |
| | | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 100.00 | | 96.30 | |
| | | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 59,045.97 | | 51,354.55 | |
| | | රාජ්‍ය මුද්‍රණ සංස්ථාව | 1,165.00 | | 524.52 | |
| | | ටෙක්නො පාර්ක් ඩිවලොප්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 750.00 | | 750.00 | |
| | | මිහින් ලංකා ලිමිටඩ් | 3,201.77 | | 3,102.69 | |
| 19 | සම්පත් බැංකුව පී. එල්. සී. | මාර්ග සංවර්ධන අධිකාරිය | 14,500.00 | 14,500.00 | 11,204.55 | 11,204.55 |
| 20 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 3,724.24 | 3,724.24 | 3,724.24 | 3,724.24 |
| 21 | සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | සීමාසහිත නෝර්ත් සී ආයතනය | 60.00 | 60.00 | 58.51 | 58.51 |
| 22 | යුනික්‍රෙඩිට් බෑංක් ඔස්ට්‍රියා AG | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 16,876.95 | 16,876.95 | 13,608.29 | 13,608.29 |
| 23 | ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) | සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් | 3,600.10 | 3,600.10 | 3,600.10 | 3,600.10 |
| 24 | ඉන්දියානු සංචිත බැංකුව | ශ්‍රී ලංකා මහ බැංකුව | 807,362.39 | 807,362.39 | 621,150.07 | 621,150.07 |
| 25 | වී අලෙවි මණ්ඩලය | සමුපකාර තොග ආයතනය | 880.00 | 880.00 | 729.60 | 729.60 |
| 26 | අපනයන සංවර්ධන මණ්ඩලය | ලංකා බැංකුව හා මහජන බැංකුව | 60.00 | 60.00 | 60.00 | 60.00 |
| | | එකතුව | **2,364,366.55** | | **1,743,663.34** | **1,743,663.34** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

# 3 වන පරිච්ඡේදය

# රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය

## 3.1 සමාලෝචනය

විදුලිය සහ ඉන්ධන සඳහා පිරිවැය පිළිබිඹු කරන මිල සූත්‍රය හඳුන්වා දීම, තෝරාගත් ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්ගේ ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සහ පුද්ගලික අංශයේ තවත් සමාගම්වලට ඛනිජ තෙල් අංශයට ඇතුළු වීමට ඉඩ සැලසීම ඇතුළුව මූලික ප්‍රතිසංස්කරණ රාජ්‍ය ව්‍යවසායයන්හි ආරම්භ විය. එම ප්‍රතිසංස්කරණයන්හි ප්‍රතිලාභ වශයෙන් ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 විසින් 2023 වසරේ පළමු මාස හය තුළ වාර්තා කළ රු. බිලියන 193.5ක සමස්ත ලාභයට සාපේක්ෂව 2024 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 280.7ක සමස්ත ලාභයක් වාර්තා කර ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ උත්පාදන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අදියරයන් සඳහා මෙහෙයුම් සහ මූල්‍ය ස්වාධීනත්වයක් ඇති කිරීමේ අරමුණු ඇතිව 2024 අංක 36 දරන විදුලිබල පනත 2024 වර්ෂයේ ජූනි මාසයේදී බලාත්මක විය. එසේම, ඉහත අදියරයන් තුන සඳහා පුද්ගලික අංශයේ සහභාගීත්වයට ඉඩ සලසන අතරම, විදුලිබල අංශයේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කිරීම මෙම පනත මඟින් අපේක්ෂා කෙරේ. මේ අතර, 2024 වසරේ මැයි මස 08 වන දින ආර්. එම්. පාර්ක්ස් සමාගම විසින් ඛනිජතෙල් සිල්ලර වෙළඳපොළ තුළ සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. මෙමඟින් ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් සිල්ලර වෙළඳපොළේ තරඟකාරිත්වය ඉහළ යනු ඇති අතර, පාරිභෝගිකයන්ට වාසිදායක වන ලෙස සේවා ප්‍රමිතීන් ද වැඩිදියුණු වනු ඇත.

යහපාලනය, අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය ඉහළ නැංවීම වෙනුවෙන් රාජ්‍ය බැංකු ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2024 වසරේ අප්‍රේල් මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ පරිදි විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටියක් යටතේ රාජ්‍ය බැංකු සඳහා ස්වාධීන අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම සඳහා වෘත්තිකයන්ගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදී. තවද, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ රාජ්‍ය බැංකු අධීක්ෂණය සඳහා විශේෂිත ඒකකයක් ස්ථාපිත කෙරෙමින් පවතී. 2024 වසරේ මාර්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ඇ.ඩො. මිලියන 210 ක සහ රු. බිලියන 31.4 ක (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 100 කට සමාන අගයක) භාණ්ඩාගාර ඇපකර සහිත ණය රජයේ ශේෂ පත්‍රයට පවරා ගැනීමට අනුමැතිය ලබාදෙන ලදී.

රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් 2023 වසරේ පළමු මාස හය තුළ අයබදු සහ ලාභාංශ එකතු කිරීම රු. බිලියන 13.7 ක් වූ අතර, එය 2024 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 14.9 ක් දක්වා වැඩි විය.

## 3.2 රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය

### ලංකා බැංකුව

2023 වසර අවසන් වන විට රු. බිලියන 4,412 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2024 වසරේ ජූනි මස අවසන් වන විට රු. බිලියන 4,423 ක් දක්වා ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. 2023 වසරේ අවසානය වන විට රු. බිලියන 3,882 ක් වූ බැංකුවේ තැන්පතු පදනම 2024 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 3,832 ක් දක්වා සියයට 1.3 කින් පහළ ගොස් ඇත. 2023 වසරේ අවසානය වන විට සියයට 5.07 ක් වූ දළ අක්‍රීය ණය අනුපාතය 2024 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 5.68 ක් දක්වා සුළු වශයෙන් පිරිහීමට ලක් වී ඇත. 2023 වසරේ පළමු මාස හය තුළ වාර්තා කරන ලද රු. බිලියන 10.5 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය සඳහා සැලකිය යුතු වර්ධනයක් සමඟ ලංකා බැංකුව රු. බිලියන 22.4 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

### මහජන බැංකුව

2023 වසර අවසන් වන විට රු. බිලියන 3,038 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2024 වසරේ ජූනි මස අවසන් වන විට රු. බිලියන 3,195 ක් දක්වා සියයට 5.2 කින් වර්ධනය වී ඇත. 2023 වසරේ අවසානය වන විට රු. බිලියන 2,653 ක් වූ බැංකුවේ තැන්පතු ප්‍රමාණය 2024 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 2,794 ක් දක්වා සියයට 5.3 කින් වැඩිවී ඇත. 2023 වසර අවසන් වන විට ණය හා අත්තිකාරම් රු. බිලියන 1,709 ක් ලෙස පැවතුන ද, එම අගය 2024 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,747 ක් දක්වා සියයට 2.2 කින් ඉහළ ගොස් ඇත. 2023 වසර අවසන් වන විට සියයට 8.83 ක් වූ දළ අක්‍රීය ණය අනුපාතය 2024 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 8.51 ක් දක්වා සුළු වශයෙන් වැඩි දියුණු වී ඇත. 2023 වසරේ පළමු මාස හය තුළ වාර්තා කළ රු. බිලියන 6.6 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ මහජන බැංකුව රු. බිලියන 2.6 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර, එය සියයට 60.4 ක පහළ යාමකි.

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2023 වසර අවසන් වන විට රු. බිලියන 1,687 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම 2024 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,692 ක් දක්වා ආන්තිකව ඉහළ ගොස් ඇත. 2023 වසර අවසානය වන විට රු. බිලියන 1,483 ක්ව පැවති තැන්පතු පදනම 2024 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,495 ක් දක්වා සියයට 0.8 කින් සුළු වශයෙන් වර්ධනය වී ඇත. 2023 වසර අවසානය වන විට රු. බිලියන 527 ක් ලෙස පැවති ණය හා අත්තිකාරම් කළඹ 2024 වසරේ ජූනි මස

අවසානය වන විට රු. බිලියන 515 ක් දක්වා සියයට 2.2 කින් පහළ ගොස් ඇත. 2023 වසරේ පළමු මාස හය තුළ වාර්තා කළ රු. මිලියන 582 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව රු. මිලියන 14,996 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

### සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

2024 වසරේ පළමු මාස හය තුළ සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රු. බිලියන 1.8 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි පූර්ණ හිමිකාරිත්වයක් සහිත පරිපාලිත සමාගම් වන සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම හා සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගම පිළිවෙළින් රු. බිලියන 15.3 ක හා රු. බිලියන 1.3 ක බදු පෙර ලාභයක් 2024 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා කර ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්තියට අනුව සුදුසුකම් සඳහා ඉල්ලීම් කැඳවමින් සමාගමෙහි රජය සතු කොටස් අයිතිය බැහැර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර, ලංසුකරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ කටයුතු අවසන් කර ඇත.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ලංකා හොස්පිටල් පී.එල්.සී., ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්, ලිට්රෝ ගෑස් ලංකා ටර්මිනල් ලිමිටඩ් හා කැන්විල් හෝල්ඩින්ග් (පෞද්.) සමාගම් හි සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු කොටස් අයිතිය මහා භාණ්ඩාගාරය වෙත පැවරීම මේ වන විට සිදු කෙරෙමින් පවතී.

### ලංකා විදුලිබල මණ්ඩලය

2024 වසරේ පළමු මාස හය තුළ විදුලිබලය සඳහා වූ ඉල්ලුම 2023 වසරේ පළමු මාස හය හා සැසඳීමේදී ගිගාවොට් පැය 6,975 ක සිට ගිගාවොට් පැය 7,487 ක් දක්වා සියයට 7.3 කින් වැඩිවීම මූලිකවම හේතු කොටගෙන, 2023 වසරේ පළමු මාස හය හා සැසඳීමේදී 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ විදුලි අලෙවියෙන් උපයාගත් ආදායම රු. බිලියන 296.8 ක සිට රු. බිලියන 314.4 ක් දක්වා සියයට 5.9 කින් සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. රුපියල ශක්තිමත් වීම හේතුවෙන් ගල් අඟුරු මිල පහළ යාම හා පැවති හිතකර කාළගුණික තත්ත්වය හේතුවෙන් 2023 වසරේ පළමු මාස හය හා සැසඳීමේදී 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) සෘජු උත්පාදන පිරිවැය රු. බිලියන 233.6 ක සිට රු. බිලියන 158.1 ක් දක්වා සියයට 32 ක සැළකිය යුතු අගයකින් පහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ලංවිම 2023 වසරේ පළමු මාස හය තුළ වාර්තා කල රු. බිලියන 17.8 ක දළ ලාභයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 99.7 ක දළ ලාභයක් වාර්තා කර ඇත. 2023 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 13.7 ක් වූ ශුද්ධ අලාභයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලංවිමෙහි අනුබද්ධිත සමාගමක් වන ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ් හි කොටස් විකිණීමෙන් ලද රු. බිලියන 26 ක ලාභයත් සමග රු. බිලියන 119.2 ක බදු පෙර ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

2023 වසරේ පළමු මාස හය තුළ උත්පාදන සංයුතිය තාප (ගල් අඟුරු)ඃ ජලඃ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති, සුළං සහ වහළමත සවිකල සූර්ය බලශක්තියඃ තාප (ඉන්ධන) සියයට 38ඃ 22ඃ 17ඃ 23 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය සඳහා 36:30:18:16 වශයෙන් වාසිදායක ලෙස වෙනස් වී ඇත. ඒ අනුව, විකුණුම් ස්ථානයේ ඒකකයක පිරිවැය 2023 වසරේ පළමු මාස හය තුළ පැවති කි.වො. පැයට රු. 45.48 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ කි.වො. පැයට රු. 31.12 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ස්වාධීන බලශක්ති ගැනුම්කරුවන් සඳහා 2023 වසර අවසන් වන විට ගෙවිය යුතුව පැවති රු. බිලියන 79.2 ක් වූ සමස්ත හිඟ මුදල් 2024 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 78 කින් රු. බිලියන 17.4 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇත. කෙසේ වුවද, 2023 වසර අවසානය වන විට රු. බිලියන 263.6 ක් වූ ගෙවිය යුතු ණය, ව්‍යාපෘති ණය වැඩිවීම හේතුවෙන් 2024 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 9.8 කින් රු. බිලියන 289.4 ක් දක්වා වැඩි වී ඇත.

2024 වසරේ සිදුකල ගාස්තු සංශෝධනයන් දෙක හේතුවෙන් 2024 වසරේ මාර්තු මස සියයට 21.9 කින් සහ 2024 වසරේ ජූලි මස සියයට 22.5 කින් සාමාන්‍ය පිරිවැය පිළිබිඹු කරන විදුලි ගාස්තුව අඩු වී ඇත.

තවද, නව විදුලිබල පනතේ විධිවිධාන ප්‍රකාරව ජාතික විදුලිබල උපදේශක සභාව (NEAC) සහ ජාතික පද්ධති ක්‍රියාකරු (NSO) සඳහා නව පත්වීම් සිදුකිරීමට සහ අදාළ අනෙකුත් මූලික කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ජාත්‍යන්තර වෙළෙඳපොළේ බොරතෙල්වල සාමාන්‍ය ආනයන මිල ඉහළ ගියද, නව ආයෝජකයින් වෙළෙඳපොළට ප්‍රවේශ වීම හේතුවෙන් ප්‍රධාන වශයෙන්ම ආනයන ප්‍රමාණය පහත වැටීම හේතු කොට ගෙන, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2023 වසරේ පළමු මාස හය තුළ ඇ.ඩො. මිලියන 1,380 ක් වූ ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන පිරිවැය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 1,235 ක් දක්වා අඩු වී ඇත.

ආනයන පිරිවැය අඩුවීම මත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2023 වසරේ පළමු මාස හය තුළ විකුණුම් පිරිවැය වූ රු. බිලියන 564.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ විකුණුම් පිරිවැය රු. බිලියන 467.7 ක් දක්වා සියයට 17.2 කින් අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2023 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 681.5 ක් වූ පිරිවැටුමට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පිරිවැටුම රු. බිලියන 544.3 ක් දක්වා සියයට 20.1 කින් කැපී පෙනෙන ලෙස අඩු වී ඇත. එබැවින්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2023 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 69.5 ක් වූ ලාභය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 20.7 ක් දක්වා සියයට 70.2 කින් තියුණු ලෙස අඩු වී ඇත.

තවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකා බැංකුව හෝ මහජන බැංකුව වෙත ගෙවිය යුතු කිසිදු හිඟ ශේෂයක් නොමැති අතර, ජාතික ඉරාන තෙල් සමාගමට 2023 වසරේ දෙසැම්බර් මස 31 දිනට ගෙවිය යුතුව පැවති ඇ.ඩො. මිලියන 230.9 ක මුදල 2024 වසරේ ජූනි මස අවසන් වන විට ඇ.ඩො. මිලියන 191 ක් දක්වා අඩු වී ඇත.

### සී/ස ශ්‍රීලංකන් ගුවන් සමාගම

සාම්ප්‍රදායික මෙහෙයුම් ගැටලු සහ අතීත ණය මත ඉහළ ගොස් ඇති මූල්‍ය පිරිවැය යන කරුණුවල බලපෑම හේතුවෙන් ශ්‍රීලංකන් ගුවන් සමාගම අඛණ්ඩ මුදල් ප්‍රවාහ අභියෝගයන්ට මුහුණ දී සිටී. ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් නිරතුරුව ස්කන්ධ ප්‍රාග්ධනය ලබාදීම සහ ණය සුරැකුම් ලබාදීම වැනි වෙනත් ක්‍රියාමාර්ගද අනුගමනය කර ඇත.

ජාතික ගුවන් ප්‍රවාහකයා සුරක්ෂිත කිරීම අරමුණු කොටගෙන සමාගමෙහි මුදල් ප්‍රවාහ දුෂ්කරතා අවම කිරීම සඳහා රජය විසින් 2024 වසරේ පළමු මාස හය තුළ දී හිමිකම් දායකත්වයක් ලෙස රු. බිලියන 5 ක් ලබාදී ඇත. අභියෝගාත්මක බාහිර හා අභ්‍යන්තර අරමුදල් සම්පාදන අවහිරතා මධ්‍යයේ වුවද, ශ්‍රීලංකන් ගුවන් සමාගම 2024/25 මූල්‍ය වර්ෂයේ පළමු මාස තුන තුළ දී උපයන ලද සමස්ත ආදායම රු. බිලියන 63.8 ක් වූ අතර, එය 2023/24 වර්ෂයේදී ඉපයූ රු. බිලියන 73.1 ක සමස්ත ආදායමට සාපේක්ෂව සියයට 12.7 ක අඩු වීමකි. 2023/24 මූල්‍ය වර්ෂයේ පළමු මාස තුන තුළ වාර්තා වූ රු. බිලියන 8 ක් වූ බදු පෙර ලාභය (මූල්‍ය වියදම් හා විනිමය වෙනස්වීම් හැර) හා සැසඳීමේදී 2024/25 මූල්‍ය වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ සමාගම විසින් වාර්තා කර ඇත්තේ රු. බිලියන 0.6 ක බදු පෙර ලාභයක් පමණි. මූල්‍ය වියදම් හා විනිමය පරිවර්තන වෙනස්වීම් ගැලපීමෙන් පසු, ශ්‍රීලංකන් ගුවන් සමාගම් සමූහය පෙර මූල්‍ය වර්ෂයේ පළමු මාස තුන තුළ වාර්තා කළ රු. බිලියන 25.8 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව 2024/25 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 12.9 ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත.

### ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2023 වසරේ ජූනි මස අවසානය වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කළ නළ ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙලින් සියයට 61.0 ක් සහ සියයට 96.7 ක් වූ අතර, එයට සාපේක්ෂව 2024 වසරේ ජූනි මස අවසානය වන විට නළ ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙළින් සියයට 62.4 ක් සහ සියයට 98.1 ක් දක්වා ඉහළ නැංවීමට සමත් වී ඇත.

2024 වසරේ ජූනි මස අවසානය වන විට සම්බන්ධතා මිලියන 3.08 කට ළඟා වෙමින් ආසන්න වශයෙන් නව ජල සම්බන්ධතා 81,000 ක් 2024 වසරේ පළමු මාස හය තුළ පද්ධතියට එක් කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් වී ඇත. ජලය සඳහා නව ගාස්තුවක් ක්‍රියාත්මක කිරීමත් සමඟ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2024 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 42.8 ක ආදායමක් වාර්තා කර ඇති අතර, එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ ආදායම වන රු. බිලියන 25.2 ට සාපේක්ෂව සියයට 69.8 ක වර්ධනයකි. එසේම, විදුලි ගාස්තු සහ අනෙකුත් ද්‍රව්‍ය පිරිවැය ඉහළ යාමත් සමඟ, 2023 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 14.8 ක් වූ විකුණුම් පිරිවැය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 18.7 ක් දක්වා සියයට 26.3 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සලකා බලන මෙම කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 24.1 ක දළ ලාභයක් වාර්තා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2023 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා කළ රු. බිලියන 2.5 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 13.8 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2023 වසරේ පළමු මාස හය තුළ නිෂ්පාදනය කළ ජලය ඝන මීටර් මිලියන 399 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ජලය ඝන මීටර් මිලියන 414 ක් නිෂ්පාදනය කර ඇති අතර, 2023 වසරේ පළමු මාස හය තුළ සිදු කළ ඝන මීටර් මිලියන 298 ක ජල අලෙවියට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ජල අලෙවිය ඝන මීටර් මිලියන 313 කි. තවද, ආදායම් නොලබන ජලය මෙම කාලසීමාව තුළ පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, 2023 වසරේ පළමු මාස හය තුළ දී වූ සියයට 25.41 ට සාපේක්ෂව එම අගය සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී සියයට 24.39 ක් ලෙස වාර්තා වී ඇත. එසේම, දේශීය බැංකුවල ණය ආපසු ගෙවීම සඳහා සහ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල වගකීම් පියවීමට සහාය වීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. බිලියන 13.1 ක හිමිකම් ප්‍රාග්ධන දායකත්වයක් ලබා දී ඇත.

මීට අමතරව, ජල අංශයේ ප්‍රතිසංස්කරණ සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්ති පාදක ණය ක්‍රමය යටතේ එක් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් ලෙස, 2024 වසරේ ජූලි මස 25 වන දින මහා භාණ්ඩාගාරය, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර ත්‍රෛපාර්ශවික ගිවිසුමක් වන ආයතනික අභිප්‍රාය ප්‍රකාශය අත්සන් කරන ලදී. මීට අමතරව , විදුලි ගාස්තු අඩු කිරීම සලකා බලා, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2024 වසරේ අගෝස්තු මස 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෘහස්ථ, රෝහල්, පාසල් සහ අනෙකුත් පුණ්‍ය ආයතන සඳහා ජල ගාස්තුව සියයට 5.94 ක සමස්ත සාමාන්‍ය අනුපාතයකින් අඩු කර ඇත.

### ශ්‍රී ලංකා වරාය අධිකාරිය

රතු මුහුදේ අර්බුදය සහ එහි ප්‍රතිවිපාක ඇතුළු විවිධ සාධක හේතුවෙන් 2024 වසරේ පළමු මාස හය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් බහාලුම් භාණ්ඩ අඩි විස්සේ බහාලුම් ඒකක 1,207,675 ක් සහ සම්ප්‍රදායික නැව් බඩු ඒකක මෙට්‍රික්ටොන් 4,747,911 ක් මෙහෙයවා ඇති අතර, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව එය පිළිවෙළින් සියයට 18 ක සහ සියයට 22 ක වර්ධනයකි. 2024 වසරේ පළමු මාස හය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම

රු. බිලියන 36.9 ක් වූ අතර, එයින් සියයට 46 ක් හෙවත් රු. බිලියන 17.1 ක් නැව් භාණ්ඩ වාහක හරහා උපයා ඇති අතර, සියයට 27 ක් හෙවත් රු. බිලියන 9.9 ක් නාවික ආදායමින් ද, සියයට 12 ක් හෙවත් රු. බිලියන 4.3 ක්, වාප්පු මෙහෙයුම් වලින් ද උපයාගෙන ඇත.

2023 වසරේ පළමු මාස හය තුළ පැවති රු. බිලියන 19.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ අධිකාරිය විසින් රු. බිලියන 18.4 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර ඇත. 2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට සාමූහික ගිවිසුම සංශෝධනය කිරීමෙන් සිදුවූ වැටුප් පිරිවැය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන පුද්ගල පාරිශ්‍රමික සහ අතිකාල වියදම පිළිවෙළින් රු. බිලියන 10.1 ක් සහ රු. බිලියන 4 ක් ලෙස වාර්තා කර ඇති අතර, එය අධිකාරියේ මුළු වියදමින් සියයට 58.4 ක් වේ. 2023 වසරේ පළමු මාස හය තුළ වාර්තා කළ රු. බිලියන 21.8 ක බදු පෙර ලාභය හා සැසඳීමේදී 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය රු. බිලියන 19.8 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර, එය සියයට 9.2 ක පහළ යාමකි.

### ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

රජයේ විදෙස් ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ තීරණයත් සමඟ, 2022 වසරේ දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ 2 වැනි පර්යන්තය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය අතරමග නතර කළ අතර, ඒ වන විට ජපන් කොන්ත්‍රාත්කරු විසින් අර්ධ වශයෙන් නිම කර තිබූ උපව්‍යුහගත වැඩ කටයුතු අවසන් කිරීම සඳහා ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ කළමනාකාරීත්වය විසින් සැලැස්මක් සකස් කරන ලදී. ඒ අනුව, මූලික ව්‍යාපෘතිය සඳහා පත් කළ උපදේශකවරයාගේ සෘජු අධීක්ෂණය යටතේම, දේශීය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ අරමුදල් භාවිතා කරමින් ඉතිරි වැඩ නිම කිරීම මෙම සැලැස්මට ඇතුළත් විය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගුවන් තොටුපළෙහි පවතින ධාරිතාව දැනටමත් ඉක්මවා ඇති බැවින් මෙම ව්‍යාපෘතිය නිම කිරීම ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ ඉදිරි පැවැත්මට ඉතාමත් වැදගත් වේ.

2024 වසරේ පළමු මාස හය තුළ ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ මුළු ආදායම රු. මිලියන 20,823 ක් වූ අතර, එය රු. මිලියන 3,924 ක ගගනගාමී ආදායමින් ද, රු. මිලියන 16,824 ක ගගනගාමී නොවන ආදායමින් ද, රු. මිලියන 74 ක අනෙකුත් ආදායමින් ද සමන්විත වේ. 2024 වසරේ පළමු මාස හය තුළ මුළු වියදම රු. මිලියන 12,400 ක් වූ අතර, ඉන් සියයට 55 ක් 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී ක්‍රියාත්මක කරන ලද ගුවන් ගමන් පාලකවරුන්ගේ වැටුප් වැඩිකිරීම හා මහා භාණ්ඩාගාරය විසින් 2024 වසරේ දී ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ අනෙකුත් කාර්ය මණ්ඩල වැටුප් වැඩිකිරීම අනුමත කිරීම හේතුවෙන් වන රු. මිලියන 6,809 ක් වූ පුද්ගල වියදම් මගින් නිරූපණය වේ. 2024 වසරේ පළමු මාස හය තුළ වාර්තා කළ මූල්‍ය ආදායම හා විදේශ විනිමය හුවමාරු ලාභ පිළිවෙළින් රු. මිලියන 4,315 ක් හා රු. මිලියන 4,587 කි. ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම 2024 වසරේ පළමු මාස හය තුළ බදු පෙර ලාභය ලෙස රු. මිලියන 17,324 ක් වාර්තා කරන ලද අතර, එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. මිලියන 19,885 ට සාපේක්ෂව සියයට 13 ක අඩුවීමකි.

වගුව 3.1 : රජය සතු ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්වල ප්‍රතිසංස්කරණ/ගෙන ඇති ප්‍රධාන පියවර

| ආයතනය | ප්‍රතිසංස්කරණ/ගෙන ඇති ප්‍රධාන පියවර |
|---|---|
| රාජ්‍ය බැංකු | • ණය කළඹේ සමස්ත ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ අධීක්ෂණය සහ නැවත අයකරගැනීම වර්ධනය කිරීම.<br>• කාලීන නියාමන අවශ්‍යතා සමඟ යාවත්කාලීන වීම, අත්‍යවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සහ විනිවිද පෙනෙන වාර්තාකරණ භාවිතයන් පවත්වාගෙන යාම.<br>• මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ඩිජිටල් තාක්ෂණ හා අනුගතවීම, පාරිභෝගික සේවා ඉහළ නැංවීම සහ පාරිභෝගිකයන් වෙත ළඟාවීම ඉහළ නැංවීම.<br>• දැනට සිටින පාරිභෝගිකයින්ට සහය දීමට සහ නව පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා නව නිෂ්පාදිත සංවර්ධනය කිරීම.<br>• අඩු පහසුකම් සහිත ප්‍රජාව වෙත මූල්‍ය සේවා ලබාදීම පුළුල් කිරීම හා මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම.<br>• වෙළෙඳපොළ තුළ රාජ්‍ය බැංකු වඩාත් තරඟකාරී තත්ත්වයට පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පාලන සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීම. |

| ආයතනය | ප්‍රතිසංස්කරණ/ගෙන ඇති ප්‍රධාන පියවර |
|---|---|
| සී/ස ශ්‍රීලංකන් ගුවන් සමාගම | • භාණ්ඩාගාර ඇපකර සහිත ඇ.ඩො. මිලියන 310 ක ණය වගකීම් ශ්‍රී ලංකා රජයේ ශේෂ පත්‍රයට පවරා ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.<br>• කාරක ප්‍රාග්ධන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙත රු. බිලියන 5 ක හිමිකම් ප්‍රාග්ධනයක් ලබාදෙන ලදී. |
| ලංකා විදුලිබල මණ්ඩලය | • ලංකා විදුලිබල මණ්ඩලයෙහි උත්පාදන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම යන අංශ වෙන් කිරීම තුළින් එම අංශ අතර ස්වාධීනත්වයක් හා විනිවිදභාවයක් තහවුරු කිරීම අපේක්ෂා කරමින් ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත 2024 වර්ෂයේ ජූනි මස 6 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.<br>• ජාතික විදුලිබල උපදේශන සභාවේ (NEAC) සහ ජාතික පද්ධති ක්‍රියාකරුගේ (NSO) නව පත්වීම් සඳහා සහ ශ්‍රී ලංකා විදුලිබල පනත ප්‍රකාරව ඇති අනෙකුත් මූලික කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | • කාර්යය සාධන දර්ශක ලඟාකර ගැනීමේ කොන්දේසි වලට යටත්ව ඉදිරි වසර තුන වෙනුවෙන් අධිකාරියේ සේවකයන් සඳහා වන සාමූහික ගිවිසුම අනුමත කර අත්සන් කරන ලදී. |
| සී/ස ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම | • සී/ස ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ වැටුප් විෂමතා ගැටළු විසඳීම සඳහා 2024 වර්ෂයේ දී ගුවන් ගමන් පාලකවරුන් හැර, අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා වෙනම වැටුප් ව්‍යුහයක් අනුමත කරන ලදී.<br>• සංචාරක ව්‍යාපාරයේ පුළුල් වන ඉල්ලුම සපුරාලීම සඳහා සහ ගුවන් තොටුපළේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවකයන් බඳවා ගැනීම අනුමත කරන ලදී. |

*මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

### වගුව 3.2 : ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි ලාභදායිත්වය

| රාජ්‍ය ව්‍යවසාය | 2022 | 2023[a] | 2024.06.30 [අ] දිනට |
|---|---|---|---|
| ලංකා බැංකුව | 30,977 | 40,342 | 22,373 |
| මහජන බැංකුව | 21,338 | 15,345 | 17,432 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 4,510 | 6,117 | 14,996 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු | (89) | (1,043) | 70 |
| නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 303 | 2,465 | 322 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 359 | 1,388 | 492 |
| සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | 43,428 | 64,959 | 30,182 |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 23,494 | 29,272 | 1,753 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 8,530 | 12,547 | 8,056 |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 711 | 1,056 | 483 |
| කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 2,651 | 1,043 | 1,284 |
| ලංකා විදුලිබල මණ්ඩලය | (298,189) | 61,236 | 119,209 |
| ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | (617,588) | 120,346 | 20,706 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 57,027 | 40,359 | 19,823 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | (2,701) | 5,286 | 13,767 |
| සීමාසහිත ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රීලංකා) (පුද්ගලික) සමාගම | 6,434 | 33,640 | 17,324 |

| රාජ්‍ය ව්‍යවසාය | 2022 | 2023[a] | 2024.06.30 [අ] දිනට | |
|---|---|---|---|---|
| සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම | (73,264) | 1,124 | (13,707) | * |
| ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 1,421 | 2,189 | (1,373) | |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | (1,269) | (2,458) | (420) | |
| ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 69 | 748 | 106 | |
| රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 27 | (579) | (64) | |
| සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | (392) | (216) | 89 | |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 133 | (122) | 667 | |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 19 | (92) | 0.07 | |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 20 | (156) | 50 | |
| සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම | 511 | 534 | 162 | |
| සීමාසහිත හලාවත වැවිලි සමාගම | 514 | 303 | 129 | |
| සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව | 346 | 94 | 1 | |
| ශ්‍රී ලංකා කජු සංස්ථාව | 17 | (5) | 3 | |
| සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම | 6,160 | 4,050 | 423 | |
| සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 61 | 347 | 190 | |
| සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 57 | 38 | 13 | |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 3,267 | 3,516 | 2,031 | |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 1,390 | 844 | 649 | |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 1,586 | 2,522 | 1,685 | |
| ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | (26) | 218 | 219 | |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | (2,285) | 1,272 | 1,500 | |
| ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 247 | 304 | 567 | |
| සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය | (370) | (205) | (26) | |
| ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | (541) | (342) | (58) | |
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | (235) | (532) | (38) | |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | (99) | 65 | 72 | |
| රාජ්‍ය දැව සංස්ථාව | 1,016 | 1,274 | 6 | |
| ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | 735 | 901 | 89 | |
| සීමාසහිත ලංකා සතොස සමාගම | (687) | 115 | 93 | |
| රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | (380) | 2,794 | (206) | |
| ලංකා ධීවර සංස්ථාව | (193) | 4 | (14) | |
| ලංකා ධීවර වරාය නිෂ්පාදන නීතිගත සංස්ථාව | 364 | 637 | (26) | |
| සීමාසහිත ලංකා පොහොර සමාගම | 113 | 61 | 205 | |
| සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 501 | 162 | 259 | |
| සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම | (633) | (784) | (202) | |
| සීමාසහිත ලංකා සීනි සමාගම | 6,045 | 2,828 | (672) | |
| **එකතුව** | **(774,560)** | **455,811** | **280,674** | |

*මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

** 2024 - අප්‍රේල් - ජූනි*

වගුව 3.3: රාජ්‍ය ව්‍යාපාර වෙතින් ලද අයබදු / ලාභාංශ ආදායම

රු. මිලියන

| රාජ්‍ය ව්‍යවසාය | 2022 | 2023 | 2024.06.30 දිනට |
|---|---|---|---|
| අයබදු | **22,004** | **60,497** | **12,937** |
| මහජන බැංකුව | 441 | – | – |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | – | 5,000 | 5,000 |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම | 13,200 | 23,000 | 2,000 |
| රාජ්‍ය දැව සංස්ථාව | 320 | 641 | – |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 100 | 300 | – |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 1,608 | 2,000 | 1,460 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 1,000 | 2,000 | 768 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 35 | 390 | – |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 416 | 533 | 467 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 361 | 1,000 | 200 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 10 | 40 | 13 |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 50 | 620 | 35 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | – | 500 | 500 |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 1,000 | 4,000 | – |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 350 | – | 100 |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 290 | 150 | 700 |
| ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 1,200 | 7,000 | – |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 10 | 300 | 200 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | – | 75 | – |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන අධිකාරිය | – | 500 | – |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 1,015 | 8,066 | – |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 400 | 646 | 687 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | – | 75 | – |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | – | 350 | 15 |
| සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | 50 | 200 | - |
| ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික ආයතනය | 33 | 115 | 85 |
| පශ්චාත් උපාධි අධ්‍යයන කළමනාකරණ ආයතනය | 90 | 25 | 4 |
| නාගරික සංවර්ධන අධිකාරිය | – | – | 345 |
| වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් | 25 | 2,971 | 358 |
| **ලාභාංශ** | **6,087** | **15,204** | **1,971** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 30 | – |
| ලංකා බැංකුව | 346 | 173 | – |
| මහජන බැංකුව | 316 | 158 | – |
| ජාතික සංවර්ධන බැංකුව | 1 | – | – |
| සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,511 | 2,272 | – |
| සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | 500 | 5,500 | – |

රු. මිලියන

| රාජ්‍ය ව්‍යවසාය | 2022 | 2023 | 2024.06.30 දිනට |
|---|---|---|---|
| සීමාසහිත ලංකා ඛණිජ වැලි සමාගම | 759 | 2,500 | – |
| සීමාසහිත ලංකා පොස්පේට් සමාගම | 20 | 220 | 75 |
| සීමාසහිත ලංකා ලේලන්ඩ් සමාගම | 13 | 6 | – |
| සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | – | 125 | 75 |
| සීමාසහිත මන්තායි සෝල්ට් සමාගම (සී/ස ජාතික ලුණු සමාගම) | – | 120 | – |
| සීමාසහිත ලංකා පොහොර සමාගම | 15 | 22 | – |
| සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 10 | 60 | – |
| සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම | 50 | 305 | 49 |
| සීමාසහිත රජයේ වාණිජ නීතිගත සංස්ථාව | 11 | 150 | 40 |
| සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 1,805 | 223 | – |
| සීමාසහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 313 | – | 1,324 |
| සීමාසහිත ලංකා විදුලිබල සමාගම | 218 | 697 | – |
| සීමාසහිත ලංකා කාර්මික වතු සමාගම | – | 174 | – |
| සීමාසහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 24 | 167 | 119 |
| වැවිලි සමාගම් | 95 | 554 | 287 |
| සීමාසහිත ලංකා සීනි සමාගම | – | 1,597 | – |
| ලංකා ත්‍රිපෝෂ සමාගම | 10 | 75 | – |
| වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් | 10 | 75 | 2 |
| **එකතුව** | **28,091** | **75,701** | **14,908** |

*මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යාපාර හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

# 4 වන පරිච්ඡේදය

# විදේශ මූල්‍යයනය

## 4.1 සමාලෝචනය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ දෙවන සමාලෝචනය 2024 වසරේ ජූනි මස 12 වන දින අවසන් කරන ලද අතර, ඒ අනුව, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා සහාය වීම පිණිස ආසන්න වශයෙන් ඇ .ඩො. මිලියන 334 ක තුන්වන වාරිකය ශ්‍රී ලංකාව වෙත ලැබුණි. ඒ සමඟ, 2023 වසරේ මාර්තු මස සිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ලබා දී ඇති මුළු පහසුකම් ප්‍රමාණය ඇ.ඩො. බිලියන 1 ඉක්මවයි. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන අනුමත කිරීම සහ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර මූල්‍ය ආයතන වෙතින් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ මූල්‍ය පහසුකම් තවදුරටත් සුරක්ෂිත කර ගැනීමට ද උපකාරී විය.

ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, 2024 වසරේ ජූනි මස 26 වන දින ශ්‍රී ලංකාවේ ප්‍රධාන ද්විපාර්ශ්වික ණය දෙන්නන්ගේ නිල ණයහිමි කමිටුවේ (OCC) සාමාජික රටවල් සමඟ හා චීන එක්සිම් බැංකුව සමඟ සිය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ අවසන් ගිවිසුමකට එළඹෙන ලදී. ඒ අනුව, ද්විපාර්ශ්වික ණය හිමියන්ගේ නිල ණයහිමි කමිටුවේ (OCC) සාමාජික රටවල් හා චීන එක්සිම් බැංකුව අදාළ ණය සඳහා ගෙවීම් කාලය දීර්ඝ කිරීම (කල්පිරීමේ කාලය) සහ පොලී අනුපාත අඩු කිරීමට එකඟ වී ඇත. එමෙන්ම, මෙම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුමට අනුව, ශ්‍රී ලංකාව මේ වන විට ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් ඇතුළු පෞද්ගලික ණයහිමියන් සමඟ ගිවිසුම් ඇති කර ගැනීමට කටයුතු කරමින් සිටී.

## 4.2 විදේශ මූල්‍යයන එකඟතා

ශ්‍රී ලංකාව 2024 වර්ෂයේ දෙවන කාර්තුව අවසන් වනවිට විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමග විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් 8 ක් මගින් ඇ.ඩො. මිලියන 296.8 ක එකඟතා ඇතිකරගෙන ඇති අතර, එයින් ඇ.ඩො. මිලියන 250.0 ක් ණය වශයෙන් ලබාගෙන ඇත. මෙම ණය ගිවිසුම් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාවසාය මූල්‍ය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ඇ.ඩො. මිලියන 100.0 කින් ද මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවෙන් ලද ඇ.ඩො. මිලියන 150.0 කින් ද සමන්විත වේ.

ණය ගිවිසුම්වලට අමතරව, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී ජපානය හා ඕස්ට්‍රේලියාව යන විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සමග නිල සංවර්ධන ආධාර එකඟතා ගිවිසුම් 6 ක් මගින් ඇ. ඩො. මිලියන 46.8 ක එකඟතා ඇතිකරගෙන ඇත.

2024 වර්ෂයේ දෙවන කාර්තුව අවසානයේ දී මූල්‍ය අංශය සඳහා ඉහළම විදේශ මූල්‍යන එකඟතා ලැබී ඇති අතර, එය ඇ.ඩො. මිලියන 150.0 ක් හෝ සමස්ත විදේශ මූල්‍යයන එකඟතාවලින් සියයට 51 ක් විය.

## 4.3 විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ජූනි මස 30 වන දින දක්වා ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඇ. ඩො. මිලියන 786.7 කි. එම ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් ඇ. ඩො. මිලියන 776.9 ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර, ඇ. ඩො. මිලියන 9.8 ක් පූර්ණ ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි විය.

2024 වර්ෂය තුළ ලද මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලද අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 43 ක් ද, අනතුරුව ඉහළම ප්‍රමාණයක් පිළිවෙලින් ලෝක බැංකුව (සියයට 27) සහ ආසියානු සංවර්ධන බැංකුව (සියයට 26) සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

මෙම ප්‍රතිලබ්ධිවලින් සියයට 43 කට ආසන්න ඉහළ ප්‍රමාණයක් අයවැය මූල්‍යකරණ අංශය සඳහා උපයෝජනය කර ඇති අතර, අනතුරුව සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාවසාය සංවර්ධන අංශයේ ව්‍යාපෘතිවල සියයට 13 ක්ද, මූල්‍ය අංශයේ ව්‍යාපෘතිවල සියයට 9 බැගින් වූ ප්‍රමාණයක් ද උපයෝජනය කර ඇත.

වගුව 4.1 - එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2024 වසරේ ජනවාරි මස 1 දින සිට ජුනි මස මස 30 දින දක්වා සිදු කරන ලද සත්‍ය ප්‍රතිලබ්ධි (ඇ.ඩො. මිලියන)


| සංවර්ධන පාර්ශ්වකරු | සත්‍ය ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (ඇ.ඩො. මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වික** | **6.6** | **1.6** | **8.2** |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල | 5.2 | - | 5.2 |
| නෙදර්ලන්තය | 1.4 | - | 1.4 |
| ජපානය | - | 1.3 | 1.3 |
| ජර්මනිය | - | 0.3 | 0.3 |
| **බහුපාර්ශ්වික** | **770.3** | **8.2** | **778.5** |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල** | 334.0 | - | 334.0 |
| ආසියානු සංවර්ධන බැංකුව | 208.6 | 2.2 | 210.8 |
| ලෝක බැංකුව | 196.6 | 6.0 | 202.6 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 18.2 | - | 18.2 |
| ඔපෙක් අරමුදල | 8.9 | - | 8.9 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 4.0 | - | 4.0 |
| **එකතුව** | **776.9** | **9.8** | **786.7** |

*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන :*
*එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් ඇ.ඩො. බවට හැරවීමේදී එක් එක් ප්‍රතිලබ්ධීන් සිදුවූ දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*


** තාවකාලික අගයයන්, ප්‍රතිව්‍යුහගතකරණය කළ ණයවල ඇ.ඩො. මිලියන 200.9 ක ප්‍රාග්ධනීකරණය කළ නොගෙවූ පොලී සහ දඩ පොලිය ඇතුළත් නොවේ.*
*** විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ.ඩො. බවට හැරවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.*

රූප සටහන 4.1; 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ජුනි මස 30 වන දින දක්වා සිදුවූ සත්‍ය ප්‍රතිලබ්ධි - සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ.ඩො. මිලියන)




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

රූප සටහන 4.2; 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ජුනි මස 30 වන දින දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි - ප්‍රධාන ආර්ථික අංශ අනුව (ඇ.ඩො. මිලියන)




*මූලාශ්‍රය : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*** වෙනත් = අධ්‍යාපන හා පුහුණු, ධීවර, නිවාස හා නාගරික සංවර්ධන, ඉඩම් සංවර්ධන, වැවිලි, බලශක්ති, ග්‍රාමීය සංවර්ධන, විද්‍යාව හා තාක්ෂණය*

## 4.4 විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2024 වසරේ ජුනි මස 30 වන දින වන විට රජය ලබාගත් විදේශ ණය මූලායනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය[1] ප්‍රමාණය ඇ.ඩො. බිලියන 37.5 කි.

2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ජුනි මස 30 වන දින දක්වා සිදු කරන ලද ණය සේවාකරණය[2] ඇ.ඩො. මිලියන 503.0 කි. මෙයින්, ඇ.ඩො. මිලියන 275.1 ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො. මිලියන 227.9 ක ප්‍රමාණය පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

රජය විසින් අනුගමනය කරන ලද අතුරු ප්‍රතිපත්තියට අනුකූලව, බලපෑමට ලක් වූ ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන්ගේ විදේශ ණය සේවාකරණය 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින සිට අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින සිට 2024 වසරේ ජුනි මස 30 වන දින දක්වා නොපියවා ඇති ණය වාරික ප්‍රමාණය ඇ.ඩො. මිලියන 5,670 ක්ද, පොලී ප්‍රමාණය[3] ඇ.ඩො. මිලියන 2,527 ක් ද විය.

---

1 - *තාවකාලික අගයයන්, මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය පමණක් නිරූපණය වේ.*

- *ණය සේවාකරණය තාවකාලිකව නතර කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතුවූ නොගෙවූ ණය වාරික ද ඇතුළත් කර ඇත.*
- *භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරයන්හි විදේශ ආයෝජන ඇතුළත් නොවේ.*
- *ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර අන්තර්ගත වේ. එසේ වුවද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි ගෙවීමට ඇති ණය ප්‍රමාණය එහි හිමිකාරිත්වයේ නේවාසික/ අනේවාසික තත්ත්වය මත වර්ගීකරණය කර නොමැත.*
- *චීන එක්සිම් බැංකුව විසින් ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ණය 39 ක ප්‍රාග්ධනීකරණය කරන ලද නොගෙවූ පොලී සහ දඩ පොලී හේතුවෙන් එකතු වූ ඇ. ඩො. මිලියන 200.9 ක ප්‍රමාණය ඇතුළත් වේ.*

2- *ණය සේවාකරණය, ණය ආපසු ගෙවීම, පොලී ගෙවීම*

3- *ඉදිරියේදී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සම්මුති සාකච්ඡාවලදී එක් එක් ණයහිමියාගේ දත්ත සමඟ සැසඳීමට යටත්වේ.*